That is my estimation but your estimation is different. You expect to go on not only till 1970 but for another generation. My estimation is that you will not last 1968. It is not based on any astrological calculation; I say this merely because you have not got the finances. The economic and the financial positions are so bad that you will just collapse.

Now, my complaint is this. With the very first Budget of the Hon. Minister your whole future development was based on the Planning

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

Ministry, and they were going to perform wonders. You were critical of the past and you said that a new scheme had been drawn up. All sorts of fanciful ideas were given to us. When we now analyse your schemes we find that nothing has been done. The I.B.R.D. Mission says that everything is wrong with your planning. As for the Hon. Minister of Land, Irrigation and Power, I advised this Parliament right from the start that this is one man whom you can never put into your planning. He has his pet schemes; he jumps from one scheme to another and never sticks to one.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

You worked with him!

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is why he ran away from us.

I was not prepared to tolerate all his antics including the violation of the Financial Regulations. He was spending money on his own without any reference to the Financial Regulations. Naturally at the Cabinet meetings I had to sit on him and he has never forgiven me for that, and his talk about Marxism and all the rest of it is nonsense. That is the real reason.

That is not the point I am trying to urge. If the Government wants to get on with its plans they must get rid of this Minister of Land, Irrigation and Power. Yesterday he told us that all the trouble at Rajangana is due to the fact that the previous Government did not allow him to do the feeder services. All I can say is that when the Hon. Minister finds that his policy is not accepted by the Cabinet he has a responsible and simple task to perform, and that is to say, "I cannot carry on if you cannot accept my policy. Therefore please accept my resignation." That is all he has to do. He cannot come here and blame somebody else for his failures. He must take a share of the blame and the responsibility for having failed to do the work. He himself admits that the failure of Rajangana—the sad plight of the allottees there—was due to the fact that the previous Government failed to provide the necessary feeder services. He must accept responsibility for that. Otherwise he must resign. You cannot work with that kind of mentality. This is all part of his advanced alienation programme. That is the trouble I do not wish to speak at length on this question.

Now there are one or two other matters that I want to raise. I see from newspaper reports that the Government has decided to increase prices on all goods from the 1st of February. The increase in price would vary from 10 per cent to 20 per cent. I want to know whether this story is true. They say that as a result of the devaluation the goods on devalued rates that come into this country are bound to cost more. The C. W. E. has issued a notice to all its branches—this is what I am told; the Hon. Acting Minister of State can help us in this matter—stating that from the 1st of February 1968 all goods including food articles will be sold at higher prices, the increase varying from 10 per cent to 20 per cent.

ගරු අතපත්තු
(கௌரவ அத்தபத்து)
(The Hon. Atapattu)

I am not aware of that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I would kindly request the Hon. Acting Minister of State to check on this information. This is a very serious matter. This is what I predicted and it has come true. What I said often was that the real increase in prices is yet to come, because devalued contracts are yet to take place—hitherto we have operated on forward contracts—and now the devalued contracts are coming in and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

we shall have to pay 10 per cent to 20 per cent more, the increase mentioned by the C. W. E. If that is so, then the private traders will put up their prices by at least 50 per cent. The Hon. Minister must tell us what the position is under this devaluation. I do not want to go into that question over again because I dealt with it last night. Anyway I am vehemently opposed to your passing on further burdens to the poor consumer.

The last point I was touching upon when we adjourned last night was about President Johnson's new policy in the United States of America. What is the present position about tourism in this country? Obviously, the Government depended very much on tourism. That has gone by the board. The Hon. Minister of Finance is shaking his head. —[*Interruption*]. Your Colleagues in your Cabinet even talked in terms of tourism replacing the tea industry.

ගරු වන්නිනායක
(*கௌரவ வன்னிநாயக்க*)
(The Hon. Wanninayake)
It is a long-term plan.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)
Whether it is long-term or short-term they are spending money on hotels at the present moment.

ගරු වන්නිනායක
(*கௌரவ வன்னிநாயக்க*)
(The Hon. Wanninayake)
Hotels have not come up yet. How can tourists come in?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)
From where are you going to get your foreign exchange? Now they have abandoned tourism also.

ගරු අතපත්තු
(*கௌரவ அத்தபத்து*)
(The Hon. Atapattu)
No. We have not abandoned tourism.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)
The Minister of State had other ideas. He thought that tourism was going to replace tea and he was going pell-mell at this.

ගරු අතපත්තු
(*கௌரவ அத்தபத்து*)
(The Hon. Atapattu)
We are doing it yet.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)
What is the use of your doing it? Now President Johnson has adopted a new policy.

ගරු අතපත්තු
(*கௌரவ அத்தபத்து*)
(The Hon. Atapattu)
We are not dependent on Johnson, surely!

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)
Where are you going to get your tourists from? Not from the moon! There are hopes of landing on the moon, but there will not be tourists on the moon.

The Americans are not prepared to come. Johnson has placed curbs on them. I think Britain has——

ගරු අතපත්තු
(*கௌரவ அத்தபத்து*)
(The Hon. Atapattu)
Given up?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

——reduced the amount of foreign exchange that was made available for the purpose. They have said that they can only give foreign exchange sufficient for travel to countries in and around Europe. All of them are streaming into Malta at the present moment. That is for them the closest place.

So, where are you going to get your tourists from? Mr. Johnson, in view of the difficult financial situation in the United States of America, has clamped down on tourism. And now I think he is going to have another burden on his hands with the North Korean trouble. He will have to cut down still more because all the money that he has will have to go towards expenses in Vietnam and Korea.

What will be the effect of all this on our loan prospects? The Hon. Minister will remember that his Budget depended so much on foreign aid. Now, what is the effect of these new policies on our loan prospects?

I notice that the I. B. R. D. has raised its interest rate to 6 per cent. The Hon. Minister must tell us how it will affect us. Apparently, we can still get from the I. D. A. at lower rates, but are we likely to get any more loans or financial help from foreign countries in the light of the new situation?

Now, before we can agree to raising the upper limit to Rs. 250 million, I do think the Hon. Minister must give us some idea of the position both internally and externally. We cannot live like frogs in the well. The Hon. Minister of Finance must assess the repercussions of both internal devaluation and external devaluation. All this must be evaluated by the Hon. Minister and he must give this House a fair picture so that we may know where we stand. I think that is the least that we can expect from the Hon. Minister. The Hon. Minister must help us all to get a clearer picture of the financial situation of the country.

පූ. භා. 10.32

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)
*(திரு. பிறின்ஸ் குணசேகர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමා අපේ රට කිරියෙන් පැණියෙන් ඉතිර වීම සඳහා පෞද්ගලික බැංකුවලින් රුපියල් කෝටි 25 ක් ඉල්ලා ගැනීමට ඉදිරිපත් කළ මේ යෝජනාව දවසක් තිස්සේ විවාද වී තිබෙනවා. මීට පෙර මේ විවාදයට සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන් කී කරුණු ගැන සඳහන් නොකර වෙනත් දෘෂ්ටි කෝණයකින් මේ ප්‍රශ්නය දෙස බලා අදහස් ටිකක් ඔබතුමා හමුවේ තැබීමට මා පුළුවන් තරම් උත්සාහ කරනවා.

මේ රජය විරුද්ධ පක්ෂයේ සිටි කාල යේදී—අද විරුද්ධ පක්ෂයේ සිටින පක්ෂය ආණ්ඩු බලයේ සිටි කාලයේදී—මෙවැනිම ණය මුදල් ඉල්ලා මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට පැමිණි අවස්ථාවන්හි වර්තමාන පාලක පක්ෂයේ නායකයන් එයට විරුද්ධ වූ අවස්ථා ගැන දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ඊයේ කථාවේදී සඳහන් කළා. අද ආණ්ඩු බලයේ සිටින ගරු ඇමතිවරුන්—විශේෂයෙන්ම ගරු අගමැතිතුමා සහ ගරු රාජ්‍ය ඇමතිතුමා—එදා විරුද්ධ පක්ෂයේ සිට ගෙන එවකට සිටි ආණ්ඩුවට විරුද්ධව නැගූ චෝදනා, ඒ ප්‍රශ්නය ගැන කළ විග්‍රහයන් හරි නම්, ඒ කළ කථා අවංකව කළ කථා නම්, මේ විධියේ යෝජනාවක් මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කර මේ මුදල් ඉල්ලා සිටීමට අද එතුමන්ලාට අයිතියක් නැහැ. එක්කෝ එදා කී කථාව බොරු වන්නට ඕනෑ; එදා ආණ්ඩුවට එල්ල කර ගැසූ තේරුමක් නැති පහරක් වන්නට ඕනෑ. එසේ නැත්නම් එතුමන්ලා අද පිළිගන්නට ඕනෑ, එදා ආණ්ඩුව මුහුණ පා සිටි දුෂ්කර ආර්ථික තත්ත්වයටත් වඩා අමාරු තත්ත්වයකට මේ ආණ්ඩුව පත් වී තිබෙන බව.

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමා මේ කෝටි 25 ක අළුත් ණය මුදලක් ලබා ගැනීට කරන උත්සාහය, අද මේ රජයත්, මේ රජය නිසා මේ රටත්, මුහුණ පා සිටින උග්‍ර අසාධ්‍ය ආර්ථික රෝගයේ එක්තරා ලක්ෂණයක් පමණයි. මේ රෝග ලක්ෂණය හරි හැටි තේරුම් ගන්නේ නැතිව, වැළඳී තිබෙන රෝගය කුමක් ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා හරියට අවබෝධ කර ගන්නේ නැතිව, අතනින් මෙතැනින් මුදල් ටිකක් ලබාගෙන—සමහරවිට විදේශ බැංකුවලින් හෝ තවත් සමහරවිට ලෝක බැංකුවෙන් හෝ ණය මුදලක් ලබාගෙන —මේ දුෂ්කර අවස්ථාවෙන් බේරීමට තැත් කිරීම පැරණි සිංහල කියමනක් අනුව නම් අතිසාරයට අමුඩ ගැසීමක් වගෙයි. විදේශික බැංකුවලින් ණය අර ගෙන ගහන අමුඩයෙන්, මේ රජයට දැන් වැළඳී තිබෙන ආර්ථික අතීසාරය කවදාවත් හොඳ කරන්නට බැහැ. මේ රජයවත්, රජයට ආර්ථික වශයෙන් උපදෙස් දෙන ක්‍රම සම්පාදක සහ නොයෙකුත් මණ්ඩලවල උපදේශකයන්වත්, මේ ප්‍රශ්නය හරි හැටි අවබෝධ කරගෙන තිබෙනවාද කියා මා දන්නෙ නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වූ දවස්වල ලෝකයටම හඩ නගා කියා සිටියේ, ඊට කලින් අවුරුදු නවය දහය තුළදී මේ රටේ පැවති නරක පාලනය නිසා අළුතෙන් බලයට පත් වූ ආණ්ඩුවට හිස් භාණ්ඩාගාරයක් භාර ගන්නට සිදු වුණු බවයි. ඉතාම භයානක ආර්ථික තත්ත්වයකට මුහුණ දෙමින් තමන්ට රාජ්‍ය බලයේ වැඩ කටයුතු ආරම්භ කරන්නට සිදු වුණා යයි කීවා. ඒ කතාව කියා ලබන මාර්තු 25 වැනිදාට අවුරුදු තුනක් පිරෙනවා. මේ අවුරුදු තුන තුළ ඒ හිස්ව තිබුණු භාණ්ඩාගාරය තමුන්නාන්සේලා විසින් කොතරම් දුරට පුරවා තිබෙනවාද කියා ගරු මුදල් ඇමතිතුමාගෙනුත් ගරු අගමැතිතුමාගෙනුත් අහන්නට ඕනෑ.

මේ රජය ආණ්ඩුව බාර ගන්නා විට භාණ්ඩාගාරයේ තිබුණේ මේ රටේ ජනතාවට දින හතකට කෑම සැපයීමට පමණක් ප්‍රමාණවත් වූ මුදලක්ය කියා එදා ගරු අගමැතිතුමා කී බව මට මතකයි. එහෙත් අද මේ රටේ ජනතාවට දවස් කීයකට කෑම සැපයීමට භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවාද කියා ගරු මුදල් ඇමතිතුමා විසින් හෝ ගරු අගමැතිතුමා විසින් අවංකව ප්‍රකාශ කරනවාද කියා මා අහනවා. අවුරුදු තුනක දක්ෂ හා කාර්යක්ෂම පාලනයකින් පසුව එදා දින හතක් කෑම සැපයීමට තරම්ව තිබුණු මුදල කොතරම් දුරට අඩු කරලාද වැඩි කරලාද මේ ආණ්ඩුව රටට මුහුණ දෙන්නේ කියන ප්‍රශ්නයට මේ ආණ්ඩුව කෙලින්ම අවංකව හා එඩිතරව පිළිතුරක් දෙන්නට ඕනෑ.

මේ ආණ්ඩුව පැරණි එක්සත් ජාතික පක්ෂයේ ධනවාදී මුහුණුවර වෙනස් කර සමාජවාදය කරා යනවාය කියා මහජනයා ඉදිරියට ගොස් කියනවා. වර්තමාන ආණ්ඩුව ඉස්සර වාගේ ධනවාදී නිරුවත් ප්‍රතිපත්තිය ඒ විධියට ක්‍රියාත්මක කරන්නේ නැත කියනවා. ඒ අතරම මේ ආණ්ඩුව කටයුතු කරන්නේ කාගේ උපදෙස් අනුවද, කාගේ අවවාද අනුශාසනා අනුවද කියා බලමු. මේ ආණ්ඩුවේ අලුත් සමාජවාදී ප්‍රතිපත්තිය ක්‍රියාවට නගන්නට යන්නේ කාගේ උපදෙස් අනුව ද? එතැනයි විහිළුව. ධනවාදී ක්‍රමයේ අන්තිමටම ගිය, ධනවාදය ඒ අන්දමින්ම ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරන, ලෝකයේ තිබෙන ධනපති රටවලින් වැඩියෙන්ම ධනවාදය ආරක්ෂා කිරීමට උත්සාහ ගන්නා ධනපති රට වන අමෙරිකාවේ සිටින අමෙරිකන් ආර්ථික උපදේශකයන්ගේ උපදෙස් අනුවයි මේ ආණ්ඩුව මේ රට සමාජවාදය කරා ගෙන යන්නේ. එය විහිළුවක් නොවෙයි ද? ධනවාදය පැරණි අන්දමින්ම ආරක්ෂා කිරීමට ප්‍රතිඥා දී සිටින අමෙරිකන් ආර්ථික උපදේශකයන් ගෙන් උපදෙස් අරගෙන මේ ආණ්ඩුව මේ රට සමාජවාදය කරා ගෙන යන්නේ කොහොමද?

මේ ආණ්ඩුව පිහිටෙවූ දවස් වලම ලෝක බැංකුවේ අමෙරිකන් ආර්ථික විශේෂඥයන්ගේ උපදේශක මණ්ඩල කීපයක් ලංකාවට ගෙනාවා. ඔවුන් එක පිට එක වාර්තා නිකුත් කළා. සැප්තැම්බර් මාසයේ එක වාර්තාවයි; ඔක්තෝබර් මාසයේ එක වාර්තාවයි. ඒ වාර්තාවලින් මේ ආණ්ඩුවට එක්තරා උපදේශයක් දුන්නා. පසුගිය අවුරුදු 10 තුළ මේ රට ආර්ථික වශයෙන් මහා ප්‍රපාතයකට වැටී තිබෙනවාය කිව්වා. අමෙරිකන් ආර්ථික උපදේශකයින් කළ ඒ විග්‍රහය තමයි මේ රජයේ ඉදිරිපෙළ අසුන්වල සිටින මැති ඇමතිවරුන් නිතර නිතර කියන්නේ. අන්ත ධනවාදී අධිරාජ්‍යවාදී අමෙරිකන් උපදේශකයන්ගේ දෘෂ්ටි කෝනයෙන් බලන විට නම් සමාජවාදී ආර්ථික ක්‍රමය නාස්තිකාර ක්‍රමයක් බව පිළිගන්නට ඕනෑ. එහෙත් තමුන්නාන්සේලා කියන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලා සමාජ වාදය කරා යනවාය කියලයි. තමුන්නාන්සේලා පරණ ධනවාදී ක්‍රමයේ නිරුවත් ප්‍රතිපත්ති ඒ විධියටම ආරක්ෂා නොකර මහජනයාගේ යහපත සඳහා සමාජවාදය කරා යනවාය කියනවා නම් අර ධනවාදී ආර්ථික උපදේශකයන් කියන තර්ක තමුන්නාන්සේලා පුන පුනා නැවත නැවතත් කියන්නේ කොහොමද? ඒ උපදේශකයන් වාර්තා රාශියක් නිකුත් කළා. "Recent Economic Trends of Ceylon," "The Foreign Exchange Problem of Ceylon", "Recommendations on the Economic Planning of Ceylon."

ලෝක බැංකුවත් ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ එක්තරා මුහුණුවරක්. මුහුණු සයකුත්, අත් දොළොසකුත් ඇති එක්තරා දෙවියකු ගැන ඔබතුමා දන්නවා. "මූණු සයකි අත් දොළොසකි මයුරා පිට වාහනේ" යනුවෙන් ඒ දෙවියන්ගේ ස්වභාව විස්තර කර තිබෙනවා. එකම දෙවියා වුවත් මුහුණු හයයි, අත් දොළොසයි. ඇමෙරිකන් අධිරාජ්‍යවාදයත් ඒ වාගේමයි. මොන නමකින් ආවත් මොන ස්වරූපයෙන් ආවත් හඳුනා ගන්නට බැරිකමක් නැහැ. ලෝක බැංකුවය කියන්නට පුළුවනි. The International Bank for Reconstruction and Development කියන්නටත් පුළුවනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලය කියන්නට වුවත් පුළුවනි. ඒසියාන් යන නමින් එන්නටත් පුළුවනි. සියැටෝ කිව්වත්, මිඩෝ කිව්වත් වෙන මොන නමක් කිව්වත් වෙනසක් ඇත්තේ නැහැ. ඔය ඕනෑම නමකින් එන්නට පුළුවනි. ආර්ථික වශයෙන් එක් නමකින් හෝ යුද්ධ අංශයෙන් හෝ වෙනත් කවර අංශයකින් හෝ එන්නට පුළුවනි. මොන නමකින් හැඳින් වුනත් එකම දෙවියන් වහන්සේ මුහුණු හයකිනුත්, අත් දොළොසකිනුත් එන්නා වාගේ මේ එන්නේ ඇමෙරිකන් අධිරාජ්‍යවාදයයි. මේ හැම අන්තර්ජාතික ආයතනයක්ම පාහේ එහෙමයි. ලෝක බැංකුවේ විශේෂඥයන්, ජාත්‍යන්තර අරමුදලේ විශේෂඥයන් යනාදි හැම දෙනාම කියන්නේ එකම කාරණයමයි. ඔවුන් කියන්නේ සමාජවාදී ආර්ථික පදනමක් කරා ගන්නා මේ පියවරවල් වහාම නතර කළ යුතුය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



ජනයාට යහතින් ජීවත් වන්නට, කරදර නැතිව ජීවත් වන්නට—සුඛෝපභෝගී ජීවිත නොවෙයි, යම්තම් එදිනෙදා දිවි පෙවෙත ගෙන යෑමට, පණ කෙන්ද ගැට ගහගෙන ජීවත් වන්නට—හැකි වන තරමේවත් වැඩ පිළිවෙළක් ගෙන යනවා දකින්නට ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන් කැමති නැහැ. මේ ආණ්ඩුව සිය හිස් මුදුනින් පිළිගෙන තිබෙන මෙවැනි ආර්ථික විශේෂඥයන් කියා තිබෙන්නේ කුමක්ද? මේ ආණ්ඩුව ඔවුන් කියන හැම දෙයක්ම ඒ විධියට පිළිපදින්නට යන බවයි අපට පෙනෙන්නේ. 1966 සැප්තැම්බර් මාසයේ නිකුත් කළ වාර්තාවලින් මේ විශේෂඥයන් කියා සිටියේ හාල් සලාකය කපා දමන ලෙසයි. හාල් සේරුව නොකැපුවොත් කවදාවත් ආර්ථික වශයෙන් ඔළුව උස්සන්නට බැහැ කිව්වා. කවදා හෝ අපෙන් තමුසෙලාට කිසියම් ණය මුදලක් ලබා ගැනීමට බලාපොරොත්තුවක් තිබෙනවා නම් හාල් සේරු දෙක කපන්නට ඕනෑය කිව්වා. 1966 සැප්තැම්බර් මාසයේ වාර්තාවේ 22 වැනි පිටුවේ හාල් සේරුව කපන් නැයි කියා තිබෙනවා. එය ඉංගිරිසියෙනුයි තිබෙන්නේ. මම දැන් එය පමණක් කියවන්නම්:

"A financial programme to be prepared in the course of this year which will indicate the steps to be taken in 1965-66 and in the subsequent three or four years to maintain public finances in a way to increase the proportion of domestic resources devoted to domestic development expenditure within a state monetary framework. This will require an expansion in public savings and it is difficult to see how this can be accomplished without a progressive reduction in Government subsidies specially in the subsidies in the production and consumption of rice."

ගරු කථානායකතුමනි, එයින් කියැවෙන්නේ මොකක්ද? මේ රටේ යම්කිසි සංවර්ධනයක් ඇති කිරීමට නම් සහල් නිෂ්පාදනය හා සහල් පරිභෝගය පිළිබඳව දැනට තිබෙන සහනදායක වැඩ පිළිවෙළ සෑහෙන ප්‍රමාණයකින් අඩු නොකර කවදාවත් බැහැ යන්නයි එයින් කියැවෙන්නේ. ඒ දෙකම කළා. අවුරුද්දක් ගත වුණේ නැහැ. ඒ දෙකම කරන්නට. ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ සුවච, කීකරු, දීන අනුකාමිකයන් හැටියට මේ අය ඔවුන් ඉල්ලා සිටි ඒ කාරණා දෙකම අවුරුද්දක් ඇතුළත

කළා. අද ඒ නිසා මුළුරටම හාමතේ. පත්තරවලින් දුන් කියනවා, මැලේරියා මදුරුවා යළිත් හිස ඔසවයි යනුවෙන්. ඒ ගැන සෞඛ්‍ය අමාත්‍යාංශයට දොස් කියන්නට බැහැ. රටට මේ සිදු වේගන යන විපත්තිය ගැන සම්පූර්ණයෙන්ම තමුන්නාන්සේලා වගකිව යුතුයි. ඇමෙරිකන් උපදේශකයින්ගේ උපදෙස් අනුව තමුන්නාන්සේලා මහජනතාව හාමතේ තැබීමට පියවර ගෙන තිබෙනවා. දුප්පත් උදවියට හාල් සේරු දෙකක් ලැබීම නිසා එදිනෙදා වේල පිරිමසා ගත් නමුත් දැන් දෙන හාල් සේරුවෙන් එක් වේලක්වත් පිරිමසා ගන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. තමුන්නාන්සේලා ටිකක් පිටිසරට ගිහින් බලනවා නම් පෙනේවි, කොයි තරම් අමාරු තත්ත්වයකින් ඒ උදවිය ජීවත්වනවාද කියන කාරණය. ළමයින් කොපමණ සංඛ්‍යාවක් මන්ද පෝෂණයෙන් පෙළෙනවාද, සෞඛ්‍ය තත්ත්වයෙන් පිරිහීම නිසා පාසැල් යන්නට පුළුවන්කමක් නැතුව කොයි තරම් සංඛ්‍යාවක් සිටිනවාද කියා තමුන්නාන්සේලා සොයා බැලුවාද? ඒවා කිසිත් සොයා බලන්නෙ නැතුව ඇමෙරිකානු උපදේශකයින් දෙන උපදෙස් කෙළින්ම පිළි ගන්නවා. එවැනි උපදෙස් එක්වර පිළිගැනීමෙන් රටට වන විපත්තිය ගැන සැළකීමක් නැහැ. එපමණක් නොවෙයි, සමාජ සේවා කටයුතු සඳහා වැය කරන මුදල් ප්‍රමාණය කපා හරින ලෙස මෙම වාර්තාවෙන් යෝජනා කර තිබෙනවා. එහෙම නම් සෞඛ්‍ය සේවාව සඳහා වෙන් කරන ලද මුදලිනුත් කපා හරින්න තමුන්නාන්සේලා ක්‍රියා කරන්න යනවා නොවේද?

ගරු කථානායකතුමනි, මෙතෙක් කල් මේ රටේ පැතිර තිබුණ කථාවක් තමයි, අපේ විශ්ව විද්‍යාලවලින් කලා උපාධිධාරීන් පුහුණු කර එවීමෙන් රටට ප්‍රයෝජනයක් සැලසෙන්නෙ නැත, රටේ සංවර්ධනය සඳහා එයින් සෙතක් වෙන්නෙ නැත කියන කථාව. නමුත් අද වෛද්‍ය විද්‍යාලවලින් පුහුණුව ලබා පිටවන උපාධිධාරීන්ගේ තත්ත්වය කුමක්ද? මේ දක්වා වෛද්‍ය උපාධි ලැබූවන්ට එබඳු තත්ත්වයක් උදා නොවුණත් දැන් ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද? වෛද්‍ය විද්‍යාල දෙකින් අවුරුදු පතා පිටවන උපාධිධාරීන් 150 කට 200 කට රක්ෂා දෙන්න බැරි තත්ත්වයකට මේ ආණ්ඩුව අද පත් වී තිබෙනවා. අමෙරිකන් උපදෙස් පිළිපැදීමෙන් වන්නෙ, අවුරුදු පහක හයක පමණ කාලයක් වෛද්‍ය විද්‍යාලයේ පුහුණුව ලබා පිටවන අයට රක්ෂාවක් ලබාගන්න බැරි තත්ත්වයක් ඇතිවීමයි. අලුතෙන් පත්වීම් දෙන්න බැරියයි ආණ්ඩුව කියනවා. සෞඛ්‍ය සේවාවත් සමාජ සේවයක් බවයි අමෙරිකානු උපදේශකයින් කියන්නෙ. සෞඛ්‍ය සේවාවත් සමාජ සේවයක් හැටියට සලකා තිබෙන නිසා, සමාජ සේවය සඳහා වෙන් කර ඇති මුදල් කපා හරින්නයයි උපදෙස් ලැබී ඇති නිසා, සෞඛ්‍ය ආරක්ෂා කිරීමට මෙතෙක් අනුගමනය කරගෙන ආ වැඩ පිළිවෙළෙහි වෙනසක් ඇති වෙනවා. වෛද්‍යවරුන් අලුතෙන් සේවයට බඳවා ගන්නෙ නැහැ. සෞඛ්‍ය පහසුකම් අඩු කරනවා. මේ නිසා රෝග පැතිරීම් නව නවත් වේගයෙන් සිදු වෙනවා. මැලේරියාව පමණක් නොවෙයි, මන්ද පෝෂණය, කෑම හිඟකම නිසා වැළඳෙන වෙනත් රෝග ලබන අවුරුද්ද එකහමාර තුළ නව නවත් ශීඝ්‍රයෙන් පැතිර යන බව අපට එතෙක් ජීවත් වන්නට ඉඩ ලැබුණොත් බලාගන්නට පුළුවන් වෙයි. ඒ අනුව කල්පනා කර බලන විට අපට සැකයක් ඇති වෙනවා, ඇමෙරිකන් උපදේශකයින් හදන්නෙ අපේ ජනතාව එහෙම පිටින්ම නැතිකර දමන්නටද කියා. එක පැත්තකින් උප්පත්ති පාලනය. අනික් පැත්තෙන් ජනතාව හාමතේ තැබීම. ශීඝ්‍රයෙන් රෝග පැතිරී යතත් අලුතෙන් වෛද්‍යවරුන් සේවයට බඳවා ගන්න එපායයි කියනවා. ඉස්කෝලෙ යන ළමයින්ගෙන් ගාස්තු අය කිරීමට අලුතෙන් යෝජනා ගෙනෙන්න යනවා. මේ අන්දමට ජනතාව භුක්ති විඳි හැම පහසුකමක්ම වාගේ සීමා කරන්න ආණ්ඩුව උත්සාහ දරනවා. මෙන්න මේ අන්දමට පැන නැඟී ඇති ජාතික ආපදාව ගැන, කනගාටුදායක තත්ත්වය ගැන අඩු වශයෙන් හිතක් පපුවක් ඇති ආණ්ඩුවේ ඇමතිවරුන් කීප දෙනකුගේවත් සැළකිල්ල යොමු කිරීමේ අදහසින් පෞද්ගලික මන්ත්‍රීවරයකු වශයෙන් එක්තරා යෝජනාවකට මා කල් දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තිබෙනවා. එම යෝජනාව තමුන්නාන්සේගේ දැනගැනීම පිණිස මා කියවන්න කැමතියි :

"සහල් සලාකය කපා හැරීම නිසා රටපුරා දැනට පැතිර පවතින සෞඛ්‍ය පරිහාණිය, මැලේරියා රෝග වර්ධනය, පාසැල් සිසුන් හා කුඩා දරුවන්ගේ මන්ද පෝෂණය, ලේ බැංකුව සිඳී යෑම ආදී මහා ජාතික විපත්තියක අසුබ ලක්ෂණයන් දැනටමත් විද්‍යමාන වන බැවින් අපේ ජාතිය සහමුලින්ම විනාශ වී යා නොදී රැක ගැනීමේ තාවකාලික පියවරක් වශයෙන් හෝ සතියේ සහල් සලාකය යළිත් සේරු දෙකක් බවට පත් කරන මෙන් මෙම මන්ත්‍රණ සභාව තීරණය කරයි."

මෙන්න යෝජනාව. ඔබතුමා දන්නවා. විරුද්ධපාර්ශ්වයේ මන්ත්‍රීවරුන් බදාදා දිනයන්හි ඉදිරිපත් කර සම්මත කර ගන්නා යෝජනා කොයිතරම් දුරට ක්‍රියාත්මක වනවාද නැද්ද කියා. ක්‍රියාත්මක වුණත් නැතත් මහජන සැලකිල්ල යොමු කිරීම සඳහා ඔබතුමාගේ මාර්ගයෙන්, මන්ත්‍රී මණ්ඩලයේ මාර්ගයෙන් යෝජනා රට වැසියා ඉදිරියේ තැබීම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් හැටියට අපේ යුතුකමක්. මේ විධියට මේ තත්ත්වය තව අවුරුදු 5ක් පැවතුණොත් ඉතා උග්‍ර තත්ත්වයකට මුහුණපාන්ට සිදු විය හැකි නිසා ඒ ජාතික ආපදාව පිළිබඳව අප විසින් අනතුරු හැඟවීමක් කළයුතුයි.

ගරු කථානායකතුමනි, මේ ආර්ථික පරිහාණියට මුහුණ දීම සඳහා ගරු අගමැතිතුමා එඩිතර පියවරක් ගෙන තිබෙනවා යයි මහා කන් කරච්චලයක් හැටියට ගුවන් විදුලියෙන් මිනිත්තු දෙකෙන්, තුනට ප්‍රචාරය වෙනවා අපට නිතරම ඇහෙනව. මම කියන්නෙ නැහැ ආහාර වගාව සඳහා ගන්න ඒ උත්සාහය වැරදි උත්සාහයක්ය කියා. මම හැම වෙලේම ඒ පියවර අනුමත කරනව. එහෙත් මා කරන චෝදනාව මෙයයි. සාමාන්‍ය දුප්පත් සිංහල ගොවියාගේ කරට ඒ බර පටවල තමුන්නාන්සේලා ඒ බරට කර ගහන්ට ඉදිරිපත් නොවීමයි. මේ රටේ ධනවාදී පක්ෂ පරණ විධියට ධනය සූරා ගන්නා අතර අද රට මුහුණදී සිටින මේ ආර්ථික ආපදාවෙන් රට ගොඩ ගැනීමේ බර දුප්පත් ගොවියාගේ කර පිට පමණක් පටවා තිබෙනව. දැන් අවුරුද්දකට විතර ඉස්සරවෙලා හාල් සේරුවක් කැපවේ රටේ මුදල් තත්ත්වය හොඳ නැති නිසා එක්තරා කෝටි සංඛ්‍යාත මුදලක් පිටරට යා නොදී ආරක්ෂා කර ගන්ට ඕනෑය කියායි. දැන් ටිකක් සොයා බලන්න ඔය මුදල් පිටරට යා නොදී බේර ගත්තාද කියා. පසුගිය අවුරුදු $1\frac{1}{2}$ ඇතුළත ආහාර වර්ධනයටයි, අර යසට තිබුණු කැලෑ ටික එළි කරල ගස් කොළන් ටික විකුණා ගන්ටයි, මුදලාලිලාට රථවාහන ලබා දීම සඳහා කෝටි කීයක මුදලක් පිටරට යවන්ට ඇද්ද? ලංකාවේ ජනගහනය දවසකට වේලක් හාමතේ තබා මුදල් ටිකක් මේ රටේ ඉතුරු කර ගත්ත බව හැබෑයි. එහෙත් ඒ මුදල ගියේ කොහේටද? ඒ මුදල් නැවතත් ධනවතුන් ටික දෙනෙකුට තවතවත් මුදල් උපයමින් සුඛෝපභෝගී ජීවිත ගත කරන්ට ලබා දුන්න නේද?

ආහාර සංවර්ධන ව්‍යාපාරය යටතේ වගා කිරීම සඳහා ඉඩකඩම් ලබා ගත් මිනිසුන්ගේ ලැයිස්තුවක් දැන් මාස දෙකකට විතර කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බව ඔබතුමාට මතක ඇති. ඔය අක්කර දහස් ගණනින් කීයකද ආහාරයට ගත හැකි යමක් නිපදවන්නෙ? ඔය අක්කර දහස් ගණනට සිදු වුණේ කුමක්ද? ඒවායේ තිබුණු දැවැන්ත ගස් ටික පෙරළලා ඉරල කොළඹට ගෙනැවිත් විකුණා ගත්ත එක නේද? ආහාර වගාවේ නාමයෙන් ඒ ඉඩම් ලබාගත් අය අළුත් රථවාහනවලින් යසට සුඛෝපභෝගී ජීවිත ගත කරනවා නේද? අද මහා පාරේ ගමන් කරන්නෙ 5 ශ්‍රී එක් දහස් හය සිය ගණන්වල රථ බව ඕනෑ වෙලාවක පෙනී යනව. මේ ආණ්ඩුවේ ආධාරකාරයින්ට මාසයකට කොපමණ මුදලක් වටිනාකම ඇති රථවාහන ගෙන්වනවාද? තමන්ගේ ආසනයේ වැඩ කටයුතු සඳහා යන්ට තිබෙන තමන්ගේ පරණ කබල් කාර් එකට "ෂොක් ඇබ්සෝබර්" එකක් ගෙන්වා ගන්න විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙක් අවසර ඉල්ලුවොත් ඒ අවසරය ලැබෙන්නෙ නැහැ. ඔහු ලංගම බස් එකෙන් ගමන් කරන්නට ඕනෑ. එහෙත් එක්සත් ජාතික පක්ෂයට ආධාර කරන මුදලාලිලාට ආහාර සංවර්ධනයටය කියමින් ගස් කපල කොළඹට ගෙන්වා ගන්න ඕනෑ තරම් 5 ශ්‍රී කාර් ගන්ට පුළුවන්. මෙන්න මේ විධියට දුප්පත් මිනිහා පිට ඒ බර පටවල තමන්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත්තියේ තමන්ගේ පක්ෂයට ආධාර කරන ටික දෙනෙකුට සුඛෝපභෝගී ජීවිත ගත කරන්ට ඉඩ හැර තිබෙන නිසා කවදාවත් අගමැති තුමාගේ මේ ප්‍රතිපත් තිය සාර්ථක ලෙස ප්‍රතිඵලදායක ලෙස කෙළවර වෙන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, සාමාන්‍ය පොදු ජනයාගේ සහයෝගය නැතිව ඔවුන්ගේ දහඩිය මහන්සියෙන් ප්‍රයෝජන නො ගෙන කවදාවත් රටක් දියුණු කරන්ට බැහැ. ඒ කාරණය මම පිළිගන්නව. ගුවන් විදුලිය මාර්ගයෙනුත්, අගමැතිතුමා රටපුරා ගොස් ප්‍රචාරක රැස්වීම් පැවැත්වීමෙනුත්, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මාර්ගයෙනුත් ආහාර සංවර්ධන කටයුතු පිළිබඳව මහ ජනයා උනන්දු කරවීම හරි. අද රට මුහුණ පා සිටින ආර්ථික රෝගයට කළයුතු එක්තරා පිළියමක් තමයි ඒක. ඒක තමයි හරි බෙත. එහෙත්, එක් අතකින් මේ වැළඳී තිබෙන ආර්ථික උණ බස්සන් නට බෙහෙත් දෙන ගමන්, අනෙක් පැත් තෙන් ඒ උණ නැඟීමට හේතු වන විධි යේ නොයෙක් නොයෙක් ආහාර ද්‍රව්‍ය ඒ රෝගියාට දෙනවා නම් ලෙඩේ හොඳ වන්නේ කොහොමද? දාඩිය දමාගෙන මහන්සි වී වැඩ කරපල්ලායි එක් අතකින් ජනතාවට කියනවා. ඒ සමගම තවත් පැත්තකින්, ගුවන් විදුලියෙනුත් වෙනත් ප්‍රචාරක මාර්ගවලිනුත් "ශත 50 ක ටිකට් එකක් අරගෙන හෙට ලක්ෂපතියෙක් වෙයන්" කියනවා. මේ ප්‍රචාර දෙකේ තිබෙන පරස්පර විරෝධතාව බලන්න. හුස්ම නොගෙන, පණ කඩාගෙන වැඩ කොට රට සංවර්ධනය කරපල්ලායි එක අංශයකින් කියන ගමන් රජයේ තවත් අංශයකින් කියන්නේ ශත 50 ටිකට් එක කින් නිකම්ම ලක්ෂපතියෙක් වෙයන් කියායි. වැඩ කොට රට සංවර්ධනය කරපල් ලායි කියන, ගරු අගමැතුමාගේ ආයාචන යට ගරු කිරීමක් වශයෙන් පිටිසර මනුෂ්‍යයා උදේ යන්තම් කහට තේ එකක් බී උදැල්ලක් කර තබාගෙන කුඹුරට යන ගමන් ගමේ තේ කඩය පහු කරන විටම ඔහුට ඇහෙන්නේ මොකක් ද? "ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ශත 50 ක ටිකට් පතක් අරගෙන හෙට ඔබත් ලක්ෂපතියෙක් වන්නු" කියන ගුවන් විදුලි ප්‍රචාරයයි. පිටකොටුව, බොරැල්ල, මරදාන ආදී කවර තැනකට ගියත්, ඕනෑම බස් නැවතුම්පොළකට ගියත් අද මේ ප්‍රචාරය ඇහෙනව.

**ගරු ඩඞ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

කවුද පටන් ගත්තේ ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

ගරු අගමැතිතුමනි, මා තර්ක කරන් නේ මෙය පටන් ගත්තේ කවුද යන ප්‍රශ්නය උඩ නොවෙයි. එක්කෙනකුට පහර ගසා තව කෙනකු ආරක්ෂා කරන් නට නොවෙයි මා කථා කරන්නේ. මේ ප්‍රතිපත්තියේ තිබෙන පරස්පර විරෝධ තාවයි මා පෙන්වා දෙන්නේ. එක් අත කින් පහසුවෙන් පොහොසත් විය හැකි මාර්ග පෙන්වා දෙන ගමන් අනෙක් පැත් තෙන්, මහන්සි වී වැඩ කරන්න කීමෙන් කවදාවත් මිනිසුන් වැඩ කිරීමට පොළඹ වන්නට බැහැ. ඕනෑම ප්‍රවෘත්ති පත්‍රයක් ගෙන බැලුවත් එහිත් මේ ප්‍රචාරය දකින් නට ලැබෙනවා. ඊයේ "දිනමිණ" පත්‍රයේ පළ වී තිබෙන දැන්වීම මෙන්න :

> "ශත 50 කින් ලක්ෂපතියෙක්......! සතියකට වරක් සියයට අධික පිරිසක් පොහොසත් වේ. ඔබද ඊළඟ පෝසතා ?"

මහන්සි වී කොටාපල්ලා වවාපල්ලා යි ගරු අගමැතිතුමා මිනිසුනට කියනවා. "කොටන්න ඕනැ නැ මිනිහෝ ! ශත 50 ටිකට් එකකින් උඹට හෙට ලක්ෂපතියෙක් වෙන්න පුළුවන්" යි අනෙක් පැත්තෙන් මේ විධියේ ප්‍රචාරවලින් කියනවා. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

විධියේ එකට එක නොගැළපෙන, පරස්පර විරෝධි ප්‍රතිපත්ති මහජනයා ඉදිරියෙහි තබන විට රට සංවර්ධනය කරන්නේ කොහොමද? තමුන්නාන්සේලාගේ ක්‍රම සම්පාදක මණ්ඩලයේ උපදේශකයින් මේවා තමුන්නාන්සේලාට පෙන්වා දෙන්නේ නැද්ද? පෙන්වා දුන්නත් තමුන්නාන්සේලා ඊට ඇහුම්කන් දෙන්නේ නැද්ද? ආහාර සංවර්ධනය ගැන මා මොහොතකටවත් විරුද්ධ වෙනවායයි හිතන්නට එපා. එය කළ යුතුම දෙයක්. මා කැමතියි. එහෙත්, ඒ බර පදුපත් මිනිහා පිට පටවන්නට එපා. ඉහත කී විධියේ ප්‍රචාරයන් කෙරෙන විට, දුප්පත් මිනිහා පිට පැටවෙන ඒ බර අදින්නට ඔවුන්ට හිතෙන්නේ නැහැ.

මේ ආණ්ඩුවේ වගකිව යුතු නායකයින්ට අවබෝධ විය යුතු අනෙක් බරපතල ප්‍රශ්නය නම්, ජාතික ලොතරැයි මණ්ඩලය වැනි ආයතන මාර්ගයෙන් මහජනයා අතර බෝකර හරිනු ලබන දූකෙළියයි. සූදුවට මිනිසුන් ඇබ්බැහි කිරීම බරපතළ ජාතික විපතක් වන්නට පුළුවනි. මහ පාරේ හන්දි අසල, කඩ ළඟ හා වෙනත් නොයෙක් තැන්වල තරුණයින් රැස්වී සිටින හැටි අප කාර් බස්වල ගමන් කරන විට බොහෝ අවස්ථාවල අපට දකින්නට ලැබෙනවා. රථවාහනයක් එන විටම ඒ දෙතුන් දෙනා අතරේ ලොකු කලබලයක් ඇති වෙනවා. ඒ එක්කම එක් කෙනකු උඩ පනිනනවා තව කෙනකු අත්පොඩි ගහනවා අපට පෙනෙනවා. තවත් සමහරුන් සන්තෝෂය පළ කරනවාත් අපට පෙනෙනවා. යන හැම වාහනයක්ම දැක්කාම සන්තෝෂය පළ කරනන්ට පාරේ ඉන්නා අයට වුවමනාවක් නැහැ. එම නිසා මා රථය ඩිංගක් නවත්වා ඒ ගැන සොයා බැලුවා. එතැනත් ලොතරැයියක්! මහ පාරේ අයිනේත් ලොතරැයියක්. වොතරැයි මණ්ඩලය කරන වැඩයම. රජයේ ප්‍රතිපත්තියම, රක්ෂා නැති ජ්‍යෙෂ්ඨ සමතුනුත්, සමහර විට පාසල් යන ළමයින් නිවාඩු දවස්වලත් මහ පාර අයිනේ සිට ක්‍රියාත්මක කරනවා.

මොකක්ද මේ පොඩි ලොතරැයිය? ඉස්සෙල්ලාම රථවාහනයක් එන්නේ කොළඹ පැත්තෙන්ද නැත්නම් මාතර පැත්තෙන්ද කියා ඔට්ටු අල්ලනවා. ඊළඟට ඔට්ටු අල්ලනවා, එන රථයේ නොම්මරය ඔත්තේද නැත්නම් ඉරට්ටේද කියා. ඒ වාගේම 1 ශ්‍රී රථයක්ද නැත්නම් 2 ශ්‍රී, 3 ශ්‍රී, 4 ශ්‍රී රථයක්ද ඊළඟට එන්නේ කියා ඔට්ටු අල්ලනවා. එහෙමත් නැත්නම් එන රථවාහනවල වර්ගය පිළිබඳව ඔට්ටු අල්ලනවා. රථවාහනයක් එතැනින් ගිය වහාම සත පහේ නැත්නම් දහයේ ඔට්ටු මුදල් එහාට මෙහාට මාරු වෙනවා.

රටේ සංවර්ධනය ගැන කථා කරන ආණ්ඩුව මහජනයා තුළට මෙවැනි දූ කෙළි පිළිබඳව අදහස් කැවීම නිසා සිදු වී ගෙන යන දේ බලන්න. මේ විධියට දූ කෙළියට පුරුදු වුණු අය තව අවුරුදු හතරක් පහක් යන විට සංවර්ධන කටයුතුවල යොදවන්නට පුළුවන් වෙයිද? දූ කෙළියට ඇබ්බැහි කර තිබෙන තරුණ පරපුර ලවා දහඩිය ඩිංගක් සොලවා වැඩ කරවා ගන්නට බැහැ. දැන් ඉස්කෝලේ යන කුඩා දරුවන් තමයි තව ටික කලෙකින් තරුණයන් වී රටවැසියන් බවට පත් වන්නේ. ඔවුන් පාසල් යන කාලයේදී පුරුදු වන්නේ මේ විධියේ දූ කෙළිවලටයි. අළුතෙන් අරඹන වලවේ යෝජනා ක්‍රමය වේවා, රාජාංගන යෝජනා ක්‍රමය වේවා, වෙන තැනක අරඹන්නට යන සංවර්ධන ක්‍රමයක් වේවා සඳහා පදිංචි කරවන්නට, වැඩ කරවා ගන්නට ඉන්නේ මේ තරුණ පරපුරයි. ඔනවුී අද ඇබ්බැහි වී සිටින්නේ දාඩිය ඩිංගක් නොසොල්වා සත 50 කින් ලක්ෂපතියන් වන්නටයි. මේ විධියට දූ කෙළියට ඇබ්බැහි වුණු අය පදිංචි කරවා සංවර්ධන යෝජනා ක්‍රම ඔවුන් ලවා හරියට ක්‍රියාත්මක කරවා ගන්නට පුළුවන්ද? ඔවුන් උත්සාහ කරන්නේ ඔවුන්ට ලැබෙන උදුල්ල පවා විකුණා ලක්ෂපතියන් වන්නටයි. පසුගිය දවස්වල පටන් ගත් ගොවි හමුදාවට සිදු වී තිබෙන්නේ මොකක්ද? තමන්ගේ ආම්පන්න ටික විකුණා කඩයප්පම් කා සූදු කෙළ ගෙදර යාමයි සමහරුන් කළේ.

මේ විපත ගැන ඇහැ ඇර බලන්න. අග මැතිතුමා සංවර්ධනය ගැන කථා කරන අතර රජයේ වගකිව යුතු ආයතනයක් සූදු කෙළිය ගැන මේ තරම් ලොකු ප්‍රචාරයක් ගෙන යන්නේ ඇයි? ලොතරැයි සූදු කෙළියෙන් ලැබෙන සල්ලි ටික ආර්ථික වශයෙන් රජයට ලොකු උදව්වක්, සත 50 බැගින් හූරා ගන්නවා. ඒ සල්ලි ටික නැත්නම්, සමහර විට මේ රුපියල් 25 කෝටිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

50 කෝටිය දක්වා වැඩි කරන්නට මුදල් ඇමතිතුමාට සිදු වන්නට බැරි නැහැ. රජයේ සේවකයන්ට පඩි ගෙවන්නට, ලොතරැයි සල්ලි ලොකු උදව්වක් වෙනවා ඇති. ඒ වාගේම අනෙකුත් ජනසතු ආයතනවල සේවකයන්ට පඩි ගෙවන්නටත් ලොතරැයි හා අඵසාධක අරමුදල් සල්ලි ලොකු උදව්වක් වන්නට පුළුවනි.

එහෙත් එක රෝගයක් සුව කර ගැනීමට දෙන බෙහෙතකින් ඊට වඩා අසාධ්‍ය රෝගයක් ඒ රෝගියාට වැළඳෙනවා නම් එය හරි වෙදකමක් දැයි මා අහන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, අද මේ රජය මුහුණ පා සිටින මේ දේශපාලන අර්බුදය මේ ආර්ථික රෝගයේ තවත් ලක්ෂණයක් බව කිව යුතුයි. රැකීරක්ෂා ප්‍රශ්නය හරියාකාර විසඳන්නට බැරිව අද මොකක්ද කරන්නේ ? බලයේ සිටිනවුන්ට තම ආණ්ඩු බලය තබාගෙන සිටීමට උපකාර වන පෙඩරල් පක්ෂය දෙමළ උගත් තරුණයන්ට රක්ෂා ඉල්ලනවා. ඒ වාගේම බරපතළ රැකීරක්ෂා ප්‍රශ්නයක් පිළිබඳ උද්ඝෝෂණයක් සිංහල ප්‍රදේශවලත් පැන නගිනවා. මේ බරපතළ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට මේ රජය යන්තමින්වත් සිතා සිටිනවාද ? අද අප නියෝජනය කරන ප්‍රදේශවල ගෙන යන රජයේ ප්‍රතිපත්තිය ගැන මතක් කරන්නට කැමතියි. යම් යම් ආයතනවල රක්ෂාවල් සඳහා එක්සත් ජාතික පක්ෂයට ආධාර කරන බලවත් පුද්ගලයන් ඒ ඒ ප්‍රදේශවල සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. ජාතික වශයෙන් මේ ප්‍රශ්නය විසඳීමට උත්සාහ නොකර මේ වාගේ රැවටිලි ව්‍යාපාරයක් ගෙන යනවා. සිංහල ප්‍රදේශවලදී කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් ළඟට ගොස් ලියුම් ලබාගෙන සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් අනුව රක්ෂා සපයන බව කියමින් තරුණයන් පොළඹවා ගන්නා එකයි. දෙමළ ප්‍රදේශවල පවතින්නේත් ඔය වාගේම තත්ත්වයක්, තමන්ගේ ප්‍රදේශවල රක්ෂා නැති අයට රක්ෂා දිය යුතු යයි පෙඩරල් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්, එසේ නැත්නම් දෙමළ මන්ත්‍රීවරුන් මෙම ආණ්ඩුවට බල කරනවා. පෙඩරල් පක්ෂය අද මෙම ආණ්ඩුවට කරන දේශපාලන බලපෑමේ ඇති ආර්ථික පසුබිම ඕකයි. ඒ නිසා මේ වාගේ යෝජනා ගෙනෙන්නට මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට සිදු වෙනවා. අද සිදු වී තිබෙන ආර්ථික පරිහාණියට මුහුණ පාන්නට වෙනත් මාර්ගයක් නැති නිසා අවුරුදු කීපයකට පෙර මේ වාගේ යෝජනා හෙළා දැක කථා කළ අයට අද මේ වීඩියේ පැළැස්තර අලවන්නට සිදු වී තිබෙනවා. මේ රජය පසුගිය අවුරුදු දෙකහමාර තිස්සේ අනුගමනය කරගෙන ආ වැරදි ප්‍රතිපත්ති මාලාව නිසා අද රටත් දැයත් එක හා සමාන අර්බුදයකට මුහුණ පා සිටිනවා. දැනට අනුගමනය කරගෙන යන ඔය ප්‍රතිපත්තිවලින් නම් ඔවුන්ට කවදාවත් මේ අර්බුද විසඳන්නට නොපුළුවන් බැවින් කිව යුතුව ඇත්තේ එකම එකයි. තමුන්ගේ උපදේශකයන්ගේ කීම් අනුව තමන් බලාපොරොත්තු වන මේ රටේ අනාගත සංවර්ධනය පිළිබඳ සිහිනය ටිකකට අමතක කොට, උපදේශ නිසා තව අවුරුදු හතරකින් පහකින් නැති වන්නට යන ජාතියේ අනාගතය ගැන හිතා, විශාල සංවර්ධන ක්‍රම ගැන නොව, සුඛෝපභෝගී ජීවිත ගැන නොව, අපේ මිනිසුන්ගේ පණ කෙන්ද යන්තම් ගැට ගසා ගන්නට හැකි වන ආකාරයට, එදා වේල කා ජීවත් වන්නට පුළුවන් විධියට ඒ අයට කෑම බීම ටිකක් සොයා දීමට ඉක්මනින් පියවර ගත යුතුයි. බටර් චීස් වැනි දේවල් නැතිවාට කමක් නැහැ. සාමාන්‍ය මිනිසුන්ට ඒවා කන්නට මුදල් නැහැ. අඩු ගණනේ මව්කිරි බී ජීවත් වන දුප්පත් දරුවාට කිරි වේල් දෙක අතරේ දෙන කොත්තමල්ලි වතුර ටිකවත් ලබා ගැනීමට හැකි වන පරිද්දෙන් කොත්තමල්ලිවත් සෑහෙන තරම් ලබා දෙන්නැයි අවසාන වශයෙන් මා මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා.

පූ. භා. 11.12

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)

*(திரு. பி. எச். பண்டார—பதுளை)*

(Mr. B. H. Bandara (Badulla)

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බිල් පත්‍ර නිකුත් කිරීමෙන් රුපියල් විසිපන් කෝටියක මුදලක් ණයට ගැනීම සඳහා ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති මේ යෝජනාව පිළිබඳව වැදගත් අදහස් රාශියක් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඊයේත් අදත් මේ සභා ගර්භය තුළදී ප්‍රකාශ කරන්නට යෙදුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

මේ යෝජනාව ඉදිරිපත් කරමින් ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා, රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව රජයේ සේවකයන්ට වැඩි කළ දීමනා සඳහා මේ ණය මුදල ලබා ගැනීමට සිදු වී තිබෙනවාය කියා. රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව මේ රටේ ජනතාවගේ ජීවන වියදම වැඩි වුණාය කියා ගරු මුදල් ඇමතිතුමා පිළිගන්නා බව එයින් අපට පැහැදිලිවම පෙනී යනවා. රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව ජනතාවගේ ජීවන වියදම් ප්‍රශ්නය ඉතාම බැරුරුම් තත්ත්වයකට පත් වූ බව අපි දන්නවා. මා හිතන අන්දමට 1967 න් පසුව මේ වකවානුව තරම් මහජනතාවගේ ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නය බරපතල තත්ත්වයකට පත් වූ වෙනත් වකවානුවක් මේ රටේ ඇති වුණේ නැහැ. අද රටේ ජනතාව ජීවත් වන අන්දම ගැන බලන විට අපට බිය නැතිව එසේ කියන්නට පුළුවන්කම තිබෙනවා.

එදා රුපියලේ අගය අඩු කරන්නට සූදානම් වූ අවස්ථාවේ විරුද්ධ පාර්ශ්වය රජයට පැහැදිලිව පෙන්නා දුන්නා රුපියලේ අගය අඩු කළොත් බඩු මිල ඉහළ යනවාය, ඒ නිසා මහජනතාවට ජීවත් වන්නට බැරි තත්ත්වයක් උදා වෙනවාය කියා. ඒ නිසා රුපියලේ අගය අඩු කරන්නට එපා යයි එදා අපි තරයේ කියා සිටියා. එහෙත් රජය ඒවා පිළිගත්තේ නැහැ. එංගලන්තය කළ පලියට මේ ආණ්ඩුවත් රුපියලේ අගය අඩු කළා. එදා රුපියලේ අගය අඩු කිරීම පිළිබඳ විවාදයේ දී ගරු අගමැතිතුමා පුරසාරම් දෙඩුවා, රුපියලේ අගය අඩු කිරීමෙන් ලංකාවට විශාල වාසියක් සැලසෙනවාය, ලංකාවට විශාල ආදායමක් ලැබෙනවාය, කියා. මේ රටේ නිෂ්පාදන වන තේ, රබර්, පොල් ආදියේ මිල වැඩි වී අපේ රටට විශාල වාසියක් නැත්නම් ශාන්තියක් සැලසෙනවාය කියා එදා අගමැතිතුමා කියා හිටියා. අපේ තේ, රබර්, පොල් ආදියේ මිල වැඩි වී ඒ මගින් අපට යම්කිසි වාසියක් සැලසෙනවා නම් විරුද්ධ පාර්ශ්වයේ සිටියත් අපත් සන්තෝෂ වෙන්නට ඕනෑ. මේ රටේ මූලික නිෂ්පාදනයක් වන තේ වැඩි මිලකට විකුණා ගන්නට පුළුවන්කමක් ඇති වුණොත් අපත් සන්තෝෂ වෙනවා. එහෙත් රුපියලේ අගය අඩු කිරීම නිසා තේ, රබර්, පොල් ආදියෙන් මේ රටට විශාල වශයෙන් වාසි සැලසේ යයි රජය බලාපොරොත්තු වූ නමුත් එසේ වාසි ලැබුණාය කියා අපටනම් පිළිගන්නට පුළුවන්කමක් නැහැ.

රටේ සිටින මහ ජනතාවට රුපියලේ අගය අඩු කිරීම නිසා ජීවන වියදම් ප්‍රශ්නය බරක් වී තිබෙන මේ අවස්ථාවේදී වෙනත් යම්කිසි පැත්තකින් රුපියලේ අගය අඩු කිරීම නිසා යම්කිසි වාසියක් සැලසී තිබෙනවාය කියා පෙන්වා දෙන්නට ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්කමක් තිබෙනවා නම් විරුද්ධ පාර්ශ්වයේ සිටියත් රටේ වගකිව යුතු පිරිසක් හැටියට එයින් සතුටු වීමට අපට පුළුවන්. රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව තේවලින් මෙපමණ වාසි සැලසී තිබෙනවාය, රබර්වලින් මෙපමණ වාසි සැලසී තිබෙනවාය, පොල් වලින් මෙපමණ වාසි සැලසී තිබෙනවාය, ඒ නිසා රුපියලේ අගය අඩු කිරීමෙන් අපට වාසියක් මිස අවාසියක් සිදු වී නැත කියා අපට පැහැදිලිව පෙන්වා දුන්නොත් අපි සන්තෝෂ වෙනවා. බලාපොරොත්තු වූ තරමේ කිසිම වාසියක් මේ රටට අත් වී තිබෙනවාය කියා අපට නම් කිසිම ක්‍රමයකින් පෙනෙන්නට නැහැ.

ඉන්දියාව මුදලේ අගය අඩු කළාට පසුව ඒ රටෙහි ඇති වූ තත්ත්වය කුමක්ද කියා අපි එදා පෙන්වා දුන්නා. මේ රටෙත් මුදලේ අගය අඩු කිරීම හේතුකොටගෙන මේ රටත් එවැනි තත්ත්වයකට පත් වන නිසා, ඉන්දියාවට වුණු දෙයිනුත් අප පාඩම් ඉගෙනගෙන මෙය පරිස්සමින් කළ යුතු බව විරුද්ධ පාර්ශ්වය එදා පැහැදිලිව පෙන්නුම් කළා. එහෙත් රජය එයට ඇහුම්කන් දුන්නෙ නැහැ. ලෝක බැංකුව කියන විධියට නැටීමට මේ රජයට සිදු වී තිබෙනවා. ලෝක බැංකුව හාල් සේරු දෙකෙන් එකක් කපන්නටය කිව්වා. හාල් සේරුවක් කැපුවා. රුපියලේ අගය අඩු කරන්නටය කිව්වා. ඒකත් අඩු කළා. ඇමෙරිකානු අධිරාජ්‍ය වාදීන් කියන අන්දමට මේ විධියට රජය නටන්නට ගියොත් මේ රටේ ජනතාව ජීවත් වන්නේ කොහොමද? මේ රටේ ජනතාවගේ තත්ත්වය පිළිබඳ හැඟීමක් නැතිව මේ ආණ්ඩුව මේ විධියට කපාගෙන කපාගෙන ගියොත් අවසානයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දී මොනවා ඉතිරි වෙයිද දන්නෙ නැහැ. එවැනි තත්ත්වයක් ඇත් උද්ගත වී තිබෙන්නේ. ඒ නිසා රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව අපේ රටේ මුදල් තත්වය පිළිබඳව—අපේ රටට ලැබී තිබෙන වාසිය පිළිබඳව—පැහැදිළි ප්‍රකාශයක් කරන ලෙස ගරු මුදල් ඇමතිතුමාගෙන් අප විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

රුපියලේ අගය අඩු කිරීමෙන් සිදු වූ අවාසිය නම් අපට හැම තැනදීම පැහැදිළිව පෙනෙනවා. අපේ ඇමතිවරුන්ට නම් ඒ අවාසිය පැහැදිළිව පෙනෙන්නෙ නැතිව ඇති. ගමේ ගොඩේ ජනතාව ජීවත් වන පැල්පත්වලට ගියොත් මොන විධියේ දුෂ්කර තත්ත්වයකින් අද ඒ අය ජීවත් වෙනවාද කියා පෙනෙයි. අද ඒ අයට හරියට බත් ටිකක් කන්නට නැහැ. හරියට මිරිස් ටිකක් දමා මාළුවක් කන්නට නැහැ. ඔවුන් ඒ විධියට දුකසේ ජීවත්වන බව ඇමති මණ්ඩලය දන්නෙ නැතිවා වන්නට පුළුවන්. එහෙත් අද ඒ ජනතාව මොන විධියේ දුෂ්කර තත්ත්වයකින් ජීවත් වෙනවාද යන්න අප පැහැදිළිව දන්නවා. අද අපට මේ මේ අමාරුකම් තිබෙනවාය, මේ අමාරුකම් මධ්‍යයේ අප මෙන්න මේ ඉලක්කය කරා යනවාය කියා තමුන්නාන්සේ රටට පැහැදිළි ප්‍රකාශයක් කරන්නට ඕනෑ. එහෙම ඉලක්කයක් පෙනෙනවා නම් අපේ ජනතාව තවත් ටිකක් ඉවසයි. ජනතාවට මේ දුක හැමදාම විඳින්නට බැහැ. දුක් විඳින ජනතාවට අනාගතය පිළිබඳවවත් බලාපොරොත්තුවක් තබන්නට පුළුවන් නම්, අසවල් තැනදී වාසියක් ලැබෙනවාය කියා පෙනෙනවා නම් සැනසී සිටින්නට පුළුවන්. අප ටිකක් දුක් වින්දත්, ටිකක් නොකා නොබී සිටියත්, මිරිස් ටිකක් අඩුවෙන් කැවත් අසවල් කාලයේදී අපට සැනසීමක් ලැබෙනවාය කියා ජනතාවට සැනසෙන්නට පුළුවන්, එහෙම ඉලක්කයක් පෙනෙනවා නම්. 1970 දී රට සංවර්ධනය වෙනවාය කියා තමුන්නාන්සේලා කියනවා. අපට නම් මොන විධියකින්වත් පැහැදිළිව පෙනෙන්නෙ නැහැ, එසේ සංවර්ධනය වන බවක්. එසේ සංවර්ධනයක් වෙනවා නම් පැහැදිළිව, සාක්ෂි ඇතිව රටට කියන්නට ඕනෑ, මේ අඳුරු යුගයේ දුෂ්කරතා මැඩගෙන මේ වකවානුව දක්වා ගියොත් අපට සැනසීමක් ලබා ගන්නට පුළුවන්ය, ඒ නිසා එතෙක් ඉවසන්නය කියා. එසේ නොකියා ජනතාවට හැමදාම හාමතේ ඉන්නට ඉඩ දී ඔවුන්ට ටිකින් ටික මැරී යන්නට සැලැස්වීම මොන තරම් අපරාධයක්ද කියා මා අහන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, රුපියලේ මිළ අඩු කිරීම නිසා අපේ තේවලින් අපට වාසියක් නොලැබුනත්, රබර්වලින් වාසියක් නොලැබුණත්, පොල්වලින් වාසියක් නොලැබුණත්, අගය අඩුවීමත් සමගම පිටි මිල වැඩි වුණා; භූමි තෙල් මිල වැඩි වුණා; පෙට්රල් මිළ වැඩි වුණා. පෙට්රල් මිල වැඩි වීම නිසා ලොරිවලින් හෝ වෙනත් වාහනවලින් එහා මෙහා ගෙන යන සෑම ද්‍රව්‍යයකම මිල වැඩි වී තිබෙනවා. එපමණක් නොවෙයි. මේ රටේ සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන යම් යම් ද්‍රව්‍යවල මිල ළඟදීම වැඩි වෙනවා. පිටි කිරි, කරවල, පරිප්පු ආදී සාමාන්‍ය ජනතාවට අවශ්‍ය ද්‍රව්‍ය මේ රටට එවන රටවල් ප්‍රකාශ කර තිබෙනවා, අපේ රටේ මුදලේ අගය අඩු කිරීම නිසා අපේ රටට එවන ද්‍රව්‍යවල මිල වැඩි කිරීමට ඒ රටවලට සිදු වන බව. වැඩි දවසක් යන්නට පෙර වැඩි මිලක් දී පිටි කිරි ගැනීමට අපට සිදු වෙනවා. වැඩි මුදලක් ගෙවා කරවල ගන්නට සිදුවෙනවා පරිප්පුත් හිඟයි. එදා තිබුණු ඒවා අද නැහැ. මිලත් වැඩි වෙනවා. සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන මේ වාගේ ද්‍රව්‍ය දහ හතරක පමණ මිල ළඟදීම වැඩි වන බව දැනගන්නට ලැබී තිබෙනවා. ඒවා නිපදවන රටවල් ඒවායේ මිල වැඩි කර අපට විකුණන්නට සූදානම් වෙනවා. එසේ කරන්නේ අපේ රුපියලේ අගය අඩු කිරීම නිසයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජනතාවට සිදු වන්නේ කබලෙන් ලිපට වැටුණු තත්ත්වයට පත් වන්නටයි. පීඩිත තත්ත්වයෙන් සිටින අසරණ ජනතාවට එදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය කරවල ටිකටත්, ළදරුවන්ගේ ප්‍රයෝජනයට තිබෙන කිරි පිටි ආදියටත් වැඩි මිලක් ගෙවන්නට වැඩි දවසක් ගත වන්නට ඉස්සර සිදු වෙනවා ඇති. ඒ නිසා මේ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ නොයෙකුත් ප්‍රශ්න ගැන අවබෝධයක් ඇතිව ක්‍රියා කරන ආණ්ඩුවක්දැයි අහන්නට අදට සිදු වී තිබෙනවා. මේ ආණ්ඩුව අපේ රටේ ප්‍රශ්න විසඳන්නට යන්නේ ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන් කියන අන්දමටදැයි ප්‍රශ්න කරන්නට අපට දැන් සිදු වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

හාල් සලාකය වශයෙන් තිබුණු සේරු දෙකෙන් එකක් කැපුවාට පස්සේ මේ රටේ විශාල මුදලක් ඉතිරි වෙනැයි ද, ඒ මුදලින් විශාල ලෙස මේ රට සංවර්ධනය කරන්නට පුළුවන් වෙනැයි ද මේ ආණ්ඩුවට උපදෙස් ලැබුණා. ඒ උපදෙස් අනුව මේ ආණ්ඩුව ක්‍රියා කළා. හාල් සේරු දෙකෙන් එකක් කැපුවා. දන් ජනතාවට සුමානයකට ලැබෙන්නේ හාල් සේරුවක් පමණයි. එක හාල් සේරුවකකින් මිනිහෙකුට ජීවත් වන්නට පුළුවන්ද? හාල් සේරුවකැයි සිතාගෙන අරන් ගියත්, කැකුළු හාල් සේරුවක් ගත් කෙනෙකුට එහි ඇත්ත වශයෙන්ම සේරුවක් නැති බව පෙනෙනවා. හාල් සේරුව ගෙදර ගෙන ගොස් පොළා, හළා, පිරිසිදු කළාම හාල් හුණ්ඩු තුනකට වඩා නැති බව තේරුම් යනවා. ඔය හාල් හුණ්ඩු තුනයි සුමානයක් තිස්සේ කන්නට මිනිහෙකුට ලැබෙන්නේ. හාල් හුණ්ඩු තුනකින් සුමානයක් ජීවත් වන්නටයි සිද්ධ වෙලා තියෙන්නේ. හාමතේ නිසා දවසින් දවස, ටිකින් ටික අපේ මිනිසුන් මැරි මැරී යන අවස්ථාවක් දන් ඇති වී තිබෙනවා. හාල් නැති බව කියතත්, කළු කඩේ නම් රුපියලකුත් ශත අසූව, රුපියලකුත් ශත හැත්තෑව, ආදි වැඩි මිළ ගණන්වලට තිබෙනවා.

නිපදවන වී ටිකක් නාස්ති වෙලා යන තත්ත්වයක් දැන් තිබෙනවා. ගරු ආහාර ඇමතිතුමාට මේ කාරණය විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මේ රටේ වී බුසල් ලක්ෂ ගණන් නාස්ති වෙනවා. වී තොග වශයෙන් රජයේ වී ගබඩාවල දිරා පත් වෙනවා. රටේ ජනතාවගේ වී ටික ගැන ගරු ඇමතිතුමා උනන්දුවෙන් කටයුතු කරන බව මා දන්නවා. වගාවන් සම්බන්ධව විශාල ඕනෑකමක් ඇතිව ගරු ඇමතිතුමා වැඩ කරන බව මා පිළි ගන්නවා. මේ කාරණය ගරු ඇමතිතුමා සමහර විට නොදන්නවා වෙන්නට පුළුවනි. "දවස" පත්‍රයේ ඊයේ පෙරේදා පළ වී තිබුණු පුවතකින් අපේ වී නාස්ති වන ආකාරය අනාවරණය වෙනවා. මම එය කියවන්නම්:

"වී බුසල් ලක්ෂ දෙකක් බොල් වේ

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට අයත්, ගල්ඔය කෝමාරියේ සහ මාවලකඩේ පිහිටි විශාලතම වී ගබඩා දෙකේ වී බුසල් දෙලක්ෂයක් පමණ අවුරුදු දෙක තුනක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබීම නිසා ඒවා ඒ ගබඩාවලම දිරාපත් වෙමින් පවතින බව හෙළි වී ඇත.

මෙම වී තොගය මෙසේ ගබඩාවල හිර වී දිරාපත් වීමට හේතුවී ඇත්තේ ගල්ඔය මණ්ඩලයේ ඒ ඒ අංශ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතනවලට පැවරීමේදී ඇතිවී ඇති අවුල් නිසා බව කියති.

දැනගන්නට ඇති හැටියට ගබඩාවල කලක සිට පුස් කකා නරක් වී ඇති මෙම විශාල වී තොගය දැනට ගුල්ලන් විද සුණුසාල් බවට පත්වී ඇති බවද කියති."

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

තායිවාන් වී ගැනත් කියලා තිබුණා නේද? බොහොම හොඳයි කියලා නේද කිව්වෙ? මේකත් ඒ වාගෙද නැද්ද කියන්නෙ කොහොමද?

**බී. එච්. බණ්ඩාර මයා.**

*(திரு. பி. எச். பண்டார)*

(Mr. B. H. Bandara)

ඒක වෙනම ප්‍රශ්නයක්. මෙය වැදගත් එකක්. වී දිරාපත් වන බවයි කියන්නේ. ඒ අතර ජනතාව කරදරයට පත් වෙනවා.

"රුපියල් තිස් ලක්ෂයක් පමණ වටිනාකම ඇති මෙම වී තොගය මෙසේ දිරාපත් වීමට ඉඩ හැරීම ගැන ගල්ඔය මණ්ඩලයට අයත් රජයේ වෘත්තීය සමිති මහත්සේ කලකිරීමකට පත් වී ඇත."

ගරු ආහාර ඇමතිතුමා මේවා ගැන සොයා බලන්නට ඕනෑ. සතියක් හාල් තුන් හුණ්ඩුවෙන් ජීවත් විය යුතු තත්ත්වයට වැටී සිටිද්දී වී බුසල් දෙලක්ෂයක් දිරාපත් වන බවක් කියැවෙන මේ පුවත ගැන සොයා බලන්නට ඕනෑ. මෙවැනි දේ සිදු වන්නට ඉඩ නොතැබිය යුතුයි. මේ පුවත සම්පූර්ණයෙන්ම බොරුය කියා අහක දමන්නට බැහැ. සොයා බලන්නට ඕනෑ. නිලධාරීන්ගේ යම් යම් දුර්වලකම් නිසා මේ රටේ නිපදවන වී විනාශ වී යෑමට ඉඩ නොදිය යුතුයි. එම නිසා මේ කාරණා ගැන සොයා බලා ජනතාවට මෙයට වඩා වැඩිපුර හාල් ප්‍රමාණයක් දෙන්න ක්‍රියා කරනවා නම්, නාස්තිය වළක්වා ගෙන, අඩු වශයෙන් එසේ නාස්තිවන ප්‍රමාණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත් ඉතිරි කර ගෙන ඒවා ජනතාවට බෙදා දෙන්න කටයුතු කරනවා නම්, එයින් විශාල ශාන්තියක් සැලසෙන බව මතක් කර දෙන අතර, අද බෙදා දෙන හාල් ප්‍රමාණයෙන් නම් ජීවත් වන්න විධියක් නැති බවත් සඳහන් කරන්න කැමතියි.

ජනතාව අද ජීවත් වන්නේ මොන විධියෙ තත්ත්වයකින්ද කියා ආණ්ඩුව මොහොතකටවත් කල්පනා කර බැලුවාද? ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම නිසා රෝග ශීඝ්‍රයෙන් පැතිර යන බව පෙනී යනවා. මැලේරියා රෝගය පමණක් නොවෙයි, වෙනත් රෝග ද ශීඝ්‍රයෙන් පැතිර යනවා. දවසින් දවස ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය දුර්වල වන නිසා රෝග පැතිර යාම වළක්වන්න අපහසුයි. මට මතකයි, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් සේවය කරන කාලයේදී මැලේරියාව මේ රටින් සම්පූර්ණයෙන්ම තුරන් කර දැමීමට කටයුතු කළ බව. ඇත්ත වශයෙන්ම එතුමාගේ ප්‍රයත්නය සාර්ථක වී මැලේරියාව සම්පූර්ණයෙන්ම රටින් තුරන් වුණත් නැවතත් මැලේරියා රෝගය හිස ඔසවන බව පෙනෙනවා. මැලේරියා රෝගය බෙහෙවින්ම පැතිර යන බවට වාර්තා ලැබී තිබෙනවා පමණක් නොවෙයි, ඊට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය බෙහෙත් නැති බවටත් වාර්තා ලැබෙනවා. බෙහෙත් ඇමෙරිකාවෙන් ලබාගැනීම පිණිස ඔඩර යවා තිබෙනවාලු. ඩී. ඩී. ටී. බෙහෙත් ද්‍රව්‍ය ඉසීමෙන් පමණක් පලක් වෙන්නෙ නැහැ. අවශ්‍ය ආහාර නොමැති කමින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය අන්තයටම පිරිහී ඇති නිසා රෝග වැළඳීම පහසුයි. රෝග වළක්වා ගැනීමේ ශක්තියක් පෙර මෙන් ඔවුනට නැහැ. සමහර විට මේවා ගැන කියන විට තමුන්නාන්සේලා හිනහ වෙන්න පුළුවන්. නමුත් මේවා හිනහවෙන් ඉවත ලන්න පුළුවන් දේවල් නොවෙයි. ජනතාව අද ජීවත් වන්නෙ කොයි ආකාරයෙන්ද කියා සොයා බැලුවොත් හිනහ වෙන්න නොවෙයි, තමුන්නාන්සේලාට අඬන්නටයි සිදු වෙන්නෙ.

එපමණක් නොවෙයි, ජනතාවට එදිනෙදා වුවමනා කරන අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල තත්ත්වය කොහොමද? මිරිස් රාත්තලක් රුපියල් 7.50 දක්වා මිල ඉහළ නැඟ තිබෙනවා. වගා කරනවායයි තමුන්නාන්සේලා කියනවා. කොහේද වගා කර තිබෙන්නෙ? ගුවන් විදුලියෙන් නම් උදේ සිට රෑ වනතුරුත් වගා කරනවා. නමුත් මිරිස් රාත්තලක් රුපියල් 7.50 ට අඩුවෙන් ගන්න තැනක් නැහැ. පෞද්ගලික ව්‍යාපාරිකයනට අක්කර දහස් ගණනක් බෙදා දී තිබෙනවා, වගා කරන්න. කෝ ඒ අය වගා කළ දේවල්? කෝ ඒ අය වගා කළ මිරිස්?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඇයි තමුන්නාන්සෙ වගා කරන්නෙ නැත්තෙ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
තමුන්නාන්සේලාගේ හිතවතුන්ට අක්කර දහස් ගණන් බෙදා දෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේටත් තිබෙනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
මුසාජීලාට අක්කර දහස් ගණනින් බෙදා දෙනවා, ගොවීන්ට නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේ වගා කරන්නේ නැහැ; කියනවා විතරයි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
පසුගිය අවුරුද්දෙ වී වගාව සරුසාරවී තිබෙනවායයි නිලධාරීන් විසින් වාර්තා ඉදිරිපත් කර ඇමතිතුමා මුළා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

නිලධාරීන් කොයි අන්දමින්ද මේ වාර්තා සපයන්නෙ කියා මා එක් සිඹියක් මගේ කොට්ඨාශයෙන්ම පෙන්නුම් කරන් නම්. මගේ කොට්ඨාශයෙ එක කුඹුරකින් අක්කරයකට වී බුසල් 270 ක් ලැබුණායයි වාර්තාවක් පෙන්නුවා. ඒ කුඹුර අයත් පුද්ගලයා ගොවිරජා ලෙස තෝරා ගෙන රුපියල් 750 ක ත්‍යාගයක්ද පිරිනැමුවා. ඇත්තවශයෙන්ම ගොවිරජා වශයෙන් තෝරා ගත් මේ පුද්ගලයා කවදාවත් උදැල්ලක් අල්ලන මනුෂ්‍යයෙක් නො වෙයි; ඔහු මුදලාලි කෙනෙක්; කුඹුරු හිමියෙක්. මෙන්න මේ විධියෙ දේවල් සිඬ වෙනවා. නමුත් නිලධාරීන් ඇමතිතුමා සන්තෝෂ කරන්න වාර්තා එවනවා. අක්කරයකින් වී බුසල් විශාල සංඛ්‍යාවක් ලැබුණායයි ඒ අය තක්සේරු කරන්නෙ ලියද්දක හොඳින් වැඩී ගිය කොටසක් තෝරා ගෙන එයින් ලබාගත් අස්වැන්න ප්‍රමාණයන් මැනීමෙනුයි. ඒ හැර මුළු අස්වැන්න ප්‍රමාණය ගෙන බැලුවොත් මගේ කොට්ඨාශයෙ අක්කරයකින් බුසල් හැටකට වඩා ලැබී නැහැ. ගරු කථානායකතුමනි, ගොවිරජාට ත්‍යාග බෙදූ දීමේ උත්සවයට මාත් සහභාගි වුණා. නිලධාරීන් පෙන්නා දෙන හැටියට අක්කරයකින් වී බුසල් 270 ක් ලබාගන්න පුළුවන් නම් මේ රටේ සහල් හිඟයක් ඇත්තේ නැහැ.

එමනිසා මේ කථා පට්ටපල් බොරු. මෙවැනි කථාවලින් සන්තෝෂ වෙන්න එපා. බෙදා දුන් අක්කර දහස් ගණනක ඉඩම්වල මිරිස් වාගේ දේවල් වගා කරන්නටයයි කියන්න. එහෙම වගා කරනවා නම් දුප්පත් උදවියට මිරිස් රාත්තල රු. 7.50 ගණනේ මිලදී ගන්න සිදු වෙන්නේ නෙ නැහැ. අර්තාපල්, මිරිස්, ලූනු වගා කරන්නෙ නැතුව, අවුන්ස තුනකින් මාසයක් කන්නෙ කොහොමද? දුප්පත් උදවියට මේවා වගා කරන්න ඉඩකඩම් නැහැ; පහසුකම් නැහැ. එහෙම නම් ඉඩම් බෙදූ දුන් අයට ඒවා වගා කරන ලෙස බල කරන්න තමුන්නාන්සේලාට බැරි ඇයි? තමුන්නාන්සේලා ඒ අයට ජීප් රථ සපයා තිබෙනවා. නමුත් මොන අන්දමේ වගාවක්ද කර තිබෙන්නෙ? ජීප් රථ වගා කිරීමේ කටයුතු සඳහා ප්‍රයෝජනයට නොගන්නවා නම් ආපසු ගන්නා බවක් ඇමතිතුමා කියා තිබෙනවා. ඇත්තවශයෙන්ම ඒ අන්දමට ක්‍රියා කරනවා නම්, කියන විධියට කරනවා නම් අපට සන්තෝෂ වන්න පුළුවනි, සමහරවිට වගාව සඳහා යයි කියමින් ජීප් රථ ලබා ගත් උදවිය ඒවා ඔවුන්ගේ පෞද්ගලික පාවිච්චිය සඳහා යොදවනව. බදු සහන ඇතිව ලබා ගත් ඒ වාහන වගා කටයුතු සඳහා යොදවනවාදැයි පරීක්ෂා කර බලා ඒවා වගා කටයුතු සඳහා පාවිච්චි නො කරන බව පෙනී ගියොත් වහාම රජය සතු කර ගන්ට ඕනෑ. එවැනි දැඩි පියවරවල් නොගත්තොත් 1970 වන විට වගා කටයුතු අතින් රට ස්වයංපෝෂිත කිරීමේ තමුන්නාන්සේලාගේ බලාපොරොත්තුව නිකම් පුස්සක් බවට පත් වන්ට පුළුවනි.

මේ රට සවයංපෝෂිත කිරීමේ කටයුත්තට අත දෙනවා නම්, හිත දෙනවා නම් ඔය අන්දමට අක්කර දහස් ගණන් ඉඩම් බෙදා දීලවත්, ජීප් රථ බෙදා දීලවත් ඒ කටයුත්ත ඉටු කර ගන්ට පුළුවන් වන එකක් නැහැ. ඒ බලාපොරොත්තුව ඉටු කර ගන්ට නම් ගොවි ජනතාවට අවශ්‍ය පෝර ටික හා ණය පහසුකම් ආදිය කලට වේලාවට සපයා දෙන්ට ඕනෑ. මේ වනාවේ මහජන බැංකුවෙන් වගා ණය ලබා ගන්ට ගිය මගේ කොට්ඨාශයේ ගොවීන් කීප දෙනෙකු දැන් ගොවිතැන් වැඩ අවසාන කර ඇති නමුත් ණය මුදල් තවම ලැබී නැහැ. ඒක ඇමතිතුමාගෙ වරදක් නො වෙයි. ඒ නිසා ජීප් රථ හා ඉඩම් බෙදා දෙනවාට වඩා බොහොම හොඳයි, ඒ ගොවීන්ට අවශ්‍ය පෝර ටික සපයා කලට වේලාවට ණය මුදල් ලබා දී ඇල අමුණු ටික සකස් කර ජලය සපයා දීම. එහෙම කළොත් මීට වඩා වගා ව්‍යාපාරය දියුණු කරන්ට පුළුවන් බව මා මතක් කරනව.

ඊළඟට අපේ ප්‍රදේශයේ වැලිමඩ වගේ කොට්ඨාශවල අර්තාපල් වගාව සම්බන්ධයෙනුත් ගරු ආහාර ඇමතිතුමාට කාරණයක් මතක් කරන්ට ඕනෑ. ඒ ප්‍රදේශයේ අර්තාපල් වගාව බොහොම හොඳින් කෙරෙනව. එහෙත් පසුගියදා පැවති දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවකදී දිසාපතිතුමාගෙන් මට දැන ගන්ට ලැබුණ අර්තාපල් වගාව සීමා කර තිබෙන බව. අසුවල් ප්‍රමාණයට වඩා අසුවල් ප්‍රදේශයේ අර්තාපල් වගා කරන්ට බැරි යයි සීමාවක් දමා තිබෙන බව දැන ගන්ට ලැබුණ. ගොවියන්ගේ උනන්දුව තිබෙනව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් අර්තාපල් ඕනෑ තරම් මේ රටේ වැව් වාට කමක් නැහැ. අපට වැඩි නම් පිටරට වුණත් යවන්ට බැරියැ. මේ සීමා කිරීම නිසා ඉතා ශීඝ්‍රයෙන් අර්තාපල් වගාව කර ගෙන ආව ගොවි මහතුන් මන්දෝත්සා ජීව සිටිනව. එයින් අර්තාපල් වගාව සරු වට කරගෙන ආව උදවිය ටිකක් පස්සට යන තත්ත්වයක් ඇති වුණා. ඒ නිසා මේ වගාවට සීමාවක් නොදමන ලෙස මා ඉල්ලා සිටිනව. තවත් ධෛර්‍ය දෙනවා මිස අසුවල් ප්‍රමාණයට වඩා වගා කරන්ට එපා යයි සීමා දමන්න එපා. බල කරන්න එපා. මා දන්නෙ නැහැ, මේ පිළිබඳව තමුන් නාන්සේ නියෝගයක් යවා තිබෙනවද කියා. ඔය විධියේ ප්‍රවෘත්තියක් මට දිසා පතිතුමාගෙන් දැන ගන්ට ලැබුණා.

ගරු කථානායකතුමනි, රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව ජනසතු සේවා ඇමතිතුමා ප්‍රකාශ කළා. රුපියලේ අගය අඩු කිරීම නිසා පෙට්‍රල් මිළ වැඩි වූ නමුත් බස් ගාස්තු වැඩි කරන්නෙ නැහැ කියා. එහෙත් දැන් ගාස්තු මණ්ඩලයක් පත් කර තිබීමෙන් අපට පැහැදිලියි, වැඩි කල් යන්ට පෙර බස් ගාස්තුවල වැඩිවීමක් සිදුවන බව. මහජනයාට ජීවන වියදම උසුලා ගන්ට බැරි තරම් බඩු මිළ නැඟ තිබෙන මේ අවස්ථාවේ බස් ගාස්තුත් වැඩි කළොත් ජනතාව තවත් අමාරුවට පත් වෙනව. ආණ්ඩුව මුලින් කියා සිටියේ බස් ගාස්තු වැඩි කරන්නෙ නැති බවයි. වැඩි කල් යන්ට පෙර බස් ගාස්තු වැඩි වීම රහසක් නොවෙයි. අද ජීවත් වෙන්නෙ කොහොමද යයි සිතමින් එදි නෙදා ප්‍රශ්න විසඳා ගන්ට බැරිව සිටින ජනතාවට බස් ගාස්තුත් වැඩි වුණොත් විශාල හිරිහැරයකට පත් වෙන්ට සිදු වෙනව. පසුගිය අවුරුදු තුනකට ආසන්න කාලය තුළදී තමුන්නාන්සේලා ගෙන ගිය වැඩ පිළිවෙලින් ජනතාව අමාරු වෙන් අමාරුවට පත් වුණා මිස ඔවුන්ට සිදුවුණු යහපතක් නැහැ. අනාගත බලා පොරොත්තුවක් ඇති කර ගන්නට පුළු වන් තත්ත්වයක් ජනතාවට තිබෙනවා නම්, ඉදිරි කාලයේදි කිසියම් සහනයක් සැලසේයයි බලාපොරොත්තුවක් ඇති කර ගන්නට පුළුවන්කමක් ජනතාවට තිබෙනවා නම්, නොකා නොබී හෝ, සතිය කට හාල් සේරු දෙකක බත් කෑ කෙනකු හාල් හුණ්ඩු තුනක බත් කා හෝ වැඩ කරන්නට සූදානම් වෙයි. එහෙත් එවැනි තත්ත්වයක් අද ඇත්තේ නැහැ. රුපියලේ අගය අඩු කිරීමෙන් ජනතාවට සැල සුණු අවාසි නම් දැන් හොඳහැටි පැහැ දිලියි. එයින් සැලසුණු වාසි මොනවාද, කොපමණද යන වග ගරු මුදල් ඇමති තුමා එතුමාගේ පිළිතුරු කථාවේදී පෙන් වා දෙනැයි මා බලාපොරොත්තු වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා එක සැරයක් ඔක කිව්වානේ. ඒකම ආයෙත් කියන්නේ මොනවාටද? නරක් වුණු රෙකෝඩ් එකක් වාගේ එකම දේ හැම තිස්සේම කියනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

දෙතුන් සැරයක් කියලාවත් රජයට මේවා අවබෝධ කරවන්නට ඕනෑ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

එහෙම කරන්න වෙලාවක් නැහැ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

විරුද්ධ පක්ෂය මේ ආණ්ඩුවේ කටයුතු කොපමණ විවේචනය කළත් මේ ආණ්ඩු වේ වැඩ පිළිවෙළ ගැන මහජනතාව තම අප්‍රසාදය කොයි තරම් දුරට පළ කළත් මේ ආණ්ඩුව හොඳ මාර්ගයක ගමන් කිරී මට අදහස් කරන බවක් නම් පේන්නේ නැහැ. ජනතාවට හිතවත්ව කටයුතු කරන වබක් පේන්නේ නැහැ. එම නිසා, ජනතාවගේ දුක ඉක්මණින්ම අවසාන කර ගැනීම පිණිස හැකි මේ රජයට නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.40

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)

(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறெஸ்ஸ)

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු කථානායකතුමනි, දීර්ඝ වශයෙන් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව ගැන අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීම වැදගත් යුතුකමක් නිසා වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා අදහස් කරනවා.

ආණ්ඩුව ප්‍රතිගාමී ජාති විරෝධී යෝජනාවක් ඉදිරිපත් කරන හැම අවස්ථාවකදීම විරුද්ධ පක්ෂය ඊට විරුද්ධ වන විට ආණ්ඩුව තර්කයක් වශයෙන් ඉදිරිපත් කරන්නේ, කලින් තිබුණු ආණ්ඩුවත් එසේ කළ නිසා තමනුත් එයම කරනවාය යන්නයි. පසුගිය ආණ්ඩුව කළ නිසා අපටත් මෙය කරන්නට ඉඩ දෙන්නයයි රජය කියනවා. විරුද්ධ පාර්ශ්වයේ කොටස් පසුගිය ආණ්ඩු විසින් කරන ලද සෑම දෙයක්ම අනුමත නොකළ බව මේ ආණ්ඩුවට මා පළමුවෙන්ම මතක් කරන්නට කැමැතියි. විරුද්ධ පක්ෂයේ සමහර කණ්ඩායම් පසුගිය ආණ්ඩුවට සහයෝගය දුන්නත් එහි යම් යම් යෝජනා යම් යම් ක්‍රියා තදින් විවේචනය කළා, සමහර ඒවාට විරුද්ධ වුණා.

මේ ආණ්ඩුව ගැන කල්පනා කරන විට, ඒ පසුගිය ආණ්ඩුවලට වඩා වෙනස් ප්‍රතිපත්තියක් මේ ආණ්ඩුව ගෙන යන බව අපට පෙනී යනවා. සභාග ආණ්ඩුවටත් ඊට පෙර තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවටත් වඩා හාත්පසින්ම වෙනස්, ප්‍රතිගාමී, අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියි මේ ආණ්ඩුව ගෙන යන්නේ. මේ රටේ අධිරාජ්‍යවාදී බලතල වැඩි කිරීමේත් සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රමක්‍රමයෙන් මේ රටින් තුරන් කිරීමේත් වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව බලයට ආ දවසේ සිටම යොදවා නැවතත් මේ රට ආර්ථික වශයෙනුත් දේශපාලන වශයෙනුත් වාල් තත්ත්වයකට ගෙන ඒමට මේ ආණ්ඩුව විශේෂ පරිශ්‍රමයකිනුත් වගකීමකිනුත් අද කටයුතු කරගෙන යනවා. ගිය ආණ්ඩුව කළ දේම මේ ආණ්ඩුවත් කරන්නට අදහස් කරතොත් ඊට වඩා භයානක විපාකවලට මුහුණ පාන්නට සිදු වන බව හොඳින් අවබෝධ කර ගන්නා ලෙස මා මතක් කරනවා.

1956 දී බණ්ඩාරනායක මහතා බලයට ආ දවසේ සිට 1965 මාර්තු මාසය දක්වා වූ කාලය තුළ මේ රට අධිරාජ්‍යවාදී බල පෑම් හා යටත් විජිත ප්‍රතිපත්තිවලින් තුරන් වී සමාජවාදී රටවල් සමග සම්බන්ධකම් ඇති කරගෙන තිබුණා. සභාග ආණ්ඩුව පරාජය වන අවස්ථාව වන විට, අධිරාජ්‍යවාදීන් මේ රට සමග ඇති කර ගෙන තිබුණු ආර්ථික සම්බන්ධකම් ඔවුන් විසින්ම අත්හැර දමන තත්ත්වයක් ඇති වී තිබුණා. ආර්ථික වශයෙන් මේ රට සූරා කෑමට කටයුතු කරන බ්‍රිතාන්‍ය හා අමෙරිකන් අධිරාජ්‍යවාදීන් සමග සාමකාමීව තෙල් හා පෙට්රල් මේ රටට ගෙන්වීමේ හා බෙදා හැරීමේ විශාල ව්‍යාපාරය ජනසතු කරන්නට බැරි වූ බැවින්, එම ව්‍යාපාරය බලහත්කාරයෙන් ජනසතු කරන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හා සභාග රජයයන් කටයුතු කර ගෙන ගියා ; අවසානයේදී ජනසතු කළා. එහෙත් මේ ආණ්ඩුව ඒ අධිරාජ්‍යවාදී ආණ්ඩු සමග සහෝදරත්වයකින් මෙන් බැඳී මේ රටේ ආර්ථික පදනම සම්පූර්ණයෙන්ම ඔවුන් යටතට පත් කිරීමට කට යුතු කරනවා.

මේ රජයේ බයිබලය නැත්නම් බණ පොත ලෝක බැංකුවයි. ඒකාධිකාරී ධන පති ආණ්ඩු සමග එකතු වී මේ රට ධන පති රාමුව ඇතුළත තවදුරටත් පවත්වා ගෙන යෑමටත්, සමාජවාදී ආර්ථික පදනමක් හැටියට සංවිධානය වීම වැළැක්වීමටත් මේ ආණ්ඩුව ඉතාමත් භයානක විධියේ ප්‍රතිපත්තියක් ගෙන යෑම නිසායි, අප විසින් මේ ආණ්ඩුව විවේචනය කරනු ලබන්නේ. බිල් පත් සීමාව රුපියල් 25 කෝටියකින් වැඩි කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව නිසා මේ රටට ඉතාමත් භයානක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වන අවස්ථාවක් එළඹෙන බව මතක් කරන්නට කැමතියි. මේ රජය ලෝක බැංකුවේ උපදේශය නැත්නම් නියමය අනුව රුපියලේ අගය අඩු කළා. රුපියලේ අගය අඩු කිරීම සම්බන්ධයෙන් විවාදයක් පැවැත්වුණු නිසා මා ඒ ගැන මේ අවස්ථාවේදී දීර්ඝ වශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. එහෙත් එක කාරණයක් මතක් කරන්නට කැමැතියි. බ්‍රිතාන්‍යය පවුමේ අගය අඩු කළ අවස්ථාවේදී අප රුපියලේ අගය අඩු නොකළා නම් බ්‍රිතාන්‍යය සමඟ කරන ගනුදෙනු වලින් අපට ආර්ථික වශයෙන් විශාල ලාභයක් ලැබෙන්නට ඉඩ තිබුණා. එහෙත් බ්‍රිතාන්‍යය වැනි අධිරාජ්‍යවාදී ආණ්ඩුවල ආර්ථික පරිහානියක් ඇති වී මුදලේ අගය අඩු කරන අවස්ථාවක ලංකාව වැනි නොදියුණු රටවලට එමගින් ප්‍රයෝජනයක් ලබන්නට ඉඩ නොදෙන්නට, එසේ ප්‍රයෝජන ලැබීම සම්පූර්ණයෙන්ම නතර කිරීමට ඔවුන් තීරණය කළා. ඒ අධිරාජ්‍යවාදී ආණ්ඩුවල ආධාරය බලාපොරොත්තුවෙන් මේ රජය කටයුතු කරන නිසා ඔවුන් බෙරය ගහන තාලෙට නටන්නට මේ ආණ්ඩුවට සිදු වී තිබෙනවා. අද විතරක් නොවෙයි, මේ රජය බලයට පත් වූ දා පටන්ම සමාජවාදී රටවලට නින්දා අපහාස කරනවා. එහෙත් ඇත්ත වශයෙන්ම අපේ රටේ කාර්මික දියුණුවක් ඇති වන විධියේ ස්ථිර පදනමක් උඩ අපට ආධාර කරන්නේ සමාජවාදී රටවල් පමණයි. එහෙත් මේ රජය බලයට පත් වූ 1965 සිට අද වන තුරුත් ඒ සමාජවාදී රටවල් සමඟ තිබෙන අපේ සම්බන්ධකම් නැති වන විධියට ඒ රටවල් අපහාසයට ලක් කරන ආකාරයෙනුයි, මේ රජය කටයුතු කරන්නේ.

මේ සම්බන්ධයෙන් එක්තරා වැදගත් කාරණයක් මතක් කරන්නට කැමැතියි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කර තිබෙනවා. ලංකාවේ කාර්මික දියුණුවක් ඇති කිරීම සඳහා ආධාර වශයෙන් විශාල ණය මුදලක් දී ආසියාවේ ඇති විශාලතම පේසකර්මාන්ත ශාලාව ලංකාවේ පිහිටුවීමට කටයුතු කරන සමාජවාදී රටක නියෝජ්‍ය අගමැතිවරයා මේ රටට ආවේ මේ රජයේ ඇමතිවරයකුගේ අමුත්තකු වශයෙනුයි. එවැනි කෙනකුට අරලියගහ වලව්වේ ඉඩක් නැහැ. මෙයින් අපට පැහැදිලි වන්නේ මොකක්ද? අපේ රටේ දියුණුව සඳහා ප්‍රමුඛ වශයෙන් ආධාර දෙන සමාජවාදී රටවල් සමඟ සම්බන්ධකම් ඇති කර ගන්නට මේ ආණ්ඩුවේ අදහසක් නැති බවයි. ධනපති රටවල, අධිරාජ්‍යවාදී රටවල උදව් උපකාර ඇතිව මෙම ආණ්ඩුව 1965 දී බලයට පත් වුණා. අධිරාජ්‍යවාදීන් මේ ආණ්ඩුව බලයට පත් කෙළේ ඔවුන් කියන කියන හැටියට මේ ආණ්ඩුව නැටවීමේ බලාපොරොත්තුව පිටයි. දැන් කොටි වල්ගය අල්ලාගෙන සිටින මේ ආණ්ඩුවට ඒ අධිරාජ්‍යවාදීන් සතුටු වන ආකාරයට වැඩ නොකර බැහැ. තම තමන්ගේ පෞද්ගලික දියුණුව සැලසෙන ආකාරයට වැඩ කරගෙන යන්නට ඉඩ දෙනවා නම් අධිරාජ්‍යවාදීන් එසේ නැත් නම් ඒකාධිකාරී ධනපති කොම්පැනිකාරයන් මේ රටේ ධනය යොදවන්නට කැමතියි. ඔවුන්ගේ අදහස මේ රට දියුණු කිරීම නොව තමන් දියුණු වීමයි. රුපියල් 25 කෝටියක භාණ්ඩාගාර බිල්පත්‍ර සඳහා මෙම ආණ්ඩුව අවසර ඉල්ලන්නේ එය මේ රටේ ආහාර වගා ව්‍යාපාරය සඳහා, එසේ නැත්නම් කෘෂිකර්ම සංවර්ධනය සඳහා යොදවා ගෙන රට දියුණු කිරීමේ අදහස ඇතිව බව කියනවා. මේ සා විශාල මුදලක් වන භාණ්ඩාගාර බිල්පත්‍ර සඳහා අපෙන් අනුමැතිය ඉල්ලන්නේ ඔය විධියට ප්‍රකාශ කරමිනුයි.

ගරු කථානායකතුමනි, පසුගිය දවසක ලෝක බැංකුවේ නියෝජිතයකු ලංකාවට පැමිණියා. මට ඔහුගේ නම මතක නැහැ. ඔහු ලංකාවට නිවේදනයක් කළා. මොකක්ද ඒ නිවේදනය? මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකුවෙන් ණය ලබා ගන්නට ඕනෑ වුවත්, ලෝක බැංකුව දෙන ඒ ණය කොටස් වශයෙන් ආපසු ගෙවීමට සහ පොළිය ගෙවීමට මේ ආණ්ඩුවට පුළුවන් වේ යයි විශ්වාසයක් නැති බවත්, එදිනෙදා වියදම් සඳහාවත් මේ ආණ්ඩුවට ආදායමක් නැති නිසා මෙම ආණ්ඩුවේ වගකීම උඩ ණය ඉල්លු පමණින් ණය දීමට නොහැකි බවත්, දැනට ඇති ගංගා නිම්න සංවර්ධන යෝජනා ක්‍රම යටතේ පදිංචිව සිටින ගොවියන් නිෂ්පාදනය කරන ධනය ගැන විශ්වාසය තබා ලෝක බැංකුව ණය දෙන්නට කැමති නැති බවත්, තමන්ගේ නඩත්තුව සඳහා යමක් උපයා ගැනීමට වඩා සංවර්ධනය සඳහා ලබා ගන්නා ණය ආපසු ගෙවීමට ප්‍රමාණවත් ධනයක් නිෂ්පාදනය කරන්නට මේ රටේ ගොවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්ට ශක්තියක් නැති බවත්, ඒ උදව් යට ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන නිසා ඒ උදව්ය ගැන සහතිකයක් ඇතිව ණය දිය නොහැකි බවත් ඒ නිවේදනයේ සඳහන් වෙනවා.

හැබැයි ඒ නිවේදනයේ මෙසේත් කියා තිබෙනවා. මේ රට විදේශිකයන්ට යටත්ව පැවති කාලයේදී උඩරට ඉඩම් අක්කර ලක්ෂ ගණනක් අල්ලා ගෙන තේ රබර් වගා කළාක් මෙන් මහ වැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඇති අක්කර දශ ලක්ෂයෙන් වැඩි කොට සක් විදේශීය කොම්පැණිවලට අයිතිකර ගන්නට සලස්වා සංවර්ධනය සඳහා ඒ උදව්යට උදව් කළහොත්, ඒ වාගේම ඒ අයගේ මුදල් ප්‍රවේශම් කර ගැනීමට වැඩ පිළිවෙළක් යෙදුවහොත් හොඳලු. තමන් කඩුව, මහියංගනය, රාජාංගනය වැනි ප්‍රදේශවල ඇති මුඩු බිම් වගා කිරීමට මෙතෙක් කල් මුදල් වියදම් කෙළේ ලංකා ආණ්ඩුවයි. තවත් විධියකින් කියතොත් ඒ සඳහා වියදම් කෙළේ ලංකාවේ මහජන යාගේ මුදලුයි. දුප්පත් ජනතාවගේ මුදල් වියදම් කොට අරමුණ ඇති කළායින් පසුව ඒ අරමුණෙන් ප්‍රයෝජන ගැනීම සඳහා අප විදේශික ඒකාධිකාරී ධනපති කොම් පැනිවලට කඩුළු අරින්නට ඕනෑ. මේ රටේ ඉතිරිව තිබෙන පහත් බිම් ප්‍රදේශ ටිකත් ඒ කොම්පැනිකාරයන්ට දී අපේ රට සංවර්ධනය කරන්නට ඕනෑලු. ඒ නිසා තවත් රුපියල් විසිපත් කෝටියකින් භාණ්ඩාගාර බිල් පත්‍රවල ප්‍රමාණය වැඩි කිරීමට මේ ආණ්ඩුව බලය ඉල්ලන්නේ ධන නිෂ්පාදනයක් හෝ ආදායමක් නැතිව නෝට්ටු අච්චු ගසා මේ රටේ උද්ධමනය වැඩි කර ඒ මගින් මේ රට බංකොලොත් කර විදේශීය බලවේගයකට මේ රට වහල් වන තත්ත්වයකට පත් කළොත් ඔවුන් ගේ අදහස් ඉටු කර ගැනීමට පුළුවන් වන නිසයි.

මහවැලි ගඟ ව්‍යාපාරය සම්බන්ධව සමාජවාදී රටවල විශේෂඥයින් බොහොම මහන්සියෙන් කටයුතු කරගෙන යනවා. සෝවියට් දේශයේ විශේෂඥයකු වන ෆියල් කොස්කි මහතාගේ ප්‍රධානත්ව යෙන් අද ඒ ව්‍යාපාරයේ කටයුතු කෙරී ගෙන යනවා. ලංකාවේ වාරිමාර්ග දෙපාර්‍ත මේන්තුවේ උසස් නිලධාරීන් හුඟදෙනකුත් බොහොම ආසාවෙන්, මහන්සියෙන් හා උනන්දුවෙන් පස පරීක්ෂා කිරීම, වාරි මාර්ග කටයුතු සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම, ජලාශ ඇති කිරීමේ ස්ථාන පිළිබඳව පරීක්ෂා කර බැලීම ආදිය කර ගෙන යනවා. මේ කටයුතු කිරීමේ නියම ප්‍රයෝජනය ගන්නේ කවුද? අපේ මේ මාතෘ භූමියෙන් වැඩි කොටසක් විදේශීය කොම්පැනිවලට හිමි කිරීමේ වැඩ පිළි වෙළක් ක්‍රියාත්මක කරන්නය කියා ලෝක බැංකුව දැන් මේ ආණ්ඩුවට නියම කර තිබෙනවා. [බාධා කිරීමක්] ගරු ඇමති තුමා නියවනවා. ද්‍රෝහිකම් කරමින් පාවා දීමේ කටයුතු කරන විට කරන ඔය නිය විල්ල මරණාසන්නයේ ඇතිවන නියවිල් ලක් බව මා කියන්නට කැමතියි. විශේෂඥ පිරිසක් පැමිණ ඔය අන්දමට මේ ආණ්ඩුවට අවවාද කළේ නැද්ද? ලෝක බැංකුවෙන් ණය ලබාගැනීම සඳහා මේ ආණ්ඩුව එංගලන්තය, අමෙරිකාව, ප්‍රංශය, බටහිර ජර්මනිය, ජපානය කියන බලගතු රටවල් පහකට වහල් වී සිටිනවා. ප්‍රංශය නම් දැන් එයින් ටිකක් අයින් වී සිටි නවා. ආධාර ලබාගැනීම සඳහා සමාජවාදී රටවල් සියල්ලම අතහැර දමා අර රටවලට වහල් වී කටයුතු කරන්නේ නැද්ද?

ගරු කථානායකතුමනි, උතුරු කොරියා වට පහරදීම සඳහා හැනැප්ම 8,000 ක් පමණ ඈත සිට පැමිණ ඔත්තු සෙවීමට තමන්ගේ මුහුදු සීමාවට ඇතුළු වූ අමෙරි කන් ඔත්තු නැව කොරියානු නාවුක හමුදාව මගින් අල්ලා ගත්තා. ඒ සම්බන්ධව දැන් අමෙරිකාව කොරියාවට තර්ජනය කරනවා. බෝම්බ දමන බවට තර්ජනය කරනවා. තමන්ගේ වෙරළ අසලට පැමිණි ඔත්තු සෙවීමේ අමෙරිකන් නැව අල්ලා ගැනී මෙන් කොරියාව කළේ මංකොල්ලකෑමක් ලු. පිට කොන්දක් නැති, වහල් අදහස් ඇති, යම් කෙනෙක් යම් කාරුණක් ඉදිරි පත් කරන විට දත නියවන ඇමතිවරුන් සිටින මේ ආණ්ඩුව අද වන තුරුත් ඒ ගැන ප්‍රකාශයක් කළාද? මේ වනවිට ම්ලේච්ඡ අමෙරිකන් ආණ්ඩුව උතුරු වියට් නාමය වගේ උතුරු කොරියාවත් නැති කිරීමට කටයුතු කරනවාය කියා කියන්නට මේ ආණ්ඩුවට පුළුවන්කමක් තිබෙනවාද? අමෙරිකන්කාරයෝ රචන විට කලිසම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෙත් වෙනවා. එවැනි වහල් තත්ත්වයක සිටින ආණ්ඩුවක් තමයි අද මේ රටේ තිබෙන්නේ.

ඒ නිසා රුපියල් විසිපන් කෝටියක ණය මුදලක් අනුමත කරන විට අපි එකක් හිතේ තබා ගන්නට ඕනෑ. සමාජවාදී රටවල් සමග තිබුණු සම්බන්ධකම් නතර කර අධිරාජ්‍යවාදීන්ට මේ රට පාවා දීමට 1965 දී අධිරාජ්‍යවාදීන්ගේ ආධාර ඇතිව මේ ආණ්ඩුව පිහිටුවීමට මොවුන් කටයුතු කළා; උපක්‍රම යෙදුවා. පොඩි වියට්නාමයත් සමග යුද්ධය ගෙනියන්නට බැරි තත්ත්වයක් තමයි, ඇමරිකාවට උදා වී තිබෙන්නේ. සූවස් ඇලෙන් නැගෙනහිර පැත්තේ ඇති යුද්ධ සේනා සියල්ලම අකුලාගෙන යන්න බ්‍රිතාන්‍යය ලෑස්තියි. එම රටෙන් විදේශ සංචාර සඳහා යන උදවියට දෙන්නේ පවුම් 50 බැගිනුයි. අමෙරිකාවෙන් විදේශ සංචාරය පිණිස යාමේදී මුදල් වියදම් කිරීම පවා තහනම් කර තිබෙනවා. යමෙක් අමෙරිකාවෙන් ලංකාව වැනි රටකට ආවාම ඒ රටේ බැංකුවලින් ඩොලර් මාරු කරන්නට බැහැ. අමෙරිකන් තානාපති කාර්යාලවලට ගොස් ඒවා මාරු කර ගන්නට ඕනෑ. අද අමෙරිකාවේ බංකොලොත් තත්ත්වය මෙයින් පෙනෙනවා. වසරකට ලැබෙන ජාතික ආදායමට වැඩියෙන් ඩොලර් කෝටි 200 ක් පමණ වියදම් වෙනවා.

එවැනි රටවල උපකාර ලබාගෙන ලංකාවේ සමාජවාදී ව්‍යාපාර පවා නැති කිරීමේ පරමාර්ථයෙන් බොරු සිංහයන් හැටියට පෙනී සිටිමින් මේ ආණ්ඩුව කටයුතු කළා, 1965 බලයට ආවායින් පස්සේ. එහෙත් දැන් නම් සමාජවාදී රටවලුත් හොඳය කියා කල්පනා කරනවා. අද අපේ මහලු කර්මාන්ත ඇමතිවරයා රූකඩයක් හැටියට නටන්න යොදවනවා. සමාජවාදී රටවල ඇමතිවරු ගෙන්වා ගැනීමටත් සමාජවාදී රටවලට මෙහෙන් උදවිය පිටත් කර යවන්නටත් මේ උදවිය බිය වී සිටිනවා. අධිරාජ්‍යවාදී හාමුදේලාගේ තර්ජන නිසා සමාජවාදී රටවලට යන්නට එක ඇමතිවරයකුවත් කැමති නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

*மூதவையிலிருந்து வந்த செய்தி*

## MESSAGE FROM THE SENATE

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

There is a Message received from the Senate, which the Clerk of the House will read.

**පහත දැක්වෙන සන්දේශය ලේකම් විසින් කියවන ලදී:**

*செயலதிகாரி பின்வரும் செய்தியை வாசித்தார்:*

*The Clerk read the following Message:*

"සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය මතු පළ වන කෙටුම්පත් පනත සම්මත කළෙන් ඊට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වය ඔවුහු අපේක්ෂා කරති:—

Crown (Liability in Delict)."

## CROWN (LIABILITY IN DELICT) [SENATE]

**කර්මාන්ත හා ධීවර කටයුතු ඇමති ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් එවන ලද පනත් කෙටුම්පත ඉදිරිපත් කෙළේය.**

*கைத்தொழில், கடற்றொழில் அமைச்சர் கௌரவ டீ. பீ. ஆர். குணவர்த்தன மூதவையிலிருந்து வந்த மசோதாவைப் பிரேரித்தார்.*

*The Hon. D. P. R. Gunawardena, Minister of Industries and Fisheries sponsored the Bill sent by the Senate.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය භාණ්ඩාගාර බිල්පත්‍ර ආඥා පනත:

පනත් කෙටුම්පත පළමුවන වර කියවන ලදින්, 1968 පෙබරවාරි 8 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද, නියෝග කරන ලදී.

மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு, 1968 பெப்ரவரி 8 ஆம் தேதி வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படவும் அது அச்சிடப்படவும் கட்டளையிடப்பட்டது.

*The Bill was read the First time and ordered to be read a Second time upon Thursday, 8th February 1968, and to be printed.*

## දේශීය භාණ්ඩාගාර බිල්පත්‍ර ආඥා පනත: සම්මතිය

உள்நாட்டுத் திறைசேரிப் பட்டியல்கள் கட்டளைச் சட்டம்: தீர்மானம்

## LOCAL TREASURY BILLS ORDINANCE—RESOLUTION

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

බිල්පත් මාර්ගයෙන් රුපියල් විසිපත් කෝටියක් ලබාගෙන එම මුදල් යොදවන්නට බලාපොරොත්තු වන්නේ මොන අන්දමේ කටයුතුවලටද? රජයේ ප්‍රතිපත්තිය කීප වතාවක්ම අප ඉදිරියේ පැහැදිලි කර දී තිබෙනවා. ඉඩම් නැත්තවුන්ට ඉඩම් ලබා දීම, රක්ෂා නැත්තවුන්ට රක්ෂා ලබා දීම වැනි ජාතික ව්‍යාපාරවලට යෝග්‍ය වන අන්දමින් කටයුතු කරන බවයි, නිතරම කිව්වේ. එහෙත් එම කටයුතු ඉතාමත් අසතුටුදායක අන්දමින් කෙරීගෙන යන බව කියන්නට සිදු වී තිබෙනවා. මහජනතාවට සිදු වන හිරිහැර කරදර පිළිබඳව කිසිදු අනුකම්පාවක් නොමැතිව කටයුතු කරන බව පෙනෙන්නට තිබෙනවා. විශේෂයෙන් රුපියලේ අගය අඩු කිරීමේදී මේ ආණ්ඩුව ලෝක බැංකුවේ සහ ඇමෙරිකන් ඒකාධිකාරීන්ගේ සංවිධානවලට කීකරු වී වහල් තත්ත්වයකින් කටයුතු කර තිබෙනවා. එසේ හෙයින් මහජනතාවට මුහුණ පාන්නට සිදු වී තිබෙන භයානක තත්ත්වයන් පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොමැතිව හිතුවක්කාර අන්දමට ක්‍රියා කර තිබෙනවා. ඒ පිළිබඳව කියන්නට තිබෙන්නේ අමනුෂ්‍ය තත්ත්වයකින් කටයුතු කරන තත්ත්වයකට මේ ආණ්ඩුව පැමිණ ඇති බවයි.



Advance alienation ක්‍රමය අනුව ජනපදවලට මිනිසුන් යොදවන පිළිවෙළ ගැන කල්පනා කළ යුතුව තිබෙනවා. ඊට සිංහලෙන් කියන්නට නියම වචනයක් නැහැ. "කල් මත්තෙන් කැලෑවට මනුෂ්‍යයන් දැක්කීම" යන්නයි ඒ වෙනුවෙන් කියන්නට තිබෙන්නේ. උඩවලවේ වම් ඉවුරේ කැලෑ ප්‍රදේශයට ගමන් පහසුව නැහැ. ඇළවල් නැහැ. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවුල් 600 කට අක්කර පහ බැගින් දී පදිංචි කළා. එක් අයකුට ඒ අනුව මඩ ඉඩම් අක්කර තුනකුත් ගොඩ ඉඩම් අක්කර දෙකකුත් ලැබෙනවා. ඒ පවුල්වල සංඛ්‍යාව අනුව බලන විට, මහජනතාව තුන් දහසක් පමණ වේ යයි සිතන්නට පුළුවනි. ඒ උදවියට ලියවිල්ලෙන් පොරොන්දුවක් දී තිබෙනවා. නිසි පරිදි වතුර ලබා දෙන තුරු ඒ උදවියට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන පඩිය දෙනවාය කියන එකයි, එම පොරොන්දුව. 1965 දී මෙම ආණ්ඩුව බලයට පත් වුණායින් පස්සේ එම පඩිය බාගයකින් අඩු කළා. ඒ උදවියට වතුර ලැබීම කෙසේ වෙතත්, ඒ පළාතේ ඇළක්වත් ඇත්තේ නැහැ. කල් මත්තෙන් කැලෑවට දක්කු වෙනත් ප්‍රදේශවල මනුෂ්‍යයන්ට බවුසර්වලින් පවා වතුර දුන් බව අප දන්නවා. මේ අයට එවැනි සහනයක්වත් ඇත්තේ නැහැ. එහෙත් ලැබෙන පඩිය බාගයකින් අඩු කළා. ඒ උදවිය විශාල උද්ඝෝෂණයක් කළා, වතුර නැතුව කිසිදු වගාවක් කරන්නට බැරි බව කියමින්. කලින් දුන් පොරොන්දුවලට විරුද්ධව ක්‍රියා කරමින් පඩිය පවා බාගයකින් අඩු කළ බව ඔවුන් ප්‍රකාශ කළා. නමුත් ඒ ගැන කිසිම සැළකිල්ලක් දැක්වූයේ නැහැ. වියදම් අඩු කරන්නට, සහනාධාර වැඩ කටයුතුවලට වියදම් කරන මුදල් අඩු කරන්නට ලෝක බැංකුව මේ ඇමතිවරුන්ට නියෝග කර තිබෙනවා. එමනිසා මහජනතාවට මොනවා වුණත් කමක් නැහැ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දුන් පොරොන්දු කඩ කරන්නට සිද්ධ වුණත් කමක් නැහැ කියා කල්පනා කරන මේ ආණ්ඩුව ඒ අධිරාජ්‍යවාදී හාම්පුතුන් සතුටු කරන්නටම වැඩ කරනවා. අපි දෙකෙන් පංගුවකින් ඒ අයට දෙන සහනාධාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවතා දමුවා නොවේද කියා ඒ හාම්පුතුන්ට පෙන්වන්නට මේ විධියට කටයුතු කරනවා.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பி. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

කොයි කාලයේද ඒක කළේ ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මා ඔය මහල්ලන් කියන ඒවාට ඇහුම්කන් දෙන්නෙ නැහැ. මගේ කථාව මා දිගටම කරගෙන යනවා.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பி. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

තරුණයෙක් කථා කරන්නෙ ; ඉලංදාරියෙක්.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

පසුගිය දෙසැම්බර් දක්වා භාගයක් ගෙවූ පඩිය දැන් තවත් භාගයකින් අඩු කර තිබෙනවා. දී ගෙන ආ භාගයෙනුත් තවත් භාගයක් අඩු කළා. නමුත් මේ ජනපදවල උදවියට වතුරත් නැහැ. තව අවුරුද්දකින් වත් වතුර ලැබේවිද කියා කියන්නට බැහැ. ඇළවල් කපා නැහැ. කොටින්ම එකම ඇළක්වත් නැහැ. එකම පාරක්වත් නැහැ. ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමා මුණගැසුණු නියෝජිත පිරිසක් මේ තත්ත්වය ගැන කරුණු පැහැදිලි කර දුන්නා. ඒ නියෝජිත පිරිස සමග මමත් මාතර ගරු මන්ත්‍රීතුමාත් (බී. වයි. තුඩාවේ මයා.) ඒ සාකච්ඡාවට සහභාගි වුණා. සාකච්ඡාවට සහභාගි වන්නට පළමුවෙන් අප ඒ ප්‍රදේශයට ගිහින් කරුණු හොඳහැටි සොයා බැලුවා. මේ මිනිසුන්ට කරන්නේ මොන තරම් අමානුෂික, දරුණු අපරාධයක් ද යන්න අප ඒ අවස්ථාවේදී පෙන්වා දුන්නා. දුන් පොරොන්දු කඩ කර ඒ අය ගේ පඩිය හතරෙන් පංගුවකට අඩු කර තිබෙනවා. ඉතින් මේ අය ජීවත්වන්නේ කොහොමද? කැලෑවේ ජීවත්වන මේ ජනතාවට, කිසිම රැකීරක්ෂාවක් නැති මේ ජනතාවට සම්පූර්ණ පඩිය ගෙවන්නටය යන ඉල්ලීම ඉදිරිපත් කළාම සභාපතිවරයා කිව්වේ මේ අය පළමුවෙන් පඩියෙන් භාගයක් ලබාගන්නට කැමති වුණා නේද යන්නයි. කොන්දේසි කඩ කර ගෙවූ මුදල, එනම් පඩියෙන් භාගයක් ලබා ගත්තා තමයි. නමුත් ඒ කැමැත්තකින් නොවෙයි. ඉතින් ඒ අවස්ථාවේදී මේ කාරණය පිළිබඳව ඊට වඩා සටන් නොකර දැන් හතරෙන් පංගුවකට අඩු කර තිබෙන මේ මුදල නැවතත් කලින් මෙන් භාගය බැගින්—ජලය ලැබෙන තුරු—ගෙවන්නටය කියා අප ඉල්ලා සිටියා. මේ ප්‍රදේශයේ තිදෙනෙකු වෛද්‍යාධාර ලබා ගන්නට බැරිව මරුමුවට පත්වූ බව මා දන්නවා. පාරවල් නැහැ. හම්බන්තොට හෝ අම්බලන්තොට හෝ ආරෝග්‍යශාලාවට එන්නට නම් මේ උදවියට ගඟෙන් එගොඩ වෙන්නට ඕනෑ. නමුත් ගඟෙන් එගොඩ වෙන්නට ක්‍රමයක් නැතිව වෛද්‍යාධාර කිසිවක් ලබා ගන්නට නොහැකි වූ රෝගීන් තිදෙනෙක් මරුමුවට පත්වුණා. මේ අයට අසාධ්‍ය රෝගයක් සෑදුණේ නැහැ. නමුත් ප්‍රතිකාර නොලැබීම නිසා රෝගය අසාධ්‍ය වී තිදෙනාම මරුමුවට පත්වුණා. [බාධා කිරීමක්] ඔය සිනාසෙන ඇමතිවරු මිනීමරුවෝ. තිදෙනෙකු මරුමුවට පත්වුණා ; එම්නිසා මිනීමැරීමේ චෝදනාවට තමුන්නාන්සේලා වැරදිකරුවනුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think the hon. Member has any right to call a Minister a murderer.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඇමතිවරු මිනීමැරීමේ චෝදනාවට හිමිකරුවනුයි. මේ ආණ්ඩුවේ වැරදි ප්‍රතිපත්ති නිසා කිසිම වෛද්‍යාධාරයක් නොලැබ මිනිසුන් තිදෙනෙකු මැරුණා. ගම්වල සිටි කම්කරුවනුත් ඔවුන්ගේ දරුවනුත් මේ ආකාරයට කැලෑවට ගෙන ගොස් දමා අනාථ කර තිබෙනවා. ඔවුන් සඳහා කිසිම මූලික සහනාධාර වැඩ පිළිවෙළක් යොදා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ආකාරයට ඔවුනට කැලෑවේ සිටින්නට ඉඩ හැරීමෙන් යම් කෙනෙකු මරණයට පත්වෙනවා නම් ඇමති මණ්ඩලය, ආණ්ඩුව ඊට වගකිවයුතුවා පමණක් නොවෙයි මිනීමැරීමේ චෝදනාවට ලක් කරන්නටත් පුළුවන්ය යන්නයි මා කිව්වෙ.

**ගරු ඩී. පී. අතපත්තු මයා.**
*(கௌரவ டி. பீ. அத்தபத்து)*
(The Hon. D. P. Atapattu)

සමහර විට වැරදි බෙහෙතක් අරන් වෙන්නට ඇති.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

වැරදි විධියට ඡන්දය දීල මේ කරගත් විපත්තියයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Shall we get on with the Resolution? At the rate at which the hon. Member is going he will have nothing to speak on in the Budget Debate!

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

Plenty!

මේ ආණ්ඩුව දූෂණවලින් පිරී තිබෙනවා අයවැය වාර්තා ගණනාවක් යටතේ කථා කරන්නට දැනටම කරුණු තිබෙනවා.

ගරු කථානායකතුමනි, උඩ වලවේ ව්‍යාපාරය ගැන බලමු. එහි ජනපදවල පදිංචි කරවූ අයට මූලික මනුෂ්‍ය අයිතිවාසිකම් භුක්ති විඳින්නට පවා කිසිම පිළිවෙළක් යොදා නැහැ. ඒ උදවියගේ නියෝජිත පිරිස් ඇවිත් නිලධාරීන් ඉදිරිපිට කරුණු ඉදිරිපත් කර ඔප්පු කර තිබෙද්දී ඇමතිවරුන් මේවා විහිළු හැටියට සලකනවා. හයසිය ගණනක් පවුල් ජීවත් වන් සිටින ප්‍රදේශයක, 3,000 ක පමණ ජනතාවට අධ්‍යාපන පහසුකම් සලස්වා නැහැ. ඒ අයට සහනාධාර මුදල් ලැබුණු කාලයේදී තාවකාලික පාඨශාලා ගොඩ නැගිල්ලක් තනවා ඒ අයම පඩි ගෙවා ගුරුවරුන් යොදවා ඒ ළමයින්ට අධ්‍යාපනය දීමට සැලැස්සුවා. සෑම දරුවකුටම නොමිලයේ අධ්‍යාපන පහසුකම් සැපයීම ආණ්ඩුවේ මූලික යුතුකමක්. ආණ්ඩුව ඒ යුතුකම ඉෂ්ට කරන්නෙ නැති නිසා ජාතික සංවර්ධන ව්‍යාපාරවල වැඩ කිරීමට—උඩ වලවේ ව්‍යාපාරයේ වැඩ කිරීමට—ඉදිරිපත් වූ ඒ දුප්පත් අහිංසක මිනිසුන් ඒ උදවියගේම වියදමින් මෙපමණ කල් ඒ අධ්‍යාපන කටයුතු කරගෙන ආවා.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

කොහේද ඔය කියන්නෙ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගිහින් අහන්න, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ වැඩ බලන සභාපති වික්ටර් රත්නායක මහත්මයාගෙන්. ඒ සභාපති මහත්මයා ඉදිරිපිට කරුණු ඉදිරිපත් කළාම ඒ මහත්මයා ඒ කරුණු පිළිගත්තා. තමුන්නාන්සේලා කරුණු දන්නෙ නැත්නම් ඒකට මට වග කියන්නට බැහැ. ඇමතිවරුන්ගේ නොදත්කම ගැන මට වග කියන්නට බැහැ. ඒවා මගෙන් අහන්නට එපා. යුතුකම් නොදන්න ඇමතිවරුන් ඉන්නවා නම් ඒ අයට යුතුකම් ඉගැන්වීම මගේ වැඩක් නොවෙයි. මා කියන්නෙ සම්පූර්ණ සත්‍යයක්.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

අසවල් තැන අසවල් ස්කෝලය කැඩී තිබෙනවාය කියා පැහැදිලිව කියන්නකො.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ස්කෝල නැති වීම ගැන පමණක් නොවෙයි, මා කියන්නෙ. ඒ උදවියගේ වියදමින් මෙපමණ කල් ඒ වැඩ කර ගත්තෙ. ඒ චෝදනාව මා මේ ගරු සභාවේ ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේගේ අඥාන කමට, නොදත්කමට, නූගත්කමට මට වගකියන්නට බැහැ. තමුන්නාන්සේට අධ්‍යාපනය දෙන්නට මට පුළුවන්කමක් නැහැ. මාතර සිටින මට මේ කරුණු දැන ගන්නට පුළුවන් නම් තංගල්ලේ සිටින තමුන්නාන්සේට ඊට වඩා හොඳට ඒ කරුණු දැන ගන්නට පුළුවන් වන්නට ඕනෑ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

තමුන්නාන්සෙට වඩා හොඳට දන්න නිසා තමයි, කීවේ නැත කියන්නය කියා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

උඩ වලවේ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

අක්කර 60,000 ක්, 70,000 ක් තියෙන උඩවලවේ ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

තමුන්නාන්සෙට මම ගම්වල නම් පසුව ඉදිරිපත් කරන්නම්. උඩවලවේ ව්‍යාපාරය සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කම්කරුවන් හයසිය ගණනක් කැඳවාගෙන ගොස් පදිංචි කළ ප්‍රදේශයේ. එහෙම කිව්වම තමුන්නාන්සේට දැන ගන්නට පුළුවන්. ගංගානිම්න සංවර්ධන මණ්ඩලයේ වැඩ බලන සභාපති වික්ටර් රත්නායක මහත්මයාගෙන් ටෙලිෆෝන් කර අහන්න, මාතර මන්ත්‍රීත්, අකුරැස්සේ මන්ත්‍රීත් දවස් 3 කට පෙර නියෝජිත පිරිසක් සමග ඇවිත් මේ කරුණු ඉදිරිපත් කළේ නැද්ද, ඒ කරුණු සත්‍යය කියා සභාපති තුමා පිළිගත්තෙ නැද්ද කියා. සභාපතිතුමා වහාම ඒ කරුණු ගැන පරීක්ෂා කරන්නට යනවාය කියා ප්‍රකාශ කළා. මේ දුක්ගැනවිලි බලන්නට අප සමග එන්නය කියා මා ආරාධනය කළා. මා කී දේ ගැන තමුන්නාන්සේ අභියෝග කරනවා නම් මා කී දේ ඇත්තද, නැත්තද කියා සොයා බලන්නට තමුන්නාන්සේට යුතුකමක් තිබෙනවා. මහත්මයකු හැටියට, මනුෂ්‍යයකු හැටියට මේ ගැන වහාම පරීක්ෂා කර මා කී දේ ඇත්ත නම් තමුන්නාන්සේ මගෙන් සමාව ඉල්ලන්නට ඕනෑ, මට අපහාස වන විධියට කථා කිරීම ගැන. ශීලාචාරකමක් දන්නෙ නැත් නම්——

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

ශීලාචාරකම තියෙන්නෙ කා ළඟද කියා දන්නෙ නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු කථානායකතුමනි, අධිරාජ්‍යවාදී හාම්පුතුන් නියෝජනය කරන ලෝක බැංකුව දැන් සමාජසේවා කටයුතුවලට වියදම් කරන මුදල් ප්‍රමාණය විශාල වශයෙන් අඩු කරන්නැයි කියනවා. අලුතින් වෛද්‍යවරුන් බඳවා ගැනීම නොකෙරෙන බව කියමින්, අයවැය ලේඛනයෙන් වෙන් කර තිබුණු මුදල් අස් කළා. මාතර ආරෝග්‍යශාලාවේ අභ්‍යන්තර ලෙඩුන් 800ක් පමණ ඉන්නවා. බාහිර රෝගීන් දහසකට වැඩි සංඛ්‍යාවක් දවස්පතා ප්‍රතිකාර ගැනීමට—බෙහෙත් ගැනීමට—එනවා. අභ්‍යන්තර රෝගීන් සඳහා නේවාසික වෛද්‍යවරුන් හත් දෙනෙක් ඉන්නවා. බාහිර රෝගීන් සඳහා වෛද්‍යවරුන් පස් දෙනෙක් ඉන්නවා. රෝගීන් දහසකට මේ පිරිස ඉතාමත් මදි. අභ්‍යන්තර ලෙඩුන්ට ප්‍රතිකාර කිරීමට සිටි වෛද්‍යවරුන්ගේ සේවය සුමාන දෙකකට පමණ පෙර සම්පූර්ණයෙන්ම අත් හිටුවා ඒ අය සම්පූර්ණයෙන්ම රක්ෂාවෙන් ඉවත් කළා. අවුරුද් දෙන් එහාට පඩි ගෙවන්නට වැඩ පිළිවෙළක් නැතැයි කියා ඒ අය වහාම අස් කරණ නැයි කිව්වා. සාමාන්‍ය රෝගීන් හැපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

යට ආරෝග්‍යශාලාවට ඇතුළු වූ බොහෝ දෙනකුට නියම අන්දමට ප්‍රතිකාර නො ලැබීම නිසා ඔවුන්ගේ තත්ත්වය වඩාත් භයානක අතට වැටුණා. කීප දෙනෙකුට ස්වාශය හැදුණා. ලෙඩුන් බැලීමට පැමිණි නෑදෑයින් පුදුමයට පත් කරමින් මේ රෝගීන්, "අනේ අපට මෙතැන මැරෙන්නට නැර ගෙදරට ගෙන යන්නැ" යි කියා සිටියා. අන්තිමේදී මේ ලෙඩුන් මගේ පෞද්ගලික චිකිත්සාගාරයට ගෙනාවා. ඒ ලෙඩුන් දෙන්නාගේ පණ බේරා ගන්නට පුළුවන් වුණේ කාර් ගාස්තු ගෙවා මගේ චිකිත්සාගාරයට ගෙනෙන්නට පුළුවන් වූ නිසයි.

මේ ආරෝග්‍යශාලාවේ වෛද්‍යවරුන් නැහැ. හත් දෙනකුගේ වැඩ වහාම නැවැත්තුවා. ඒ වෙනුවට වෛද්‍යවරුන් යෙදීම සම්බන්ධයෙන් කටයුතු කළේ නැහැ. වෛද්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ටෙලිපෝන් කර මා මේ ගැන කිව්වා. ගරු ඇමතිතුමාටත් ටෙලිපෝන් කළ නමුත් එතුමා ඒ වේලාවට ගෙදර සිටියේ නැහැ. බාහිර ලෙඩුන්ට ප්‍රතිකාර කරන්නට එපා කියා තිබෙනවා. ලෙඩුන්ට නිවාඩු දෙන්නට පුළුවන් ද? අභ්‍යන්තර ලෙඩුන්ට ප්‍රතිකාර කරන්නැයි නියම කර තිබෙනවා. වෛද්‍යවරුන් දොළොස් දෙනෙක් හිටියා. එයින් පස් දෙනකුට නියෝග කළා අභ්‍යන්තර රෝගීන්ට වෙදකම් කරන ලෙස. පස් දෙනකුට මේ වැඩ කොටස කරන්නට බැහැ. ලෙඩේ හඳුනා ගන්නේවත් නැතිව වෙදකම් කරන්නට බැහැ. ඒ නිසා ඒ කටයුත්ත හරියාකාර කෙරෙන්නේ නැහැ. මිනිසුන් ප්‍රතිකාර ගැනීමට ආරෝග්‍යශාලාවට ඇතුළු වුණාම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ඒ සම්බන්ධයෙන් වගකීමක් පැවරෙනවා. ආරෝග්‍යශාලාවකට ඇතුළු වන රෝගීන්ගේ ජීවිත ගැන විශාල වගකීමක් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට තිබෙනවා. ඔය විධියට හිතුවක්කාර අන්දමට වෛද්‍යවරුන් යෙදෙව්වාම—මුදල් ඉතිරි කිරීම ගැන පමණක් සලකා හිතුවක්කාර අන්දමට වැඩ කළාම—කරදරයට පත් වන්නේ ජනතාවයි.

මාතර ගරු මන්ත්‍රීතුමාත්, මාත් විශාල උද්ඝෝෂණයක් කළ නිසයි මා මේ ගැන කියන්නේ. වගකිවයුතු, ශීලාචාර ආණ්ඩුවක් කටයුතු නො කළ යුතු අන්දමේ [illegible] ආරෝග්‍යශාලාව සම්බන්ධයෙන් ක්‍රියා කළ බවයි චෝදනාවක් හැටියට මා ඉදිරිපත් කරන්නේ. මෙසේ කියන්නට සිදු වීම ගැන මා කණගාටු වෙනවා. පෞද්ගලික වශයෙන් මගේ හිතට බොහොම අමාරුයි මෙසේ කියන්නට වීම ගැන. ජනපදවල පදිංචි රෝගීන්ට සිදු වන හිරිහැර කරදර ආදිය ගැන, අමාරුකම් ගැන, මේ ගරු සභාවේදී කරුණු කියන අවස්ථාවේදී ඒවාට ඇහුම්කන් නොදී කරුණු කියා සිටින මට අභියෝග කරන්නට එනවා. තමන් කරුණු නොදැන සිටීම නිදහසට කරුණ කැයි කල්පනා කරමින් මට අපහාස වන ආකාරයමට කථා කිරීම සුදුසු නැහැ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

ප්‍රශ්නයක් ඇහැව්වාම තරහ ගන්නට වුවමනාවක් තියෙනවයැ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

වැඩ බලන ගරු ඇමතිතුමා කෙරෙහි පෞද්ගලික වශයෙන් මගේ හිතේ කිසිම අමනාපයක් නැහැ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

අපරාදේ ඔය තරමට කේන්ති අරන් හිත නරක් කර ගන්නට එපා. වයසේ හැටියට ඔය තරම් නැගලා එන බව මම දන්නවායැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මේ ආණ්ඩුව අද දූෂණ කටයුතුවලින් පිරී තිබෙනවා. අප නොයෙකුත් අවස්ථාවලදී යම් යම් නිලධාරීන් විසින් කරන ලද දූෂණ ක්‍රියා ගැන කරුණු ඉදිරිපත් කළත් ඒවා ගැන ක්‍රියා කරන්නෙ නැහැ. එහෙම නම් මෙතරම් විශාල මුදලක් අනුමත කිරීමෙන් ඇති වන ප්‍රයෝජනය කුමක්ද කියා ප්‍රශ්න කරන්න කැමතියි. මගේ ප්‍රදේශයේ, කනංකේ ගම්කාර්ය සභාවේ සභාපතිවරයාට විරුද්ධව දූෂණ කටයුතු පිළිබඳව චෝදනා රාශියක් ඉදිරිපත් වුණා. එම චෝදනා ගැන විභාග කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලා චෝදනා පත්‍රත් සමග ඇමතිවරයාට වාර්තාවක් ඉදිරිපත් කර ඇතත් ඒ ගැන මෙතෙක් කිසිවක් කර නැහැ; ඒවා යට පත් කර තිබෙනවා. මේවා ගැන ක්‍රියා කරන්නෙ පළාත් පාලන කොමසාරිස්වරයා නොවෙයි, ඇමතිවරයා. අකුරැස්සේ සුළු නගර සභාවෙ සිදු වුණු ඒ හා සමාන චෝදනා වගයක් ගැන විස්තර වාර්තා හය මාසයක පමණ කාලයක් තිස්සෙ ඇමතිවරයා ළඟ තිබෙනවා. ඒවා ලිපි ගොනුවල තිබෙන්න හරිනවා මිස එසේ වැරදි කරන අය වලුන්ට විරුඬව ක්‍රියා කරන්නෙ නැහැ. මෙන්න මේ අන්දමටයි මහජන කටයුතු සඳහා පුද්ගලයන් යොදවා තිබෙන්නෙ. තමන්ගෙ පක්ෂයට ආධාර කරන නිසා, කරන දූෂණයන් වසා කටයුතු කරන තත්ත්වයකට අද පරිවර්තනය වී තිබෙනවා. මෙයට සාධක වශයෙන් "දවස" පත්‍රයේ පළ වන ප්‍රවෘත්තියක් උපුටා දක්වන්නට කැමතියි. මෙන්න ඊයෙ "දවස" පත්‍රයේ පළ වී ඇති එම ප්‍රවෘත්තිය—

"1963 වර්ෂයේදී පමණ යෝජිත නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු ඇරඹුවා නම් අද වන විට එහි වැඩ කටයුතු බොහෝ දුරට අවසන් කිරීමට ඉඩ තිබුණු බවත්, එදා ඒ ගැන උනන්දුවක් නොවී, අද මහ හයියෙන් කතා කරමින් මහජනතාවගේ සිත් ගැනීමට දඟලන පිරිසගේ ගණන වැඩි වී ඇති බවත්, අකුරැස්සේ කියාඩුවේ පැවති එක්සත් තරුණයින්ගේ රැස්වීමකදී වැලිගම් කෝරළේ ආදායම් පාලක නිලධාරි වී. පී. ඒ. අබේසිංහ මහතා කීය.

"ක්‍යාඩුව එක්සත් තරුණ සමිතිය" නමින් අභිනවයෙන් සමිතියක් පිහිටුවා ගැනීම නිමිත්තෙන් මෙම රැස්වීම පවත්වන ලදී.

මෙහි මුලසුන කනංකේ ගම් සභාපති සුමනදාස විදානගමාච්චි මහතා දැරීය."

අර මා කලින් සඳහන් කළ අන්දමට චෝදනා ලැබූ ගම් සභාපතිවරයායි මෙම රැස්වීමෙ මූලාසනය දරා තිබෙන්නෙ. තව දුරටත් මෙහෙම තිබෙනවා:

"කනංකේ ගම් සභාවේ සභාපති සුමන්දාස විදානගමාච්චි, අකුරැස්ස එ. ජා. පක්ෂ තරුණ සංගමයේ ලේකම් සිරිල් පලිහවඩන, ආර්. කේ. කේ. ඇලඩින් ආර්. කේ. කේ. ආරියවංශ යන මහත්වරු ද කතා කළහ."

මෙහි සඳහන් ආදායම් පාලක නිලධාරි තැන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව තිබුණු කාලයේදී වැලිගම් කෝරළයෙ ආදායම් පාලක නිලධාරියා වශයෙන් සේවය කරමින් සිටියදී දූෂණ කටයුතු සම්බන්ධයෙන් චෝදනා ලබා, එම චෝදනා ඔප්පු වන තත්ත්වයක් ඇති වීම නිසා ඊට දඬුවමක් වශයෙන් වැලිගම් කෝරළයෙන් ඉවත් කළා. ඔහු පදිංචි ගම වැලිගම් කෝරළයයි. මේ ආණ්ඩුව බලයට ආවාට පසුව නැවතත් දූෂණ කටයුතුවල යෙදෙන්න පුළුවන් නිසා, තුන්වැනි ශ්‍රේණියෙ, රදළ අදහස් තිබෙන මෙවැනි නිලධාරියකු ආපසු නැවත වරක් මේ ප්‍රදේශයටම මාරු කර එවා තිබෙනවා. මේ සභාව ගැන මා දන්නවා. එය එක්සත් ජාතික පක්ෂයෙ සංවිධානයක්. ආදායම් පාලක නිලධාරි තැනයි එහි ප්‍රධාන කථිකයා.

ගරු කථානායකතුමනි, මා පෙන්නා දෙන්න උත්සාහ කළේ, මෙතරම් විශාල මුදලක් දිය යුත්තෙ සාධාරණ පාලනයක් තිබෙන ආණ්ඩුවක් තිබෙනවා නම් පමණක් බවයි. මේ අන්දමට දූෂණ කටයුතුවල යෙදෙන නිලධාරීන් සිටිනවා නම්, එක්සත් ජාතික පක්ෂයෙ ශාඛාවල කථා කරන නිලධාරීන් සිටිනවා නම් එබඳු නිලධාරීන් සිටින ආණ්ඩුවට භාණ්ඩාගාර බිල්පත්‍ර මඟින් හෝ මෙපමණ විශාල මුදලක් අනුමත කිරීමේ තේරුම මොකක්ද? මෙවැනි ක්‍රියාවලට අනුබල දීමෙන් මේවායින් තව තවත් දූෂණ වැඩි වෙනවා මිස අඩුවක් වෙන්නෙ නැහැ. නියම පාලනයක් ගෙන යන්න නම් දූෂණයෙන් තොර නිලධාරීන් සිටින්න ඕනෑ. මේ ආදායම් පාලක නිලධාරියා සිටි රැස්වීමකට මෙයට සති තුනකට පමණ පෙර මට සහභාගි වෙන්ට සිද්ධ වුණා. ඒ සභාවෙදි මේ නිලධාරියා ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළා. ඔහු එක්සත් ජාතික පක්ෂයේ අනුගාමිකයකු බව. මා ඒ ගැන එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැහැ, සැලකිල්ලක් දැක්වීමට තරම් දෙයක් නොවන දෙයක් නිසා. මේ වාගේ වගකිව යුතු නිලධාරීන් හිතුවක්කාර අන්දමේ ප්‍රකාශයන් කරනවා නම් මෙබඳු නිලධාරීන්ගෙන් සාධාරණ පාලනයක් බලාපොරොත්තු වන්නෙ කොහොමද? මෙවැනි තත්ත්වයක් අද රටේ පවතින බව පෙන්වා දෙන්නයි මා විශේෂයෙන් මේ අවස්ථාවේදී එම කාරණා ගැන සඳහන් කළේ. මෙයින් අපට හොඳට මැන ගන්ට පුළුවන්, මේ ආණ්ඩුව මුදල් පාලන කටයුතු කරන්නෙ කොහොමද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාය එස්. ඒ. වික්‍රමසිංහ]

කියා. මුදල් නැතිකම නිසා මේ අන්දමට ලියවිල්ලක් මගින් රුපියල් විසි පන් කෝටියක මුදලක් ලබා ගැනීමට කටයුතු කරන මේ ආණ්ඩුව සාමාන්‍ය පාලන කටයුතුවලදී ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන් පිටුපා කටයුතු කිරීමේ යෙදී සිටින ආණ්ඩුවක් නිසා මේ ආණ්ඩුව කෙරෙහි අපට විශ්වාසයක් තබන්ට බැරි බව පෙන්වා දීමටයි, මා විශේෂයෙන් අදහස් කළේ.

සමාජ සේවා කටයුතුවලට වැඩි වැඩියෙන් මුදල් වියදම් කළ යුතු මේ අවධියේ ලෝක බැංකුවේ අණ උඩ සමාජ සේවා කටයුතු වෙනුවෙන් කරන වියදම් අඩු කිරීමේ ප්‍රතිපත්තියක් මේ රජය අනුගමනය කරනව. සෞඛ්‍ය සේවයට අවශ්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීම අඩු කර තිබෙනව. 1933 දිත් මේ වගේ දෙයක් තමයි, කළේ. මම 1930 ට කලින් මහාරෝග්‍යශාලාවේ වෛද්‍යවරයෙකු හැටියට සේවය කළා. වෛද්‍යවරුන් වැඩිය කියා 1930 දී මා ඇතුළු තවත් වෛද්‍යවරුන් 13 දෙනකු අස් කළා. ඒ කාලයේ 1933 වන විට ලංකාවේ කවදාවත් නොතිබුණු තරමට මැලේරියා වසංගතය පැතුරුණා. ඊට හේතුව කුමක්ද? අද කරනව වගේ, ඒ කාලයේ වෛද්‍යවරුන් අඩු කළා. ළමයින්ට වැළදෙන පණු රෝග, මාන්දම් රෝග ආදිය මර්දනය කිරීම සඳහා යොදා තිබුණු සංවිධානය නතර කළා. මැලේරියා රෝගය මර්දනය සඳහා යොදා තිබුණු සංවිධාන සියල්ලම නතර කළා. පරංගි රෝගය වැළැක්වීම සම්බන්ධයෙන් යොදා තිබුණු සංවිධාන සියල්ලම නතර කර දැම්ම. යටත් විජිත ආණ්ඩුව පැවති ඒ කාලයේ මුදල් අතින් රට ප්‍රවේසම් කර ගැනීමට කළේත් ධනපතින්ට බර නොපටවා සමාජ සේවා කටයුතු සඳහා කරන වියදම් කපා හැරීමයි. අද අනුගමනය කරන්නෙත් ඒ ප්‍රතිපත්තියමයි. ගරු සෞඛ්‍ය ඇමතිතුමාට මා මතක් කරන්ට කැමතියි, ඇමතිතුමා ඒ අදහසට කොයි තරම් දුරට එකග නොවුණත් ලක්ෂයකට වඩා ජනතාව අද මැලේරියා වසංගතයෙන් පෙළෙන බව. උතුරුමැද, වයඹ හා නැගෙන හිර ප්‍රදේශවලත්, මිණිපේ ප්‍රදේශයේත් මැලේරියා වසංගතය තදින් පවතිනව. දැන් දකුණු පළාතටත් බෝවීගෙන එනව. හම්බන්තොට දිස්ත්‍රික්කයටත් මාතර දිස්ත්‍රික්කයටත් දැන් මැලේරියාව බෝ වී ගෙන එනව. ජාතික විපත්තියක් ඇති වීමට භයානක තත්ත්වයක් පවතිනව. මදුරුවන් මරන්ට තුවක්කු එල්ල කරන එක ආණ්ඩුවට ඕනෑ වේලාවක කරන්ට පුළුවන්. දැන් වහාම කළ යුතුව තිබෙන්නෙ රෝගය වැළඳුණු උදවියට ප්‍රතිකාර කිරීමයි.

රාජාංගන ප්‍රදේශයේ පදිංචි කරවා සිටින ජනතාවගෙන් විශාල පිරිසකට මැලේරියාව වැළඳී තිබෙන නිසා වතුර තිබුණත් ඔවුන්ට තමන්ගේ වැඩ කටයුතු කර ගන්ට බැරි තත්ත්වයක් උද්ගතව තිබෙනව. රාජාංගන ප්‍රදේශයේ බොහෝ ස්ථානවල වතුර ඇත්තේ නැහැ. වතුර තිබෙන තැන්වලත් වැඩ කර ගන්ට බැරි තත්ත්වයට ජනතාව මැලේරියාවෙන් පෙළෙනව. මා ඇමතිවරුන්ට අභියෝග කරනව, ඒ ප්‍රදේශවලට ගිහින් පරීක්ෂා කර බලන්න කියා. 1934 දී මැලේරියා වසංගතය ඇති වූ කාලයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි මන්ත්‍රීවරුන් අතරින් අද මේ සභාවේ සිටින්නේ මා පමණයි. වෙන කිසිවෙක් නැහැ. ඒ කාලයේ මේ ප්‍රශ්නය මතු කළ අවස්ථාවේ මේ පණ්ඩිතයො වගේ ඩී. එස්. සේනානායක මහත්මයා කිව්ව, මේක "balancing process of nature" හෙවත් සිද්ධ වෙන්ටම තිබෙන දෙයක්ය, මෙය වළක්වන්ට බැරිය කියා. අද තත්ත්වය එදාට වඩා බොහොම වෙනස් අද. ඉස්සරට වඩා ප්‍රත්‍යක්ෂ බෙහෙත් තිබෙනව. පහසුවෙන් මේ රෝගය සුව කරන්ට පුළුවනි. ලෙඩුන්ට අවශ්‍ය ආහාර වන මෝල්ටඩ් මිල්ක් වැනි ගිලන් ආහාරත් සමග——

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விமலா கன்னங்கரா—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

දෙස්තර මහත්වරු මැලේරියාවට මෝල්ටඩ් මිල්ක්ද දෙන්නෙ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr S. A. Wickremasinghe)

මට පාර්ලිමේන්තු ලේකම්වරියට මළ පොතු අකුරුත් උගන්වන්ට සිද්ධ වෙලයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නෙ. මෝල්ටඩ් මිල්ක් කියන ද්‍රව්‍යය
ඕනෑම ගිලන් කෙනෙකුට දෙන්ට තිබෙන
ඉතා වැදගත් ප්‍රධාන ආහාරයක්. මෝල්
ටඩ් මිල්ක් නරක් වෙන්නෙ නැහැ, බෝත
ලය ඕනෑ කාලයක් තියා ගන්න පුළුවන්.
දිය කළායින් පසුව බොහෝ වෙලා තිබ්බත්
ඇඹුල් වෙන්නෙ නැහැ. ඒ වගේම පෝෂ්‍ය
දායක ශක්තියක් තිබෙනව. ඕනෑම ලෙඩෙ
කුට ගිලන් වුණු කෙනෙකුට දෙන මේ රටේ
කවුරුත් දන්න ආහාරයක් තමයි, මෝල්
ටඩ් මිල්ක්. හෝර්ලික්ස් වැනි මෝල්ටඩ්
මිල්ක් වර්ග ගැන කවුරුත් දන්නව. මිනි
සුන්ට දෙන්ට ඕනෑ, පුරුදු ආහාරයක්.
ඒවා තමයි, මිනිසුන් වැදගත් කොට සල
කන්නෙ. නියමිත ආහාරත් සමග එම
බෙහෙත් පෙති 21 දවසට එක බැගින්
ගැනීම පිණිස ලෙඩුන්ට දෙන්නට පුළුවනි.
පළමුවෙන් දෙන පෙති 7, පළමු දවසේ 4
කුත් දෙවැනි දවසේ 3 කුත් ගන්නට
ඕනෑ. ඊළඟට එක එක පෙත්ත දවස් පතා
ගන්න ඕනෑ. සමහර විශේෂඥයන් මේ පිළි
වෙළ ටිකක් වෙනස් කොට දවස් 7 ත්,
10 ත්, 14 ත් රෝගය සුව කර ගැනීමට පිළි
වෙළ යොදා ගන්නවා. කෙසේ වුණත් අන්
තිම දවස් වලදී දිය යුත්තේ දවසට එක
පෙත්ත බැගිනුයි. මෙය ක්විනින් වගේ
බොන්නට අමාරු දෙයක් නොවෙයි ; බිව්
විට වමනය වන දෙයක් නොවෙයි ; ඔළුව
කරකැවීම ඇති කරන බෙහෙතක් නො
වෙයි. මේ තරම් පහසු බෙහෙත් වර්ග තිබි
යදී මේ ආණ්ඩුව අද මොනවාද කරන්නේ?
විදේශීය අධිරාජ්‍යවාදීන්ගේ අණට කීකරු
වීමක් වශයෙන්, මේ රටේ සමාජ සේවා
කටයුතුවලටත් වෙනත් නොයෙක් කටයුතු
වලටත් වෙන් කරන මුදල් ප්‍රමාණයන් අඩු
කිරීමට කටයුතු කරගෙන යනවා. ලෝක
බැංකුවේ විශේෂඥයින් නොයෙක් විධියේ
වාර්තා නිකුත් කරනවා. අද පත්තරයක
එවැනි වාර්තාවක් පළ වී තිබෙනවා. අධි
රාජ්‍යවාදීන්ගේ අණට කීකරු වීමක් වශ
යෙන් ඔවුන්ට හොඳ "රෙකෝඩ්" එකක්
පෙන්වන්නට ඕනෑ නිසා, ඔවුන්ගෙන්
තව තවත් මුදල් ආධාර ලබා ගන්නට මේ
රජය සූදානම් වන නිසා ඔවුන් කියන කියන
විධියට කටයුතු කරගෙන යනවා. නයාට
අඳුකොළ විස වන්නාක් මෙන් එක්සත්
ජාතික පක්ෂයට සමාජවාදී රටවල් විසයි.
"කොන්සෝටියම්" හෙවත් අධිරාජ්‍යවාදී
පස් හවුලේ හොඳ හිත තමන් කෙරෙහි
නැති වේයයි මේ රජය තුළ විශාල බියක්
තිබෙනවා. ඔවුන්ගේ කීම අනුව රුපියලේ
මිළ අඩු කිරීම නිසා මුදල් නැතිවීමෙන්
වුණු හානිය පිරිමසා ගන්නට දැන් රුපි
යල් කෝටි 25 ක බිල්පත් අච්චු ගහන්
නට අපේ කැමැත්ත ඉල්ලා සිටිනවා. මේ
රජය අද කටයුතු කරන්නේ ඔන්න ඔය
විධියට වගකීමෙන් තොරවයි.

"ඇන්ටි මැලේරියා කැම්පේන්"
නමින් කුඩා කාර්යාලයක් තිබෙනවා.
මැලේරියා මර්දන බෙහෙත් සියල්ලක්ම
එන්නේ එතැනටයි. ලංකාවේ ඉස්පිරි
තාලවලට බෙහෙත් බෙදා හරින "සිවිල්
මෙඩිකල් ස්ටෝර්ස්" නම් විශේෂ
ගබඩාවක් තිබෙනවා. එහෙත් මැලේරියා
මර්දන බෙහෙත් එතැනට එන්නේ
නැහැ. ඒවා එන්නේ එක් නිළධාරියකු
පමණක් සිටින "ඇන්ටි මැලේරියා කැම්
පේන්" එකටයි. අවශ්‍ය වන තැන්වලට
එම බෙහෙත් තැපෑලෙන් දන්වා ගෙන්වා
ගන්නට ඕනෑ. යම් තැනකට බෙහෙත්
පෙති 10,000 ක් ඉල්ලුවොත් ලැබෙන්
නේ පෙති 500 යි. එය ලැබුණු විට ඒ
ස්ථානවල සිටින වෛද්‍යවරුන් අධෛර්ය
වෙනවා. එම නිසා ඒ 500 ත් නොදී සිටි
නවා නම් වඩා හොඳයි. බෙහෙත් පෙති
500 ක් ලෙඩුන් 25 කට 30 කට පමණ
දෙන්නට පුළුවන්. එහෙත් ලෙඩුන් එන්
නේ සිය ගණනින්. අනුරාධපුර ප්‍රදේ
ශයේ ජනතාවගෙන් අද සියයට 80 ක්
පමණ මැලේරියා රෝගීන්. ලේ තහඩු
වක් බලා මෙම රෝගය ශරීරයෙහි තිබෙ
නවාද නැද්ද යන වග කියන්නට පුළු
වන් යයි සමහර විශේෂඥයින් කියන
වාලු. තහඩුවට ගන්න ලේ බින්දුවේ
මැලේරියා විෂබීජ තිබුණොත් ඒක කියන්
නට පුළුවනි. නැත්නම් කියන්නට බැහැ.
මහ මුහුදෙන් වතුර බින්දුවක් ගෙන
එය බලා මුහුදෙහි තිබෙන දේවල් සියල්
ලම කියන්නට පුළුවන්ද? ලේ තහඩු
බලා මැලේරියා විෂබීජ තිබෙනවාද නැද්ද
කීමත් ඒ වාගේ වැඩක්. අද උණ
රෝගීන්ගෙන් සියයට 99 ක්ම මැලේරි
යාවෙන් පෙළෙන බව ඔවුන්ගේ ස්වභාව
යෙන්, ලේ නොබලා කියන්නට පුළුවනි.
අද රටේ පවතින මේ තත්ත්වය ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊයේ හෝ අද හෝ ගරු සෞඛ්‍ය ඇමතිවරයාගෙන් එක වචනයක් ප්‍රකාශ වුණාද? ඊයේ ගරු ඇමතිවරයා කිව්වේ මදුරුවන් සමග කරන සටන ගැන පමණයි. අද ලක්ෂ ගණනක් මැලේරියා රෝගීන් මේ රටේ සිටිනවා. ඔවුන් ගැන කිසිවක් කිව්වේ නැහැ. 1934 දී මැලේරියා මර්දනය කෙළේ ඩී.ඩී.ටී. ගහලා නොවෙයි. "සූරිය මල් ව්‍යාපාරයේ" තරුණයින් එකතු වී ස්වේච්ඡා සේවක වැඩ පිළිවෙළක් ඇති කොට ආණ්ඩුවේ නායකත්වය නොමැති හෙයින් ආණ්ඩුවේ ආධාරයත් ලබා ගෙන මුළු රටේම ගොස් ක්විනින් බෙදමින් රෝගීන්ට වෙදකම් කළ නිසයි එදා මැලේරියාව මර්දනය කරන්නට පුළුවන් වුණේ. අප එදා ලෙඩුන්ට මෝල්ටඩ් මිල්ක් පමණක් නොව පරිප්පුත් බෙදා දුන්නා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) "පරිප්පු මහත්තයා" යන නම හැඳුණෙත් ඒ කාලයේදීයි. ඒ මැලේරියා වසංගතය තිබුණු කාලයේ උණ බහිනවාත් සමගම පරිප්පුයි බතුයි දුන්නා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඒ මැලේරියා වසංගතය පැවැති කාලයේ එය මැඩපැවැත්වීමට උනන්දුවෙන් කටයුතු කළ නිසා, පරිප්පු ආදිය මහජනතාවට බෙදා දුන් නිසා එතුමාට නම්බු නාමයක් වශයෙන් "පරිප්පු මහත්මයා" යනුවෙන් ඒ කාලයේ කීවා.

සමාජ සේවා කටයුතු සඳහා වැඩිපුර මුදල් වියදම් කරන්නට එපා යනුවෙන් ලෝක බැංකුව කරන නියමය නොතකා මැලේරියා වසංගතය නතර කිරීම සඳහා කටයුතු කරනවා නම්, එවැනි සමාජ සේවා කටයුතු සඳහා රුපියල් කී කෝටියක් සඳහා අනුමැතිය පැතුවත් අප එය අනුමත කරනවා. එහෙත් ඒ සඳහා සැලැස්මක් තිබෙන්නට ඕනෑ. එහෙත් මේ රජය සංවර්ධන කටයුතු සඳහාය කියමින් මුදල් ලබා ගෙන ආධාර කරන්නේ කාටද? "Corrugated galvanized sheets" හැදීම සඳහා කර්මාන්ත ඇමතිතුමා විදේශීය කොම්පැණි දෙකකට බලය දී තිබෙනවා. එහෙත් වහලවලට ගහන තහඩු හදන්නේ ඒ වාගේ කර්මාන්තශාලාවේ නොවෙයි. වෛතිලිංගම් කොම්පැණියේයි. එවැනි කොම්පැණිවලට ආධාර දීම සඳහා මුදල් ලබා ගැනීම පිණිස මේ විධියට කෝටි 25 ක මුදලකට අනුමැතිය දෙන්නට අපට පුළුවන්ද? මේ රට පාවා දෙමින්, මේ රටේ ආර්ථික බලය විදේශීය කොම්පැණිවලට පවරමින්, තවදුරටත් මේ රට බංකොළොත් කිරීමේ ව්‍යාපාරයකට කැමැති වන්නට අපට පුළුවන්ද? මේ විධියට මුදල් අනුමත කරන්නට නම් සංවර්ධන කටයුතු සඳහා යැයි කියමින් රජය ගෙන යන වැඩ පිළිවෙළ කෙරෙහි අප තුළ විශ්වාසයක් ඇති වන්නට ඕනෑ; අප තුළ එවැනි විශ්වාසයක් ඇති වන ආකාරයට රජය කටයුතු කරන්නට ඕනෑ.

දැනට වෛද්‍ය විද්‍යාලයෙන් සාමාර්ථ්‍යය ලබා පිට වී සිටින සෑම වෛද්‍යවරයකුම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය සඳහා යොදා ගන්නා හැටියට මේ අවස්ථාවේ දී මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා. වසංගත රෝග ඇති වී ලංකාව විශාල විපත්තියකට මුහුණ පාන ලකුණු හැම තැනකම පෙනෙන්නට තිබෙනවා. එම නිසා ලංකාව විශාල භයානක තර්ජනයකට මුහුණ පා සිටිනවා. මැලේරියා වසංගතයෙන් මෙන්ම රටේ ජනතාවගෙන් සෑහෙන කොටසක් මන්ද පෝෂණයෙන් හා පාණ්ඩුවෙන් පෙළෙනවා.

මෙයට මූලික හේතුව මොකක්ද? 1934 දීත් මිනිසුන් මැලේරියාවෙන් පෙළුණා. ඒ සමගම ධනපති කොම්පැණිකාරයන් විසින් තේ, පොල්, රබර් වතු වසා දැමීමේ විපාකයක් වශයෙන් රක්ෂා නැති දහස් ගණනකට හාමතේ ඉන්නට සිදු වුණා. මැලේරියාව බෝ වුණත් සමගම මන්ද පෝෂණයෙන් වඩ වඩාත් දුර්වල වීම හේතුකොටගෙන ඒ බොහෝ දෙනකුගේ අවසානය ළඟා වුණා. එදී නිසා මැලේරියාව පමණක් නොවේය, දුප්පත්කමත් මේ රටින් තුරන් කළ යුතුයි. එහෙත් කලින් ලැබුණු හාල් සේරු දෙකෙන් එකක් කපා දැන් ලැබෙන්නේ එකයි. ඒ වාගේම වෛද්‍ය පහසුකම් අඩු වීම හේතුකොටගෙන භයානක තත්ත්වයක් ඇති වී තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙන මෙවැනි අවස්ථාවක, ලෝක බැංකුවේ අණට කීකරු නොවී සමාජ සේවා කටයුතු සඳහා අවශ්‍ය සෑම වියදමක්ම දරන බවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජය අපට සහතිකයක් දිය යුතුයි. ඒ සඳහා මුදල් ලබා ගැනීම පිණිස ලොකු ධනපතියන්ගෙන් වැඩිපුර ආදායම් බදු ගන්නට පුළුවනි. ඔවුන්ගේ වස්තුව ජනසතු කර මුදල් ලබාගෙන ඒවා සමාජ සේවා කටයුතු සඳහා යොදවන්නට පුළුවනි. ඔවුන්ගෙන් ලබා ගන්නා ආදායම් බද්ද ඒ සඳහා ප්‍රමාණවත් නොවේ නම් ඇත්ත වශයෙන් ඔවුන්ගේ මූලික ධනය පවා යොදවන්නට පුළුවනි. මනුෂ්‍ය ජීවිතය ධනපතියන්ගේ මූලික ධනයට වඩා වටිනවා. අප මෙයට විරුද්ධ වන්නේ රජය හරි ප්‍රතිපත්තියක් ඇතිව කටයුතු නොකරන නිසායි. විවේචනය කරමින් හෝ පසුගිය රජයට මෙවැනි දේවලට අප ඉඩ දුන්නේ පසුගිය රජය සමාජවාදී ප්‍රතිපත්තියක් මත සැහෙන තරම් දුරටවත් කටයුතු කරගෙන ආ නිසයි. එහෙත් මේ රජය ධනපති රාමුවක් අනුව කටයුතු කරන නිසා මෙයට අපේ අනුමැතිය දෙන්නට බැරි බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 2.40

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බිල්පත් මගින් රුපියල් 25 කෝටියක ණයක් ගන්නට යෝජනා කරන අවස්ථාවේදී මට ප්‍රථමයෙන්ම මතක් වන්නේ එදා අප ඒ පැත්තේ වාඩි වී සිටිය දී මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කළ විටෙක වර්තමාන මුදල් ඇමතිතුමාත් වර්තමාන අගමැතිතුමාත් බොහොම තදින් ඒ යෝජනාවට විරුද්ධව කථා කළ ආකාරයයි. මේ විධියේ දේවල් කිරීමෙන් රටේ මුදල්වල අගය දිනෙන් දිනම අඩු වන බවත්, ඒ නිසා මහජනයාගේ ජීවන වියදම වැඩි වන අතර සංවර්ධන කටයුතු අඩපණ වන බවත් එසේ හෙයින් තරයේම විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත් ඒ දෙපොළ එදා ප්‍රකාශ කළා. එදා ඒ විධියට කී මේ දෙපොළ අද නොකැමැත්තෙන් වුවත් මේ වැඩේ කර තිබෙන බව අපට පෙනී යනවා.

ගරු කථානායකතුමනි, මේ මුදල් අවශ්‍යතාව ගැන සඳහන් කරද්දී වැදගත් කරුණු දෙකක් තුනක් ඉදිරිපත් කළ බව මට මතකයි. රුපියලේ අගය අඩු කිරීම නිසා පිටරටින් ගෙන්වන භාණ්ඩවල මිළ වැඩි වන බවත්, ඒ වගේම මෙරට නිෂ්පාදනය වන භාණ්ඩවලද මිළ වැඩි වන බවත්, ඒ සඳහා වැඩි මිළක් නියම කර ඇති බවත්, රජයේ සේවකයන්ට වැඩිපුර වැටුප් ගෙවන්නට සිදුවීමෙන් භාණ්ඩාගාරයට වැඩිපුර මුදලක් වියදම් කරන්නට සිදුව ඇති බවත් මේ කරුණු සලකා රුපියල් 25 කෝටියක භාණ්ඩාගාර බිල්පත්‍ර නිකුත් කිරීමට අවශ්‍යව ඇති බවත් සඳහන් කළා. මේ අවස්ථාවේදී එකක් මතක් කරන්නට කැමතියි. රුපියලේ අගය අඩු කිරීම පිළිබඳ විවාදය පවතින අවස්ථාවේදී රජය විරුද්ධ පාර්ශ්වයටත් මේ රටේ මහජනයාටත් කියා සිටියේ, රුපියලේ අගය අඩු කිරීමෙන් පිටරටින් ගෙන්වන බඩුවල මිළ වැඩි වන නිසා මහජනයාට තරමක අලාභයක් විඳින්නට සිදු වුවත් තේ රබර් පොල් ඇතුළු අප අපනයනය කරන ද්‍රව්‍යවල මිළ වැඩි වන නිසා ලොකු ප්‍රයෝජනයක් සැලසෙන බවයි. අපනයන ද්‍රව්‍යවලට වැඩි මිළක් ලැබීම නිසා එය අපේ ආර්ථික සංවර්ධනයට විශාල රුකුලක් බව ප්‍රකාශ කරන්නට යෙදුණා. එක් පැත්තකින් ඇති වන අලාභයට වඩා අනෙක් පැත්තෙන් ලොකු ලාභයක් ලැබෙන හෙයින් අර අලාභය ගැන කල්පනා කිරීමට වුවමනාවක් නැති බවත්, සතියක් තිස්සේ හොඳින් කල්පනා කර බලා වඩා හොඳ පැත්ත තෝරා ගන්නට තීරණය කළ බවත් එදා ගරු අගමැතිතුමා මෙම ගරු සභාවේදී සඳහන් කළා. එහෙත් වඩා හොඳ පැත්ත මෙම ආණ්ඩුව තෝරා ගත් එක නොවන බව එදා අප පෙන්වා දුන්නා. රුපියලේ අගය අඩු නොකර සිටියා නම් පිටරටින් ගෙන්වන භාණ්ඩවල මිළ අඩු වන නිසා ජනතාවගේ ජීවන වියදම අඩු වන බව අප එදා පෙන්වා දුන්නා. සිදු වන පාඩුවට වඩා ලොකු ලාභයක් ලැබෙන බව ආණ්ඩුව එදා ඉදිරිපත් කළ ප්‍රධාන තර්කයයි. එහෙත් රුපියලේ අගය අඩු කිරීමෙන් ආණ්ඩුව එදා බලාපොරොත්තු වූ විදේශ විනිමය ඉපැයීම වැරදී ගොස් ඇති බව, අපේ තේ, රබර්, පොල් යනාදී අපනයන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ද්‍රව්‍යවලින් බලාපොරොත්තු වූ තරම් විදේශ විනිමයක් උපයා ගන්නට නොලැබී ඇති බව දූන් නම් ආණ්ඩුවට පිළිගන්නට සිදු වී තිබෙනවා.

පොල් සම්බන්ධයෙන් නම් සෑහෙන මිළ නැඟීමක් තිබෙන බව ඇත්තයි. දැනට පොල් හිඟයක් පවතිනවා. මොන ද්‍රව්‍යයක වුවත් හිඟයක් පවතිනවා නම් ඒ ද්‍රව්‍යයේ මිළ වැඩි වීම ස්වාභාවිකයි. දැනට පොල් මිළ වැඩි වුවත් පොල් සුලභව තිබෙන කාලයේදී මෙම මිළ මේ තත්ත්වයෙන්ම පවතී යයි හිතන්නට බැහැ. පසු ගිය කාලයේදී සුළි සුළං ආදී නොයෙකුත් හේතු නිසා පොල් ගස් විශාල ගණනක් විනාශ වුණා. දේශගුණික හේතු නිසාද පොල් පලදාව අඩු වී තිබෙනවා. තත්ත්වය මෙසේ නම් පොල් මිළ වැඩි වී තිබෙන්නේ රුපියලේ අගය අඩු කිරීම නිසා යයි තර්ක කිරීම වැරදියි. කෙසේ වෙතත් තේ සහ රබර් යන අපනයන ද්‍රව්‍ය දෙක සම්බන්ධයෙන් රජය බලාපොරොත්තු වූ කිසිම වාසියක් ලැබී නැහැ. සාමාන්‍ය පාරිභෝගිකයාට, සාමාන්‍ය මහජනයාට, රටේ බැරි මිනිසුන්ට මොනවා වුණත් කමක් නැත, සල්ලි උපදවන තේ රබර් පොල් ආදියෙහි හිමිකාරයන්ට සහනයක් සැලසේවා, කියා එදා කල්පනා කළ රජය එඩිතර පියවරක් අරගෙන රුපියලේ අගය අඩු කළා. එහෙත් ඒ පියවරින් බලාපොරොත්තු වූ ප්‍රතිඵලය ඉටු වුණේ නැහැ. ආණ්ඩුව එදා ගත් ඒ පියවර නිසා අද දේශීය වශයෙනුත් විදේශීය වශයෙනුත් අපේ මුදල් තත්ත්වය පිරිහී තිබෙනවා.

දේශීය වශයෙන් අපේ මුදල් තත්ත්වය පිරිහීමේ හේතුව නිසා තමයි මේ අන්දමට රුපියල් විසිපත් කෝටියක් ණයට ගන්නට සිදු වී තිබෙන්නේ. මේ රජය මේ මුදල් වර්ෂය සඳහා තවත් මුදලක් ඉල්ලා සිටින්නේ අයවැය ලේඛනයෙන් වෙන් කළ මුදල් සියල්ලම වියදම් කරලාද කියා මා ප්‍රශ්න කරනවා. අයවැය ලේඛනයෙන් වෙන් කළ මුදලින් සියයට ගණනක් වියදම් නොකර ඉතිරි කරගන්නය කියා ගරු මුදල් ඇමතිතුමා විසින් අමාත්‍යාංශවලටත් දෙපාර්තමේන්තුවලටත් දැනුම් දී ඉවරයි. අයවැය ලේඛනයෙන් වෙන් කළ මුදල වියදම් කර මදි පාඩුවක් සඳහා යම්කිසි මුදලක් මේ ගරු සභාවෙන් ඉල්ලනවා නම් එහි යුතුකමක් නැත්නම් සාධාරණකමක් තිබෙනවා. එහෙත් අයවැය ලේඛනයෙන් වෙන් කළ මුදලිනුත් සියයට ගණනක් වියදම් කරන්නට එපාය කියා උපදෙස් දී, දැන් කියනවා භාණ්ඩාගාර බිල්පත්‍ර මගින් තවත් රුපියල් 25,00,00,000 ක් ණයට ගන්නට ඕනෑය කියා. එයින් පෙනී යන්නේ ආණ්ඩුව දේශීය වශයෙන් බලාපොරොත්තු වූ ආදායම ඉතාම පහත් තත්ත්වයකට වැටී තිබෙන බවයි. ඒ සමග විදේශීය ආදායමක් රජය බලාපොරොත්තු නොවූ තරම් පහත් තත්ත්වයකට වැටී තිබෙනවා. එසේ නම් අද ආණ්ඩුව ගෙන යන්නේ අමාරුවෙන්ය කියන එක පිළිගන්නට ඕනෑ.

අපේ ආණ්ඩුව පැවැති කාලයේ තමුන්නාන්සේලා මේ පැත්තේ සිටගෙන අපේ මැති ඇමතිවරුන්ට චෝදනා කළා, ඔවුන්ගේ අඥානකමත් අදක්ෂකමත් අදූරදර්ශීභාවයත් නිසා මේ රට ආර්ථික අතින් අමාරු තත්ත්වයකට වැටී තිබෙනවාය, තමුන්නාන්සේලාට බලය දුන්නොත් 1952 ට කලින් මේ රට තිබුණු තත්ත්වයට දේශීය හා විදේශීය ආර්ථික තත්ත්වය දියුණුව කරා ගෙන යනවාය කියා. දේශීය හා විදේශීය ධනය 1952 කලින් තිබුණු තත්ත්වයට නැවතත් නංවනවාය කියා එදා තමුන්නාන්සේලා කයිවාරු ගැහුවා. තමුන්නාන්සේලාගේ එදා තිබුණු ඒ රත්රන් මොල අද පිත්තල බවට පත් වී තිබෙනවා. තමුන්නාන්සේලාට රත්රන් මොල තිබෙනවාය, ලෝකයේ පොහොසත් රටවල් තමුන්නාන්සේලාට ආධාර කරනවාය, ධනපති රටවල් තමුන්නාන්සේලා කෙරෙහි විශ්වාසය තබා තිබෙනවාය, අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චීනය රුසියාව වැනි රටවල් සමග සම්බන්ධකම් පවත්වන නිසා ධනපති රටවල් අපට ආධාර කරන්නේ නැත, එහෙත් තමුන්නාන්සේලාට නම් ඒ රටවලින් ආධාර ගන්නට පුළුවන්ය, යනාදී වශයෙන් තමුන්නාන්සේලා එදා කයිවාරු ගැසූ තමුත් අද ඒ කයිවාරු නතර කරගෙන සිටිනවා.

කෝ ඒ ආධාර දෙනවාය කී රටවල් ? රත්රන් මොල පාවිච්චි කර ඉපයූ මුදල් කෝ ? තමුන්නාන්සේලා විදේශ ධනය ඉපැයූ ආකාරය නිසා දැන් විදේශ ධනය පහළ බැස තිබෙනවා නේද ? එසේ නම් තමුන්නාන්සේලා බලයට පත් වන්නට ඕනෑකම නිසා මොනවා හෝ කියා මහ ජනතාව රැවැට්ටුවා නේද ? ඇත්ත වශයෙන්ම සත්‍යය වසන් කළා නේද ? මේ ආණ්ඩුවේ සිටින මැති ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් පමණක් අමාරුවේ වැටුණා නම් කමක් නැහැ. තමුන්නාන්සේලා මේ රටේ සිටින මුළු මහත් ජනතාවම අමාරුවේ දැම්මා නේද ? අද මේ තත්ත්වයට පත් වී සිටින්නේ තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රශ්න විසඳීමේ ක්‍රියා මාර්ගයේ වරද නිසයි. අද දේශීය වශයෙනුත් විදේශීය වශයෙනුත් මේ තරම් පහත් ආර්ථික තත්ත්වයකට වැටී සිටින්නේ රජයේ ආර්ථික ප්‍රතිපත්තිවල, එහි මූලික පදනම්වල, වරද නිසාය කියා චෝදනා කරන්නට අපට සිදු වී තිබෙනවා. මේ ආණ්ඩුව පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී හැම චෝදනාවක්ම එල්ල කළේ කලින් තිබුණු ආණ්ඩුවටයි. එහෙත් දැන් මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ පසුගිය අවුරුදු තුන තිස්සේ තමුන්නාන්සේලා අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ වරද නිසයි. එහෙනම් අවුරුදු ගණනාවක් අනුන්ට දොස් කී කෙනෙක් හැටියට තමන්ගේ වරද පෙන්වා දුන් විගසම ඉල්ලා අස් වී තමාගේ ආර්ථික ප්‍රතිපත්තියට වඩා හොඳ ආර්ථික ප්‍රතිපත්තියක් ඇති කරන්නට පුළුවන් කෙනකුට ඉඩ දී අයින් වෙන්නට ගරු මුදල් ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා. කෝච්චියක් පෙරළුණු වෙලාවෙත් එක රටක ඇමතිවරයකු ඉල්ලා අස් වී තිබෙනවා. රට ආර්ථික වශයෙන් අමාරුවට පත් වී තිබෙන නිසා, තමුන්නාන්සේලාට රට පාලනය කරගෙන යන්නට බැරි නිසා දැන් භාණ්ඩාගාර බිල් පත්‍ර වලින් ණය ඉල්ලනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

තමුන්නාන්සේලා කී සැරයක් ඉල්ලුවද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේලා ඒක වැරදියි කිව්වෙ නැද්ද ? දැන් ඒක හරිය කියන්නෙ කොහොමද ? යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) හෝ ඊට කලින් සිටි මුදල් ඇමතිවරයකු හෝ කරන විට එය වැරදියි ; තමුන්නාන්සේ කරන විට එය හරි. මොකක්ද මේකෙ තේරුම ? ඒක මූලික වශයෙන් වැරද්දක් නම් කව්රුන් කළත් වැරදියි. තමුන්නාන්සේ හරි නම් ඒගොල්ලොත් හරි. කටින් පමණක් බුදු වෙලා නැහැ. ක්‍රියාවෙන් බුදු වන්නට ඕනෑ. මාත් බුදු හාමුදුරුවො කියා කෙනකුට කියන්නට පුළුවන්. එහෙත් එසේ කියන්නට මානසික වශයෙනුත් ඒ තත්ත්වයට ඇවිත් තියෙන්නට ඕනෑ. ශාරීරික වශයෙනුත් ඒ තත්ත්වයට ඇවිත් තියෙන්නට ඕනෑ. අහසින් ගිහින් පෙන්වන්නට පුළුවන් වන්නට ඕනෑ. යමා මහ පෙළහර කර පෙන්වන්නට පුළුවන් වන්නට ඕනෑ. කව්රුන් මේ රට ආණ්ඩු කළත් ඒ ආණ්ඩු කරන උදවියගේ අදූරදර්ශී භාවය නිසා අදක්ෂ භාවය නිසා මේ රටේ කෝටි ගණනක් ජනතාව අමාරුවේ දමන්නට ඉඩ දෙන්නට බැහැ. අසවලා හොඳය, අසවලා නරකය කියා අප කියන්නෙ නැහැ. කාගේ හෝ අදක්ෂ භාවය සහ අදූරදර්ශී භාවය නිසා ජනතාව අමාරුවේ දැමීම වැරදියි. ජනතාවයි, මේවායින් දඬුවම් විඳින්නේ. රුපියලේ මිල අඩු කිරීම හරි ක්‍රියා මාර්ගයය කියා, තේවලින්, රබර්වලින්, පොල්වලින් සහ අනික් අපනයන ද්‍රව්‍ය වලින් වැඩි මුදලක් ලැබෙනවය කියා ඒ පියවර තමුන්නාන්සේලා ගත්තා. එහෙත් ඒ වැඩි මුදල ලැබුනෙ නැහැ. අනික් පැත්


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

තෙන් ජීවන වියදම තවත් වැඩි කරමින් මහජනයා පිට බර පැටෙව්වා. පෙබරවාරි මාසය වන විට බඩු මිල තවත් නගිනවා. ඊයේ පෙරේදා "දවස" පත්‍රයක තිබුණා, පෙබරවාරි මාසයේ සිට තවත් බඩු වර්ග 18 ක නැත්නම් 25 ක මිල වැඩි වෙනවාය කියා. මේ රටට ආනයනය කරන සෑම බඩුවකම මිල නගිනවා. මේකට හේතුව රුපියලේ මිල අඩු කිරීමයි. රටේ ජනතාවට ජීවත් වීමට බැරි තත්ත්වයකට ජීවන වියදම වැඩි කිරීමට සැලැස්සුවේ රුපියලේ මිල අඩු කිරීමෙන්. එක්කෝ තමුන්නාන්සේලා පාරිභෝගිකයාගේ බඩු ටිකේ මිල අඩු වන්නට, රුපියලේ මිල එසේම තියෙන්නට ඉඩ දෙන්නට ඕනෑ. එසේ නැත්නම් රුපියලේ මිල අඩු කර තේ, රබර්, පොල් වලට ලැබෙන ආදායම වැඩි කර ගන්නට ඕනෑ. අර පැත්තෙනුත් ඒ මිනිසුන්ට ගැහුවා. මේ පැත්තෙනුත් ලැබුණු දෙයක් නැහැ. තමුන්නාන්සේලා අදූරදර්ශීය කියන්නෙ ඒ නිසයි. තමුන්නාන්සේලට ඒක පෙනුනෙ නැහැ. ඒක දකින්නට තමුන්නාන්සේලට ශක්තියක් තිබුනෙ නැහැ. කොයි තැනැත්තා විවේචනය කළත්, මොන පාට කෙනකු විවේචනය කළත් විවේචනය හරි නම් තමුන්නාන්සේලාට එය පිළිගන්නට පුළුවන් වන්නට ඕනෑ. රජයක් විනාශකාරී විවේචන පිළිගන්නට වුවමනා නැහැ. එහෙත් ඒ විවේචනය යහපත් විවේචනයක් නම්, සකස් කිරීමේ විවේචනයක් නම්, හරි මාර්ගය පෙන්වා දීමේ විවේචනයක් නම් විවේචනය කරන තැනැත්තාගේ පාට දිහා නොබලා එය පිළිගන්නට රජයට පුළුවන් වන්නට ඕනෑ. රජය කාගේවත් පෞද්ගලික දෙයක් නොවෙයි. රජය ජනතාවගේ දෙයක්. ජනතාව අමාරුවේ නොහෙළා ජනතාවගේ ප්‍රශ්න විසඳන්නට රජයකට බැරි නම් ජනතාව තව තවත් අමාරුවට පත් කරන්නෙ නැතිව—ජනතාව කබලෙන් ලිපට දමන්නේ නැතිව—කරන්නට පුළුවන් කෙනකු පත් කර ගන්නට මහජනතාවට ඉඩ දීමයි, යුක්තිය, සාධාරණත්වය.

ගරු කථානායකතුමනි, අදක්ෂතාවත්, දුර්වලකමත් නිසා මේ තත්ත්වයට පත් වූ බව මා පෙන්වා දුන්නා. අවංකව දූෂණයෙන් තොරව, මේ රටේ සංවර්ධනය සඳහා මුදල් යොදවනවා නම් ඒ ප්‍රශ්න සියල්ලම අමතක කර දමා මේ මුදල දෙන්නට අපේ අත් ඔසවන්නට අපට පුළුවනි. එහෙත් ඇත්ත වශයෙන්ම මුදල් වියදම් කරන්නේ මොන විධියටද? මේ රටේ මහජන මුදල් වියදම් කරන්නේ පක්ෂපාත අන්දමටයි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් විසින් නියෝජනය කරනු ලබන කොට්ඨාශවල ඇති පාරක අද යන්නට පුළුවන්කමක් නැහැ. විරුද්ධ පාර්ශ්වයේ ආසනවලට මුදල් දෙන්නේ නැහැ, පාරවල් වැඩි දියුණු කරනන්ට. මා කියන කාරණය නිදර්ශන සහිතව මම ඔප්පු කරනන්ම්.

ලංකා ගමනාගමන මණ්ඩලයේ මහනුවර උතුරු ඩිපෝවේ අධිකාරිතුමා එවූ ලියමනක් මා ළඟ තිබෙනවා. සමහර විට ගරු ඇමතිතුමා මේ ගැන නොදන්නවා වෙන්නට පුළුවනි. එතුමා යටතේ තිබෙන ලං.ග.ම. මහනුවර උතුරු ඩිපෝවේ කළමනාකාරතුමා කියන්නේ වලපනේ ප්‍රධාන පාරවල් දෙකේම බස් රථ ගමනාගමනය වහාම නවත්වන බවයි. ඇයි? අවුරුදු දෙකකින් නොවෙයි, තුනකින්ම පාරවල් හදා නැහැ. අවුරුදුපතා පාරවල් නඩත්තු කරන්නට ඕනෑ. වළවල් ගොඩ කරන්නට ඕනෑ. පාරවලට තාර දමන්නට ඕනෑ. පාරවලට ගල් දමන්නට ඕනෑ. නිතර නිතර පාරවල් අලුත්වැඩියා කරන්නට ඕනෑ. ඒවා හරියාකාර සිද්ධ වන්නේ නැහැ. දැන් ඒ නිසා පාරවල් අබලන් තත්ත්වයකයි තිබෙන්නේ. රුපියල් කෝටි ගණන් වියදම් කර තැනූ පාරවල් අවුරුද්දෙන් දෙකෙන් විශාල වශයෙන් විනාශ වී ගොස් තිබෙනවා. සේදී ගොස් තිබෙනවා. වළවල් හෑරී ගොස් තිබෙනවා. නොයෙක් විධියට අබලන් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවායේ බස් ගමනාගමනය කිරීම සම්පූර්ණයෙන්ම අවදානම් බවයි නිලධාරීන් කියන්නේ.

මහනුවර සිට රාගලට යන පාර හැතැප්ම 48යි. මහනුවර සිට උඩපුස්සැල්ලාවට යන පාර හැතැප්ම 52යි. විශාල වශයෙන් ජනගහනයක් ඇති මේ ප්‍රදේශයේ පාරවල් අබලන් වීම විශාල කරදරයකට හේතු වෙනවා. හඟුරන්කෙත වැනි ප්‍රදේශවල පාරවල් හොඳට තිබෙනවා. වලපනේ ඒවා අබලන් වීම නිසා විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්නට වෙනවා. සේදී යාම නිසා අබලන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වූ තැන් හදන්නේ නැහැ. වළවල් ගොඩ කරන්නේ නැහැ. නිසි වෙලාවට ගල් ටික දමන්නේ නැහැ. ඔන්න පාලනයේ අදක්ෂතාවේ ප්‍රතිඵලය. මේ තරම් අදක්ෂ අන්දමට, දූෂිත අන්දමට පාලනය කරගෙන යන ගමන් අපට කියන්නේ රුපියල් කෝටි විසිපහක් වැය කරන්නට අනුමැතිය දෙන ලෙසයි. තවත් විසිපත් කෝටියක් දෙන්නැයි අපට කියනවා. මොනවාටද ඔය තරම් මුදල් දෙන්නේ ? 4 ශ්‍රී කාර් ගෙන්වන්නටද? 5 ශ්‍රී ජීප් ගෙන්වන්නටද? අලුත් බෙනස් ලොරි ගෙන්වන්නටද? ධනපතියන්ගේ සුඛ විහරණය සඳහා, ධනපතියන්ගෙ සුඛෝපභෝගී ජීවිත සඳහා තව තවත් අවශ්‍ය දේවල් ගෙන්වන්නටද ? පොදු මහා ජනතාව තව තවත් දුක්බර ජීවිතයට හෙළන්නටද මේ මුදල් ඉල්ලන්නේ ? ඒකයි අපට මේ ආණ්ඩුවෙන් අහන්නට තිබෙන ප්‍රශ්නය. කොහොමද, දැන් ජීවන වියදම් ප්‍රශ්නය එහෙම විසඳලා තිබෙනවාද ? ඉහළ යන ජීවන වියදම පහළ දමන්නට කටයුතු කර අවසන් වී තිබෙනවාද ? 1965 මහා මැතිවරණ කාලයේදී කිව්වේ කොහොමද ? අපට බලය දුන්නොත් ඇසිල්ලෙකින්, නිමේෂයකින්, බලාගෙන සිටිද්දී, ඇලඩින්ගේ පුදුම පහන දල්වා හැම ප්‍රශ්නයක්ම විසඳන්නට, ජීවන වියදම පහළ බස්සන්නට පුළුවනැයි කිව්වේ නැද්ද ? දැන් ඒක බස්සලා ඉවරද ? බැස්සුවෙ කොහාටද ? මහ පාරටද නැත්නම් වෙන කොහාටද ?

මා කරුණු ඉදිරිපත් කරමින් සිටියේ මා නියෝජනය කරන ප්‍රදේශයේ පාරවල තත්ත්වය ගැනයි. බස්රථ ගමනාගමනයට යෝග්‍ය පාරවල් එහි නැහැ. ලං.ග.ම. මහනුවර ඩිපෝවේ අධිකාරීතුමා බස් ධාවනය නවත්වන්නට යනවා. නිල්දණ්ඩාහින්න, උඩපුස්සැල්ලාව, මහනුවර, රාගල බස් ගමනාගමනයට කුමක් සිදු වේවිද ? ආණ්ඩුවේ සංවර්ධන වැඩ පිළිවෙළ ඇණ හිටලා.

උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ මුදල් වෙන් කළා. ඒ මුදල් යොදන්නේ කොහොමද ? තමුන්නාන්සේ ඒ ගැන දැන ගත්තොත් පුදුම වේවි. උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ වෙන් කරන ලද මුදලින් දැන් සංවර්ධනය කරන්නේ නගරවල් බව ඇසූ වාම තමුන්නාන්සේ පුදුම වේවි. මහනුවර බූවැලිකඩ, ශාන්ත සිල්වෙස්ටර්, මහාමායා, මාවිල්බඩ, යන මේ ඉස්කෝලවලට දෙලක්ෂයක් වියදම් කරන අතර වලපනේට ශත පහක්වත් වියදම් නොකළ බව ඉතා කනගාටුවෙන් කියනවා. උඩරට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව බලන්න. එහි දුර්වල තැන් මේවාය, ශක්තිමත් කළ යුතු තැන් මේවාය, වැඩි දියුණු කළ යුත්තේ මේ මේ දේවල්ය, යනාදී වශයෙන් සවිස්තරව යෝජනා කර තිබෙනවා. ඒවා වෙනුවෙන් නොවෙයි මුදල් දෙන්නේ. නගර සංවර්ධනයටයි ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයේ මුදල් යොදන්නේ. උඩරට ගැමි සංවර්ධන යෝජනා ක්‍රමය යනුවෙන් බෝඩ් ගහලා තිබුණත්, කෙරෙන්නේ නගර සංවර්ධනයයි. උඩුනුවර, යටිනුවර, සෙංකඩගල, මහනුවර, වැනි ප්‍රදේශවල පාරවල් දියුණු කරනවා. අලුතින් පාරවල් හදනවා. මේ ලෝකය ඇති වූ දා සිට මිනිසුන් පයින් යන එන වලපනේ, මිණිපේ වැනි ප්‍රදේශවල තව දුරටත් හැතැප්ම විසිපහ-තිහ ආදි වශයෙන් පයින්ම යනවා. අවුරුදුපතා පාරවල් හදන්නට, ඒවාට මුදල් දෙන්නට, මේ ආණ්ඩුවට බැහැ. මේ ආණ්ඩුව ඒ තරමට අදක්ෂයි. මේ අන්දමට සංවර්ධන කටයුතු කරන්නටද මෙම ආණ්ඩුව මහජනයතාවගෙන් සල්ලි ඉල්ලන්නේ ? අපට බැහැ, මේවාට එකඟව අත ඔසවන්න. ගොළුවන් බිහිරන් වාගේ හැම දේකටම අත උස්සන්න අපට බැහැ. උඩරට ගැමි කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන පාරවල් කීපයකුත් තිබෙනවා. පහල බදුලු පාර ගැන මා සඳහන් කරන්නට කැමතියි. මේ පාර හැදුවාම මහනුවර සිට බදුල්ල දක්වා දුර ප්‍රමාණය සැතැපුම් 48 ක් වෙනවා. එම පාර කැපීම මේ ආණ්ඩුව බලයට පත් වූවා සින් පසු අත්හිටෙව්වා. ඒ පාර කැපුවා නම් සැතපුම් 36කින් ගමන කෙටි වෙනවා. තැනිතලා බිමක් හරහා ගමන් කරන්නට තිබෙන ඉතා හොඳ පාරක් කැපීම අත්හිටෙව්වා. ඕකද සංවර්ධනය ? මගේ කොට්ඨාශයේ තිබෙන ගැමි සංවර්ධන වැඩ පිළිවෙල යටතේ පාරවල් කැපෙන්නේ ගොළුබෙලි ගමනිනුයි. අවුරුද්දකට සැතපුම් කාලයි කැපෙන්නේ. තත්ත්වය ඔහොමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

සෞඛ්‍ය තත්ත්වය ගැන බැලුවත් කියන්නට තිබෙන්නේ ඒකයි. අවාසනාවකට මෙන් වලපනේ ආසනයට පසුගිය කාලයේදී නරක ග්‍රහයකු ලබා තිබුනාය කියා සෞඛ්‍ය ඇමතිතුමා කියනවා. උන්නැහේ තමයි, ඒ ග්‍රහයා. 1965 න් පසු පැමිණි අවාසනාවන්ත ග්‍රහයා නැතිනම් සෞඛ්‍ය කෙහෙතා තමයි, සෞඛ්‍ය ඇමතිවරයා. මගේ ආසනයේ තිබෙන දිස්ත්‍රික් වෛද්‍ය ආරෝග්‍යශාලාව උඩපුස්සැල්ලාව ආරෝග්‍යශාලාව පමණයි. එහාට දොස්තර කෙනෙක් අවුරුදු 3කින් නැහැ. කවදා දොස්තර කෙනෙක් දෙන්නට හැකිවේ දැයි උන්නැහේට කියන්නට බැරිලු. සල්ලි නැතිලු. ඒ අතරතුරේ සිටින උදවියත් අස් කරනවා. දිස්ත්‍රික් වෛද්‍ය රෝහලකට තිබෙන්නේ, උඩපුස්සැල්ලාව රෝහල පමණයි. ඒකට ඉන්නේ ඇපොතිකරි වරයකු පමණයි. අකුරුස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කිව්වා වාගේ ලෙඩුන් මරනවා. ඇපොතිකරි කෙනෙක් කොහොමද ලෙඩක් ගැන හරියාකාර දන්නේ? එවැනි කෙනෙක් කොහොමද, ලෙඩුන් පරීක්ෂා කරන්නේ? ඒ අතරතුරේ ගරු අගමැතිතුමා විශාල පෙරහැරකින් ගොස්—ඒ පෙරහැරට පොලීසියෙන් 400 ක් පමණ ගියා—මුල් ගලක් තබා ආවා. දැන් ඒ මුල් ගල එතැන පැලවෙනවා.

මුල්හල්කැලේ ආරෝග්‍ය ශාලාවේ බාහිර රෝගීන්ගේ අංශයක් තිබුණා. ඒක හිටපු ගමන්ම කඩා වැටුණා. සෞඛ්‍ය ඇමතිතුමා හෝ එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමිය හෝ ප්‍රකාශ කළා, 1965 මුදල් වර්ෂයේදීම එහි කටයුතු පටන් ගන්නවාය කියා. [බාධා කිරීමක්] ඒ කිව්ව අන්දමටම කෙරුවා. ගරු අගමැතිතුමා ගොස් මුල් ගල් තබා ආවා. දැන් බාහිර රෝගීන්ගේ අංශය තමයි, ඒ මුල්ගල. "ගරු ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමා විසින් මේ මුල්ගල තබන ලදී." යනුවෙන් එහි සඳහන් වෙනවා. දැන් බෙහෙත් ගෙනයාමට එන අයට බෝතල් රැගෙන අවුත් ඒ මුල් ගලේ අතුල්ලා වතුර වත්කරලා ඒවා දිය කරලා බොන්න වෙනවා. ඇයි මේ අන්දමට රට රවටන්නේ කියා මා අහනවා. රටේ ජනතාවගේ සල්ලි සාධාරණ විධියට නොබෙදන්නේ මන්දැයි මා අහනවා. වලපනේ ජනතාව තෝරා එව්වේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු වන නිසා ඒ උදවියට අවශ්‍ය බෙහෙත් නැහැ, දොස්තරවරු නැහැ, පාරවල් නැහැ. මේකද ප්‍රජාතන්ත්‍රවාදය?

ගරු අධ්‍යාපන ඇමතිතුමා 1965 දී පාසල් ගොඩනැගිලි ගැන කිව්වේ කොහොමද? "තමුන්නාන්සේලා මෙන්න මෙහෙමයි, කරලා තියෙන්නේ; කෑගල්ලට මෙච්චරයි, වලපනේට මෙච්චරයි, අසුවල් අසුවල් ස්ථානයට මෙච්චරයි" යනුවෙන් පෙන්නුම් කළා. එහෙම කිව්වාට මොකද, 1965 සිට අද වන තුරු වලපනේ ආසනයට පාඨශාලා ගොඩනැගිලි සඳහා ශතයක්වත් වියදම් කර නැහැ. ඒ බව මම චෝදනාවක් වශයෙන් මෙම සභාව ඉදිරියෙහි ප්‍රකාශ කර සිටිනවා. අපේ දරුවන්ගෙන් ද පලිගන්නට යන්නේ? ගුරුවරුන්ගෙන් පලිගත් එක වෙනම ප්‍රශ්නයක්. දරුවන්ගෙන් පලිගන්නේ ඇයි? අධ්‍යාපන ඇමතිතුමාට දැන් ටික ටික තේරුම් ගොස් තිබෙන බව පෙනෙනවා. ඒ ගැන සන්තෝෂයි. එතුමා ඉස්සර තරම් දැන් කඩා බිඳගෙන යන්නේ නැහැ. එතුමාගේ ජීවිතයත්, මේ රටේ සමාජ ජීවිතයත්, මේ ආණ්ඩුව අවුරුදු තුනක් තිස්සේ ගෙන ගිය වැඩපිළිවෙළත් යන මේ කාරණා හරියාකාර එතුමා තේරුම් ගත්තොත් මා දන්නවා උන්නැහේ ඔතන ඉන්නේ නැති බව. එතුමාට එතකොට ඔතන ඉන්නට බැහැ. ඒකයි තත්ත්වය. අපට වුවමනා කරන්නේ පුද්ගලයින් ආරක්ෂා කිරීම නොවෙයි. අපට වුවමනා කරන්නේ—මේ රටේ කුමන ආණ්ඩුවක් තිබුණත්—මේ රටේ සංවර්ධන වැඩ ඉදිරියට ගෙන යන්නටයි. මේ රටේ ජාතියේ අනාගත පරම්පරාවට, මේ රටේ ළදරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබමින් ඉදිරියට යන්නට අවස්ථාවක් තිබෙන්නට ඕනෑ. සමහර උදවිය ඔය ඉස්සරහ පෙළේ සිටින උදවිය, අප පමණයි මේ රට ආණ්ඩු කරන්නට ඕනෑ, අප මළාට පසු අපේ කොල්ලන්ට පමණයි මේවා අයිති වෙන්නට ඕනෑය කියා කල්පනා කරනවා නම් අන්න ඒ රදළ ප්‍රතිපත්තියට—කොයි පැත්තේ වුවත්—අප තදින්ම විරුද්ධත්වය ප්‍රකාශ කළ යුතුයි. එම නිසා අපි අහනවා, මෙහෙමද සංවර්ධනය කරන්නෙ කියා. කුමන පක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යකට අයිති වුණත් මන්ත්‍රීවරයකු කරන්නේ ඉතාම උසස් පරිත්‍යාගශීලී සේවයක්. මේ සේවයෙන් මුදල් හම්බ කරන්නට පුළුවන් කොයි අවංක මන්ත්‍රීවරයාටද? මේ ලැබෙන මුදලින් මාසයක් ජීවත් වෙන්නට පුළුවන් කොයි අවංක මන්ත්‍රීවරයාටද? මේ මන්ත්‍රීකම නොලැබුණු දවසට හිටපු ඇමතිවරයකු වන සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට මෙන් මේ පාර්ලිමේන්තුවෙන් පිං පඩියක් ඉල්ලන්නට සිද්ධ නොවෙන්නේ කොයි අවංක මන්ත්‍රීවරයාටද? ඔව්, සමහර උදවියට මුදල් තිබෙනවා; මුදල් ලැබෙන මාර්ග තිබෙනවා. මේක නැතත් කමක් නැහැ කියා ඒ අය කියන්නට පුළුවනි. ජනප්‍රිය වෙන්නට එහෙම කියන අයත් ඉන්නට පුළුවනි. ඒවාගේම වෙනත් හේතුන් නිසා එහෙම කියන අයත් ඉන්නට පුළුවනි. නමුත් අවංකව කල්පනා කර බැලුවොත් මන්ත්‍රීවරයකුට මේ දෙන දීමනාවෙන් මාසයක් ජීවත්වෙන්නට හැකිද? මේ රටේ රජයේ සේවකයන් දෙස බලන්න. තමන් සංවර්ධනය කරන්නටය කියා මන්ත්‍රීවරයා කියනවා නම් ඒක වැරදියි. නමුත් කිසිම මන්ත්‍රීවරයකු එහෙම කියන්නේ නැහැ. මන්ත්‍රීවරු, මේ බෙරිහන් දෙන්නේ, විවේචනය කරන්නේ රට සංවර්ධනය කරන්නටයි; අනාගත පරම්පරාව සංවර්ධනය කරන්නටයි; නොදියුණු ප්‍රදේශ සංවර්ධනය කරන්නටයි. එම නිසා අප කියන මේ කරුණුවලට ඇහුම්කන් දෙන්නට ඕනෑ. මේවා කෙරෙන්නට ඕනෑ.

ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙන්නට යන වාය, එම නිසා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගන්නට ආණ්ඩුවක් පිහිටුවන්නට අපට බලය දෙන්නටය කියා තමුන්නාන්සේලා කිව්වා. නමුත් දැන් තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසන නිකම් හිස් සොහොන් පිට්ටනි බවට පත් කර තිබෙනවා. තමුන්නාන්සේලාගෙ පන්දම්කාරයින්ට නම් තමුන්නාන්සේලා හොඳට උදව් කරනවා. කොයි තරම් දූෂණ පිළිවෙළට තමුන්නාන්සේලා කට යුතු කර තිබෙනවාද යන්න මා හොඳට පෙන්වා දෙන්නම්. අද සන්ධ්‍යාවේ ප්‍රශ්නයක් අසන්නට මා කල්දී තිබෙනවා. සන්ධ්‍යාවට වුවමනා නැහැ. එය මා දැන් කියන්නම්. මගේ කොට්ඨාශයේ කුරුපනාවෙල උප තැපැල් කාර්යාලයක් තිබෙනවා. ඒ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති මහත්මයා 1966 ජනවාරි 8 වැනිදා කළු කොඩියක් එල්ලුවාය කියා ඔහුගේ වැඩ තහනම් කළා. ඒ ගැන විභාගයක් පැවැත්වූවා. විභාගයේදී තැපැල්පතිතුමා කුරුපනාවෙල උප තැපැල් ස්ථානාධිපතිවරයා සම්පූර්ණයෙන්ම නිදහස් කළා. "උඹ නිදහස්, උඹ නැවතත් වැඩ භාර ගනින්" කියා තැපැල්පතිතුමා ඒ උප තැපැල් ස්ථානාධිපතිවරයා සම්පූර්ණයෙන්ම නිදහස් කළා. ඒ අනුව ඔහු උදේ වැඩ භාර ගත්තා. නමුත් දවල් නැවතත් ඔහුගේ වැඩ තහනම් කළා. මක්නිසාද? ඇමතිවරයා කෙලින්ම ඇඟිලි ගැසූ නිසයි. වැඩ බැලූ උප තැපැල් ස්ථානාධිපතිනිය ඇමතිවරයාගේ නෑයෙක්. ඇමතිවරයා කෙලින්ම ඇඟිලි ගැසුවා. මේ රටේ ඉතිහාසයේ කවදාවත් ස්ථිර ලේකම්වරයකු විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියකු විසින් හෝ රජයේ සේවකයකුට විරුද්ධව-පැමිණිලිකාරයා විසින් විත්තිකාරයාට විරුද්ධව-පොදු සේවා කොමිෂන් සභාවට ඇපෑලක් ඉදිරිපත් කර නැහැ. නමුත් පළමුවැනි වතාවට මේ ලජ්ජා නැති ඇමතිවරයා පොදු සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළා. අදත් ඒ උප තැපැල් ස්ථානාධිපතිවරයාගේ වැඩ තහනම් කර තිබෙනවා. ඔහු නිදහස් වුණේ 1967 පෙබරවාරි මාසයේදීයි. මේ 1968 වර්ෂයයි.

නමුත් අදත් ඔහු ගෙදරයි. අදත් ඔහුට වැඩ නැහැ. ඔන්න අපේ මිනිහට කරන හැටි. ආණ්ඩුවේ මිනිහාට සැලකිල්ලක් දක්වන්නෙ ඔය අන්දමටයි. අපි බලමු එහි අනික් පැත්ත දිහා. රූපහ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපතිවරයා මෙයට පෙර තුන් වතාවක්ම යම් යම් චෝදනාවලට වැරදි කාරයා වී දඬුවම් ලබා තිබෙනවා. හතරවන වතාවට රුපියල් පන්සියයක් වටිනා මුද්දර වංචාවක් පිළිබඳව චෝදනා ලැබ සිටියා. ප්‍රදේශයේ තැපැල් අධිකාරිවරයාත්, විමර්ශන නිලධාරිතුමාත් එම ස්ථානයට ගිහින් පරීක්ෂා කර බැලීමේදී රුපියල් පන්සියයක මුදල් වංචාවක් පිළිබඳව අසු වුණා. එවලේම උප තැපැල් ස්ථානාධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

පතිවරයාගේ රාජකාරි කටයුතු තහනම් කළා. චෝදනා පත්‍ර ඉදිරිපත් කළා. ඒ මාස හයකට පෙරයි. නමුත් එම චෝදනා ගැන විභාගයක් කළාද? නැහැ. අද වනතුරුවත් විභාගයක් කර නැහැ. ඇමතිවරයාගේ බලය පාවිච්චි කර එම චෝදනා සම්පූර්ණයෙන්ම ඉවත දැම්මා. ඊට පසුව, ජනවාරි 24 වනදා සිට, නැවතත් එම උප තැපැල් කාර්යාල යේ උප තැපැල් ස්ථානාධිපතිවරයා වශයෙන් ඒ තැනැත්තා වැඩ කරනවා. මේකද ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ?

මේකද තමුන්නාන්සේලා ඔය කියන ප්‍රජාතන්ත්‍රවාදය? වරදක් කර නැතැයි ඔප්පු වුණු උප තැපැල් ස්ථානාධිපතිවරයාට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කර ඔහු අමාරුවේ දැම්මට උත්සාහ කරනවා; ඔහුට නැවත සේවය කරන්න ඉඩ දෙන්නෙ නැහැ. නමුත් වැරදි කර අසුවුණු තමන්ගෙ නෑයා ආරක්ෂා කරන්න උත්සාහ කරනවා. රුපියල් පන්සියයක් වංචා කොට අසු වුණු තමන්ගේ නෑයා ආරක්ෂා කරන්න උත්සාහ දරනවා.

තවත් එක් ස්ථානයක උප තැපැල් ස්ථානාධිපතිවරයකු අස් කළා. වරද තමන්ගෙ භාර්යාවට අයත් බැංකු පොතෙන් තම අත්සන යොදා රුපියල් 50 ක් ලබාගැනීමයි. ඒ මහතාගේ භාර්යාව කියා සිටියා, අත්සන තමාගේ නොවුණත් මුදල් ලබා ගැනීමට තමන් බලය දුන්නාය. කියා. එසේ වුණත් ඒ මහතා සේවයෙන් පහ කළා. තවත් උප තැපැල් ස්ථානාධිපතිවර යකු සේවයෙන් පහ කළා, රුපියල් හත් සියයක අඩුවකට. ඒ ගැන ප්‍රශ්න කළාම ඒ තැපැල් ස්ථානාධිපතිවරයා කීවා, මුදල් කායසීලයේ තැබීම අනතුරු සහිත නිසා—එය හොරකම් කර ගෙන යාවිය කියන බිය නිසා—එය තමන්ගෙ අල්මාරියේ ආරක්ෂා ලෙස තැන්පත් කර ඇති බව. ඒ මහතා පදිංචිව සිටියේ තැපැල් කාර්යාලය පිහිටි එම ගොඩනැගිල්ලේමයි. එය පරීක්ෂා කර බැලීමට පැමිණි නිලධාරියා කැඳවා ආරක්ෂිත ලෙස තැන්පත් කර තිබුණු රුපියල් හත්සියය ඔහුට භාර දුන්නා. වැඩි පරීක්ෂම සඳහා එසේ තැන්පත් කර තිබුණු නමුත් කාර්යාලයේම මුදල් නොතැබීම නිසා ඔහු සේවයෙන් පහ කළා.

යක් දැමීම ගැන චෝදනා ලත් තවත් තැනැත්තකු තමන්ට විරුද්ධව නැගූ චෝදනාවලට නිවැරදිකරු වශයෙන් ඔප්පු වී සිටියදී පවා ඔහුගේ වැඩ තහනම් කළා. අද වනතුරුත් එසේ වැඩ තහනම් කර තිබෙනවා. තුන් වතාවක්ම වැරදිකරු ලෙස ඔප්පු වුණු, දඩුවම් විඳි, හතර වැනි වතාවට රුපියල් පන්සියයක වංචාවකට චෝදනා ලැබ හය මාසයකට වැඩ තහනම් කර තිබුණු රූපහ තැපැල් හලේ උප තැපැල් ස්ථානාධිපතිවරයා නැවතත් දැන් ඒ ස්ථාන යේම වැඩ කරනවා. මේ වාගේ දූෂණ ක්‍රියා කරන්නද රුපියල් කෝටි 25 ක් අනුමත කරන්නෙ කියා මා ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, අද මේ ආණ්ඩුවේ පාලනය ඔය විධියේ තත්ත්වයකට පත්ව තිබෙනවා. ඇත්ත වශයෙන්ම ජනතාවට පෙනෙන්න ඕනැ ජනතාවගෙන් ලබා ගන්නා මුදල් සාධාරණ අන්දමින් වියදම් කරනවාය කියා. නමුත් එහෙම තත්ත්වයක් පෙනෙන්නට නැහැ. ජනතාවගේ නියෝජිතයින් වශයෙන් අපට මේවා ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා. එසේ නැතුව මුදල් ඇමතිවරයා හෝ වෙනත් ඇමතිවරුන් කෙරෙහි ඇති කර ගත් පෞද්ගලික අමනාපයකින් කථා කරනවා නොවෙයි. පෞද්ගලික වශයෙන් අමනාපකම් ඇති කර ගන්න බූදල් බෙදා ගැනීමක් අපට තිබෙනවායැ. අප ඉල්ලා සිටින්නෙ, අප කියා සිටින්නෙ මහජන මුදල් සාධාරණ අන්දමින් පාවිච්චි කර එයින් නියම සේවයක් ඉටු කරන ලෙසයි. සේවයේ දක්ෂතාවක්, අවංක භාවයක්, පිරිසිදු කමක් ඇති කරන්න ඕනැ. හැම තැනම දූෂණ කටයුතු කෙරෙනවා නම් කොහොමද එවැන්නක් බලාපොරොත්තු වන්නෙ?

මට ලිපියක් ලැබී තිබෙනවා නුවරඑළියේ දිසාපතිතුමාගෙන්. ස්වාමිපුරුෂයා මියයාම නිසා තම දරුවන් හතර පස් දෙනා නඩත්තු කර ගැනීම පිණිස පිං පඩියක් ලබා දෙන ලෙස ඉල්ලා යවනු ලැබූ ලිපියට පිළිතුරු වශයෙන් එවා තිබෙන ලිපියේ, දැනට වෙන් කර ඇති මුදල් ප්‍රමාණය අනුව අලුතෙන් ඉල්ලුම් කරන්නන්ට ශතයක්වත් දෙන්න බැරි බව සඳහන් කර තිබෙනවා. එයින් පැහැදිලි වෙන්නෙ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුවට පිං පඩි සඳහා අලුතෙන් ශත යක්වත් දෙන්න පුළුවන්කමක් නැති බවයි. රුපියල් පහක් දහයක් පිං පඩි සඳහා දෙන්න බැරි නම් කොහොමද කාර්, ලොරි, ජීප් ආදී වාහන; ඒ වාගේම බ්‍රැන්ඩි, විස්කි ආදී මත්පැන් ගෙන්වන්නෙ? ඒ හැරෙන්නට ධනවතුන්ගේ සුඛ විහරණය සඳහා මේ ආණ්ඩුව මොනවාද නොගෙන්වන්නෙ? එසේ වුණත් දුප්පතකුට, අනාථ වුණු අයකුට පිං පඩියක් දීම සඳහා රුපියල් පහක් දහයක් මාසයකට වැය කරන්න බැරි නම්, එය කොතරම් ලජ්ජා නැති කාරණයක්ද කියා මා අහනවා. කාට කතිරය ගැසුවත් සියලුදෙනාම රටේ ජනතාවයි. රටේ ජනතාවගෙන් කෙනෙක් අමාරුවේ වැටුණු අවස්ථාවකදී මාසයේ ලුණු මිරිස් ටික අර ගන්න, කැඳ ටිකක් බීල ජීවත් වෙන්න රුපියල් 5 ක වත් පිං පඩියක් දෙන්ට බැරි ආණ්ඩුවක් නම් මේ රටේ තිබෙන්නෙ ඒ ආණ්ඩුව තියෙනවට වඩා හොඳයි හෙණ ගහල යන එක කියා මේ රටේ සාමාන්‍ය මිනිහා දෙස් තියනව. මගේ ස්වාමිපුරුෂයා මැරුණා. මගේ ළමයි හත්-අට දෙනා නඩත්තු කර ගන්ට විධියක් නැහැ. මම ආණ්ඩුවෙන් පිංපඩියක් ඉල්ලුවාම සල්ලි නැහැ කියනව. මේ ආණ්ඩුවෙන් ඇති වැඩේ මොකක්ද කියමින් අර විධියේ සාමාන්‍ය කනවැන්දුම් අම්මල දෙස් තියනව.

ආණ්ඩුවේ ඉස්සරහ පේලියේ සිටින ඇමතිවරුන් කියනව, තමුන්නාන්සේලා කියන්නෙ බොරු කියා. තමුන්නාන්සේලාට ඔය ඉස්සරහ පේලියේ වැඩි කාලයක් ඉන්ට ලැබෙන්නෙ නැහැ. ජනතා කෝපය උත්සන්න වුණේ කවදාද අන්න එදාට ඔය පුටු පෙරළාගෙන ජනතාව මේ සභාව ඇතුළටත් එන්න බැරිකමක් නැහැ. ඒ තත්ත්වය අප බලාපොරොත්තු විය යුතුයි. තමුන්නාන්සේලා දැන් කියයි, තමුන්නාන්සේලාගේ කාලයෙදිත් මේ වැරදි කළා කියා. අපේ මිනිස්සු වැරදි කළා නම් ඒව වැරදි බව අපි කියනව. අපි එදා පාර්ලිමේන්තුව ඇතුළෙ ආණ්ඩු පක්ෂයේ පිටුපස ආසනවලට වෙලා නිකම් හිටියෙ නැහැ. ආණ්ඩු පක්ෂයේ පසුපස ආසනවල සිට අපි ඉදිරිපෙළේ සිටි ඇමතිවරුන් විවේචනය කළා. හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න. මෙතැනදිත් විවේචනය කෙරුව. පක්ෂ කණ්ඩායම තුළදිත් විවේචනය කෙරුව. වෙනෙකක් තබා අපේ ආණ්ඩුව පෙරළෙන්නට හේතු වුණේත් අපේ යම් යම් නායකයන්ගෙ වැරදි නිසා වෙන්ට ඇතැයි මට සමහරවිට හිතෙනව. අපි කියන්ට වුවමනා දේ නාත්තට වුණත් කියනව. එහෙම නැතුව පිරිසිදු දේශපාලනය කරන්ට බැහැ. අපි රටේ ගියාම ප්‍රජාතන්ත්‍රවාදී. මෙහෙ ආවාම තමන්ගේ පන්දම්කාරයන්ට විතරයි වැඩ. පන්දම් තන්ත්‍රවාදී! ජීවන වියදම බස්වනවාය කියනව. මෙතැනට ඇවිත් තිබුණු ටික තවත් ඉහළ නග්ගනව. පන්දම්තන්ත්‍රවාදය!

අපේ ආණ්ඩුව තිබුණු කාලයේ සිදුවුණේත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව දැන් කරන්නෙත් මොකක්ද? උදේ මැති ඇමතිවරුන්ගෙ නිවාසවල පෙරහැර වගේ සෙනග. අපේ ආණ්ඩුව පැවති කාලයේ අප හමු වෙන්ට ආව උදවියම තමයි, අද තමුන්නාන්සේලා හමු වෙන්ට එන්නෙ. එකම පිරිස. මෙතෙක් මේ රටේ අහිංසක ජනතාවට සේවයක් හරිහැටි සිදු වුණේ නැහැ. පන්දම්කාරයින්ටයි සේවයක් සිදු වෙලා තිබෙන්නෙ. ඒ නිසා මේ පන්දම්තන්ත්‍රවාදය නැති කිරීමේ පියවරක් අපි දෙගොල්ලම එකතු වෙලා හෝ නොගත්තොත් මේ රට කවදාවත් හරි යන්නෙ නැහැ.

නිදර්ශන වශයෙන් ඉදිරිපත් කළ හැකි තවත් නොයෙක් දේවල් තිබෙනව. රට දූෂණවලින් පිරිල. ජනතාවගේ මුදල් හදල් නිකරුණේ වියදම් කළ නමුත් වාරිමාර්ග කටයුත්තක්වත් හරියාකාර සකස් වෙලා නැහැ. කයිවාරු නම් ගහනව. කුඹුරු හරියට සංවර්ධනය වෙලාලු. මගේ ආසනයේ නම් කලින් තිබුණට වඩා එකම කුඹුරු අඟලක්වත් වැඩිවෙලා නැහැ. ඇළවල් එහෙම හදන්නෙ නැති නිසා තිබුණටත් වඩා අඩු වෙලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

අස්වැන්න වැඩිවෙලා තියෙනව නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

අස්වැන්න වැඩි කර ගන්ට පුළුවන් තමන්ගෙ දක්ෂතාව අනුවයි. ඒක පුද්ගලික ප්‍රශ්නයක්. මා හිතන්නෙ නැහැ, ඊට මීට වඩා උත්තරයක් වුවමනායි කියා. වපුරන තරමට ඒවායින් බිජු ලැබෙන බව අපේ පරණ පොත්පත්වල සඳහන් වෙනව. හැබැයි, බිජුවල ස්වභාව ගැනත් කල්පනා කරන්ට ඕනෑ. සමහරවිට ඒවා වඳ පිදෙන අවස්ථාත් තිබෙනව. සමහරවිට වැඩිගෙන ගොස් අතර මග මැරෙණ ඒවත් තිබෙනව. පැළ වුණු පමණින් අපට තීරණය කරන්ට බැහැ, නියම ප්‍රතිඵල ලැබෙයි කියා. තමුන්නාන්සේලා කච්චේරියට උප දිසාපතිවරයෙක් දමල ඔහුට ජීප් එකක් දෙනව. ඒ දිසාපතිවරයා දිස්ත්‍රික්කයේ හැම තැනම ජීප් එකේ නැගී දුවනව. ඔන්න කෘෂිකර්මය; වගා ව්‍යාපාරය. උප දිසාපතිතුමා හොඳට ටයි එකක් එහෙම දමල ජීප් එකේ ඉස්සරහ සීට් එකේ වාඩිවෙලා ඉන්නව. ජීප් එක මුළු දිස්ත්‍රික්කයේම දුවනව. අන්න දිස්ත්‍රික්කයේම වවල.

වගාවන් ගැන වාර්තා ලැබෙන හැටි පෙන්වීමට මම එක් නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්. එය මා හොඳට හොයා ගත් දෙයක්. "මගේ පාඨශාලාවේ ළමයින්ගේ මාර්ගයෙන් මා මිරිස් අක්කර 150 ක් වගා කළා" යි පාඨශාලාවේ ප්‍රධානාචාර්යතුමා වාර්තාවක් ඉදිරිපත් කරනවා. ඊළඟට, කෘෂිකර්ම ඕවර්සියර් මහතා "මගේ ගමේ මිරිස් අක්කර 150 ක් වගා කර තිබෙනවා" ය කියා දෙපාර්තමේන්තුවට වාර්තාවක් එවනවා. "මගේ වසමේ අක්කර 150 ක මිරිස් වගාවක් දැම්මා" යි ග්‍රාම සේවක මහත්මයා ආදායම් පාලක නිලධාරිතුමාට වාර්තා කරනවා. මේ තුන් දෙනාම වාර්තා එවන්නේ එකම වගාව ගැනයි. ඒ නිසා ආණ්ඩුවේ වගා වාර්තාවෙහි අක්කර 450ක් සඳහන් වෙනවා. එහෙත් ඇත්ත වශයෙන්ම තිබෙන්නේ එකම අක්කර 150 යි. ඉතින් මේ වාර්තා කියවන ඇමතිවරුන් මෙතැනට ඇවිත් ඉදිමෙනවා. "අපි අච්චර වැව්වා, මෙච්චර වැව්වා" කියමින් කෑගහනවා. හැත්තෑවේදී සංවර්ධනය වෙනවායි කියමින් හඬ තළනවා. හැත්තෑවේදී සංවර්ධනය තියා හං වර්ධන යවත් නැති වෙනවා, පිම්බිලා පිම්බිලා පුපුරා යන නිසා. කාටද මේ බොරු කරන්නේ ?

අපේ රටේ හාල්, වී ඉන්දියාවට හොරෙන් යැවෙන බව අප ගරු අගමැතිතුමාට පෙන්වා දුන්නා. මහනුවර, මිනිපේ හරහා පොලොන්නරුව පැත්තෙන් ඒවා යාපනේ ඔස්සේ ඉන්දියාවට හොරෙන් යැවෙන හැටි අප කිව්වා. එහෙත්, ගරු අගමැතිතුමා ඒ ගැන මොනවද කිව්වේ? "මේ රටේ අගමැතිවරයා වශයෙන් මා මේ ප්‍රකාශය කරන්නේ වගකීමක් ඇතිවයි; අපේ රටේ හාල් ඇටයක්වත් හොරෙන් පිටවන්නේ නෑ". එහෙත් අද එතුමාට ඒක කියන්නට බැහැ. මහනුවර ප්‍රදේශයේ වීවලින් වැඩි කොටසක් නැගෙනහිර පැත්තෙන් රටින් පිට වන බවට මහනුවර දිසාපතිතුමා වාර්තාවක් සපයා තිබෙනවා. ඒවාගේම, මේ රටේ හාල් හා වී උතුරු වෙරළින් ඉන්දියාවට යන බව පොලීසිය වාර්තා කරනවා.

**අමිර්තලින්ගම් මයා.**
(திரு. அமிர்தலிங்கம்)
(Mr. Amirthalingam)

That is an absolute falsehood.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ඒ ගරු මන්ත්‍රීතුමා නොවෙයි හාල් යවන්නේ. එතුමාට මොකද ඔය තරම් අමාරු මේවා කියන විට? හාල් යන නිසාම තමයි ඔය තරම් අමාරු වන්නේ.

**අමිර්තලින්ගම් මයා.**
(திரு. அமிர்தலிங்கம்)
(Mr. Amirthalingam)

Can he point to one instance of rice or paddy caught anywhere ?

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ඒ මන්ත්‍රීතුමාට බොහොම අමාරුයි. මේ රටේ ආහාර ටික පිටරට යැවීමේ කුමන්ත්‍රණයේ කොටස්කාරයින්ට තමයි කේන්ති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්නේ. ඒ ගැන මට කරන්නට දෙයක් නැහැ. මට කියන්න තිබෙන්නේ එච්චරයි. එතුමාත් අප වගේම මේ රටට ආදරේ නම්, කිසියම් අයුක්තියක් සිදු වන අවස්ථාවකදී අප සමග එක් වී එය නතර කරන්නට එතුමාට බැරි මොකද? අපට සහයෝගය දෙන්නට බැරි මොකද? කවුරුත් මේ ව්‍යාපාරයේ කොටස්කාරයින් නිසයි, කෝන්ති යන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
මන්ත්‍රීවරයකු ඒවගේ වැඩක කොටස්කාරයකු බව කීම සුදුසු නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මම එය ඉල්ලා අස්කර ගන්නම්, කථානායකතුමනි. මා තමුන්නාන්සේට හැම විටම කීකරුයි.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)
He does not know that rice is cheaper in South India than in Ceylon.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අයියෝ ඒ ගැන මා දන්නවා. දැනට මාස 6 කට කලින් මා ඉන්දියාවට ගියා. එහි හාල් මිළ මෙහේට වඩා බොහොම වැඩියි. ඊයේ පෙරෙයිදා එහේ ගිය ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් අහන්න එහේ හාල් මිළ ගැන.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)
Of course! Find out the price.

**සී. එන්. කන්නන්ගර මයා.** (දෙණියාය)
*(திரு. சி. என். கன்னங்கர—தெனியாய)*
(Mr. C. N. Kannangara—Deniyaya)
It is Rs. 5 there.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඇත්ත වශයෙන්ම ඒකයි තත්ත්වය. මේ ගරු මන්ත්‍රීවරුන් ලංකාවේ මන්ත්‍රීවරුන්ද ඉන්දියාවේ මන්ත්‍රීවරුන්ද? ඉන්දියාවේ අය නම් කරුණාකර නැව්වලට ගොඩ වී එහාට යන්න. [බාධාකිරීම්]

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)
He is making false statements.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The hon. Member will have an opportunity of replying and proving him to be wrong.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)
Half of what he says is not interpreted to us and we get only the substance. He makes all sorts of wild and foolish statements about us.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
I do not think the hon. Member for Walapane made any allegations against the hon. Member. If he did, I would not have allowed it. He is making a speech and making certain submissions. If the Member does not agree with those views he can reply.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තොප්පිය දමා ගන්නවා නම් මම ඉතුරු ටිකත් කරන්නම්. තොප්පිය දමා ගන්නේ නැත්නම් නිකම් ඉන්නම්. එපයි, මට කියන්නට තිබෙන්නේ.

රට සංවර්ධනය කරන්නට ඕනෑ නම් රට ඇතුළේ තිබෙන ධන ධාන්‍ය ටික මේ රටේ ඉතිරි කර ගන්නට ඕනෑ ; ඒවා ඉතිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

කර ගැනීමේ වැඩ පිළිවෙලක් ඇති කරන්නට ඕනෑ; ඒ සඳහා ආරක්‍ෂක සංවිධාන වැඩි වැඩියෙන් යොදන්නට ඕනෑ. හමුදාව යොදවා වැඩ වර්ජන කඩාකප්පල් කරන්නට තමුන්නාන්සේලා ලෑහැස්ති වුණා. ඇයි ඒ වාගේ ලෑහැස්ති නැත්තේ, වෙරළ ආරක්‍ෂා කර අපේ රටෙන් හොරෙන් පිටරට යැවෙන ධන ධාන්‍ය ටික නවත්වා ගන්නට? තුන් හතර දෙනා අල්ලන විට ඒවා නවතීවි. පසුගිය දවස්වල ඒ වාගේ හොර බඩු විශාල තොගයක් ඇල්ලුවා. අපට විදේශීය ධනයෙනුත්, දේශීය ධනයෙනුත් බොහොම අමාරුකම් තිබෙද්දිසි ළමයින්ගේ කිරි ටික පවා ගෙන්වන්නේ. එහෙම අමාරුකම් මැද ගෙන්වන ඒවා ඔරුවේ පල්ලෙහා පැත්තෙ බැඳ ඉන්දියාවට ගෙන යනවා නම් අප එය නවත්වන්නට ඕනෑ.

**සුගතදාස අරඹවල මයා.** (අක්මීමන)
*(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)*
(Mr. Sugathadasa Arambewala—Akmeemana)

කවුද, ගෙන යන්නේ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගෙන යන්නේ හොරු. ඒ හොරු අල්ලන්න රජයට ශක්තිය තිබෙන්නට ඕනෑ.

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)

ඒ සඳහා රජයට උදව් දෙන්නට ඕනෑ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇත්ත වශයෙන් අප ඕනෑ තරම් රජයට උදව් දෙනවා. දූවිලි ටිකක් කාමරයට ආවාය කියා සටනක් නවත්වන්නට බැහැ. දූවිලි ආදෙන්, අපි සටන කරගෙන යමු. දවසින් දවස දූවිලි අඩු වේවි. මෙය ජාතික සටනක්. එම නිසා අප කාටත් මෙය කරන්නට වෙනවා. තමුන්නාන්සේලාත් අපත් පක්‍ෂ දෙකක් බව ඇත්ත. එහෙත් අපට ජාතියක් වශයෙන් කවරදා හෝ එකතු වන්නට වෙනවා. එය නවත්වන්නට බැහැ. බලයේ ඉන්නට ඕනෑ නිසා, සමහර විට ආණ්ඩු බලය තිබෙන නිසා, නැත්නම් වෙනත් නොයෙක් හේතූන් නිසා අප දෙපැත්තේ ඉන්නවා. අර අය ඒ විධියට ක්‍රියා කරනවා නම් පක්‍ෂ විපක්‍ෂ භේදය අත්හැර කවදා හෝ අපට එකතු වන්නට සිදු වෙනවා. අපේ ජාතිය පමණක් නොවෙයි, අපේ ධනයත් ආරක්‍ෂා කර ගැනීම සඳහා අපට එකතු වන්නට සිදු වෙනවා.

එක් අතෙකින්, විදේශීන් අපේ තේ, රබර්, පොල් වැනි අපනයන ද්‍රව්‍යයන් අඩු මිළට ගෙන වැඩි මිළට විකුණා මේ රටේ ධනය හොරකම් කරනවා. අනෙක් අතින්, මේ රට ඇතුළේ තිබෙන ධනය පිටරට අර ගෙන ගිහින් අප විනාශ කරනවා. එහෙම නම් ඇතුළතිනුත් කනවා, පිටතිනුත් කනවා. ඇතුළතිනුත් කද්දී පිටතිනුත් කද්දි කන වේදනාව හොඳටම දැනෙද්දී මෙතැන ඇවිත් කියනවා, "නැහැ, නැහැ, එහෙම එකක් නැහැ" කියා. කන බව හොඳටම දැනෙද්දීත් කියනවා, "එහෙම එකක් නැහැ, ඒ තමුසෙලාගේ කාලයේ" කියා. අප කියනවා "තමුසෙලාගේ කාලයේ" කියා ඒ අය කියනවා, "තමුසෙලාගේ කාලයේ" කියා. ඔය විධියට දෙගොල්ලම "තමුසෙලාගේ කාලයේ, තමුසෙලාගේ කාලයේ" කියමින් මෙතැන ඉන්නවා. රටට හෙණ ගැහිද්දෙන්! අප මේ ගරු සභාවට ඇවිත් ඉන්නේ මෙයටද?

අප දේශපාලනය කරනවා නම් රට රවටන්නේ නැතිව, රටේ ජනතාවගේ අයිතිවාසිකමුත් රටේ ධනයත් ආරක්‍ෂා කිරීමේ ක්‍රියා මාර්ගයක් ආරම්භ කළ යුතු බවයි, මා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ. ඒ විධියට අවංකව කටයුතු කරන අතර මුදල් ඇමතිතුමා කියනවා නම් රුපියල් 25 කෝටියක් නොවෙයි, කෝටි 25,000 ක් දෙන්නට වුණත් අප කැමැති වෙනවා. එහෙත් මේ තරම් දූෂණ කරන ගමන්, දූෂණයෙන් දූෂණයට වැටී සිටින ගමන්, රට අමාරුවට දමා තිබෙන ගමන්, රටේ සාමාන්‍ය ජනතාවට ජීවත් වන්නට විධියක් නැතිව මිරිස් අවුන්ස ගණන්, පරිප්පු අවුන්ස ගණන්, සූදුරු අවුන්සයටත් අඩුවෙන්, උම්බලකඩ අවුන්සයටත් අඩුවෙන් කලං ගණන් අර ගෙන, ඒවා කොටා කසාය බොන්න සිදු වී තිබෙන අවස්ථාවක, රෙදි යාර දෙකක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණක් ලැබෙන අවස්ථාවක, උගත් තරුණ තරුණියන්ට රැකීරක්ෂා නැතිව මේ රටේ ජනතාව කබලෙන් ළිපට වැටී තිබෙන අවස්ථාවක, මේ රජය ගෙන යන ව්‍යාපාරයෙන් නම් කවරදුවත් ජාතියක් හදන්නට බැහැ. මුදල් ඇමතිතුමා මොන තර්ක ඉදිරිපත් කළත් මේ විධියට නම් ජාතියක් හදන්නට බැරි බව මා කියනවා. ඒ නිසා බොරු කරන්නට එපා.

තමුන්නාන්සේලාට සිදු වී තිබෙන්නේ මොකක් ද? තමුන්නාන්සේලා විදේශීය ණය බලාපොරොත්තු වුණා. එංගලන්තයෙන්, අමෙරිකාවෙන් ණය ලැබෙන තුරු හිටියා. ඒවා ලැබුණේ නැහැ. එම නිසා දැන් රජය ගෙන යන්නට බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා. එම නිසා රුපියල් 25 කෝටියක බිල් පත්‍ර නිකුත් කරන්නට හොර නෝට්ටු ගහන්නට අවසර ඉල්ලනවා. බලාපොරොත්තු වුණු විදේශාධාර මේ ආණ්ඩුවට ලැබුණේ නැහැ. ඒ නිසා දැන් තව දුරටත් වැඩ කර ගෙන යන්නට අමාරුයි. රුපියල් විසිපන් කෝටියක භාණ්ඩාගාර බිල්පත්‍ර ගැසීම සඳහා අනුමැතිය ලබා ගන්නට ආවේ අන්න ඒකයි.

ඇමෙරිකාවෙන් ආධාර බලාපොරොත්තුවෙන් සිටියා; එහෙත් ලැබුණේ නැහැ. එසේ වුව ද නැගෙනහිර ජර්මනියෙන් ලොකු ආධාරයක් ලැබුණා. ඊයේ පෙරේදා නැගෙනහිර ජර්මනියේ ආධාර ඇතිව මෙහි පිහිටුවන්නට යන විශාලම පේස කර්මාන්ත ශාලාව සඳහා මුල්ගල තැබුවා. එදා උත්සව කටයුතු ගුවන්විදුලියෙන් ප්‍රචාරය වුණා. මා ඊට සවන් දුන්නා. නැගෙනහිර ජර්මනියෙන් ලැබෙන මේ ආධාරය රුපියල් දහඅට කෝටියක එකක් බව එදා මට ඇසුණා. එහෙත් මේ තරම් විශාල පරිත්‍යාගයක් කළ රටේ උප අගමැතිතුමා ලංකාවේ නතර වී සිටියේ ගරු කර්මාන්ත ඇමතිතුමාගේ අමුත්තකු හැටියටයි. එතුමා රාජ්‍ය අමුත්තකු හැටියට පිළිගන්නට මේ ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ. රුපියල් කෝටි දහ අටක පරිත්‍යාගයක් කළ රටේ උප අගමැතිවරයා රාජ්‍ය අමුත්තකු හැටියට පිළිගන්නට අපේ රටට බැරි වීම නම්බුවක් ද? කෙසේ වුවත් තමන්ගේ පෞද්ගලික අමුත්තකු වශයෙන් හෝ ඒ උප අගමැතිතුමාට සැලකීම ගැන ගරු කර්මාන්ත ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ උප අගමැතිතුමා රාජ්‍ය අමුත්තකු හැටියට පිළිගෙන කටයුතු කරන්නට ඉදිරිපත් නොවීම ගැන රජයට දොස් පවරනවා. ඇයි එතුමා රාජ්‍ය අමුත්තකු හැටියට පිළිගන්නට ආණ්ඩුව ඉදිරිපත් නො වුණේ? හේතුව එතුමා රතු රටකින් පැමිණීමයි. අපට රතු හාල් හොඳයි; රතු රෙදි හොඳයි; රතු රටවලින් එන වෙනත් දේ හොඳයි; මේක කොහේ තිබෙන ප්‍රතිපත්තියක් ද? මේක කාගේ ප්‍රතිපත්තියක්ද?

මම එකක් කියන්නම්. අප අනුගමනය කරන්නේ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් නම් යම් කෙනකු නැගෙනහිර ජර්මනියෙන් ආවත්, රුසියාවෙන් ආවත්, ස්වීඩනයෙන් ආවත් එංගලන්තයෙන් ආවත්, ජපන් රටෙන් ආවත්, වියට්නාමයෙන් ආවත්, වෙන කොයි රටෙන් ආවත් වෙනසක් තිබිය යුතු නැහැ. අපට කවුරුනුත් එකයි. මේ මධ්‍යස්ථ රටක් නම් කොයි රටෙන් ආ කෙනකුට වුවත් අප එක විධියට සලකන්නට ඕනෑ. අප මධ්‍යස්ථ බව ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වන්නට ඕනෑ. එහෙත් එක් රටකින් ආ තැනැත්තකුට රාජ්‍ය අමුත්තකු හැටියටත් තවත් රටකින් ආ තැනැත්තකුට කර්මාන්ත ඇමතිතුමාගේ පෞද්ගලික අමුත්තකු හැටියටත් සලකන්නට මේ ආණ්ඩුව මග සකස් කළා. මොකක් ද මේ දෙබිඩි ප්‍රතිපත්තියේ තේරුම?

"වැලමිටෙන් අල්ලනවා" යයි ඉස්සර කථාවක් තිබෙනවා. මා මේක කීවාට අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා අමනාප නොවෙනවා ඇතැයි මා හිතනවා. [බාධා කිරීමක්] වැලමිටෙන් ඇල්ලුවාට හරියට අසුවන්නේ නැහැ. ලිස්සා යනවා. වැලමිටෙන් අල්ලන්නේ නවත්වා ගන්නට වුවමනා වූ විට නොවෙයි, යවන්නට වූ විටයි. "ඉබ්බන් කන්, ඉබි මාලු නො කන්, අතින් නොකන්, පොල් කුරෙන් කන්" යනුවෙනුත් අපේ ගමේ ගොඩේ කථාවක් තිබෙනවා. මා මීට කලිනුත් මේ කථාව මෙහිදී මතක් කළා. නැගෙනහිර ජර්මනියෙන් දෙන රුපියල් කෝටි 18 පොල් කුරෙන් කෑමක්. නැගෙනහිර ජර්මනියේ උප අගමැතිතුමා කර්මාන්ත ඇමතිතුමාගේ පෞද්ගලික අමුත්තා. අන්න පොල් කුරෙන් කෑවා. ඇමෙරිකාවෙන් දෙනවා නම් ඒවා කන්නේ අති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

නුයි. ඇමෙරිකාවෙන් එන තැනැත්තා රජයේ අමුත්තා. ඇත්තෙන්ම මොකක්ද මේකේ තේරුම? මේ වැඩ අප මිස ලෝකයේ වෙන රටවල් දන්නේ නැතැයි හිතනවා ඇති. එහෙත් ඒ සිතුවිල්ල වැරදියි. ලෝකයේ අනෙක් රටවල මිනිසුන් මේවා දන්නවා. ඒ අයට තමුන්නාන්සේලා අනුගමනය කරන දෙබිඩි ප්‍රතිපත්තිය, බොරුව, කපටිකම අහුවෙලා.

ධනපති රටවලින් විදේශාධාර නොලැබුණු නිසා රුපියල් කෝටි 25 ක භාණ්ඩාගාර බිල් පත් සඳහා අවසර ඉල්ලන්නට මේ ආණ්ඩුවට සිදු වුණා. ඇත්ත ඒකයි. ඇයි මේ ඇත්ත මෙම ගරු සභාවේදී කෙළින්ම ප්‍රකාශ නොකරන්නේ? එසේ කෙළින්ම ඇත්ත ප්‍රකාශ කරනවා නම් මේ මුදල සම්මත කර දෙන්නට අපත් අත් ඔසොවනවා. එහෙත් මේ "වහෙන් ඔරෝ" ප්‍රතිපත්තිය මොකක් ද? අප ඒවාට කැමති නැහැ. තව ටික වේලාවකින් ගරු මුදල් ඇමතිතුමා හිනා එන දේවල් ටිකක් කියා මෙම විවාදය අවසන් කරනවා ඇති. වන්නිය පැත්තේ විහිළු හුඟක් තිබෙන බව අප දන්නවා. ඒ විහිළුවලින් ටිකක් කියා මුදල් ඇමතිතුමා වාඩි වෙනවා ඇති.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමාත් ඒ විධියට කරනවා නම් හොඳයි.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ලෝකයේ නොයෙකුත් විධියේ මිනිසුන් ඉන්නවා. තමුන්නාන්සේ කරන ඒවා මට කරන්නට බැහැ. එක එක අයට උත්පත්තියෙන් ලැබුණු දේ තිබෙනවා. තමුන්නාන්සේ කථානායකතුමා වශයෙන් ඉන්නවා. ඒ වාගේම තමුන්නාන්සේ නීතිඥයකු වශයෙන්ද හිටියා. එහෙත් අප වාගේ ගම්බද අයට ඔවැනි තත්ත්වයක් ලබා ගැනීම අමාරුයි. අප ලැබූ අධ්‍යාපනයේ හැටියට මෙතැනට පැමිණීමත් පුදුමයක් සේ හිතන්නටත් පුළුවනි. "මේ මිනිසුන් මෙහි ආවාට වඩා නාවා නම් හොඳා" යනුවෙන් සමහර විට ඉහළ පංක්තියේ උදවිය අප ගැන කියනවා ඇති. තමුන්නාන්සේ නම් එහෙම කියන්නේ නැති බව මා දන්නවා. ඒ නිසා කරුණාකර මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මේ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

රට සංවර්ධනය කරනවාය කියා කළ යුත්තේ අතලොස්සකට ජීප් සැපයීම නොවෙයි. කරන්නට නොයෙකුත් දේවල් තිබෙනවා. ගරු කෘෂිකර්ම ඇමතිතුමා මෙහි සිටින නිසා කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මේ කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම ඉහළින් හදා පහළට ක්‍රියාත්මක කරන්නට බැරි බව ආදායම් පාලක නිලධාරියකු හැටියටත් පළ පුරුදු ඇමතිවරයකු හැටියටත් තමුන්නාන්සේ දන්නවා. ඒ නිසා මෙවැනි සැලැස්මවල් ගම්වලට ඕනෑ විධියට සකස් කර ගම්වල තිබෙන ප්‍රශ්න විසඳීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මගේ ආසනයේ හා හඟුරන්කෙත ආසනයේ කිසිම කෘෂිකාර්මික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ නැහැ. වාර්තා පමණයි තිබෙන්නේ.

නිලධාරීන් ගමට බැස ගමේ මහ ජනයා සමග සාකච්ඡා කර ගමට යාව තිබෙන රජයේ හෝ පෞද්ගලික ඉඩම් හෝ අරගෙන යම්කිසි වගාකිරීමේ වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. එසේ කළොත් නම් සාර්ථක වන්නට ඉඩ තිබෙනවා. අද වවන්නේ කඩදාසිවල පමණයි. ගම්මුන් නම් වවන්නේ නැහැ. රැකිරක්ෂා නැති උගත් තරුණයන් වැවිලි කර්මාන්තයෙහි යෙදවීමේ වැඩ පිළිවෙළින් ඔවුන් බලාපොරොත්තු වන්නේ රක්ෂාවල්. කෘෂිකර්ම හමුදාවට බැඳීමෙන් බලාපොරොත්තු වන්නෙත් රක්ෂාවල්. කෘෂිකර්ම හමුදාවට බඳවා ගන්නෙත් ලංගමට බඳවා ගන්නෙත් පන්දම් තන්තරවාදය අනුවයි. අවංක දක්ෂ පුද්ගලයා සොයා ගෙන ඔහු නියම වැඩෙහි යෙදවීමේ සිරිතක් නැහැ. ඒ නිසා හැම තැනකම අපේ සංවර්ධන ව්‍යාපාර අඩපණ වී තිබෙනවා. දිනෙන් දිනම ක්‍රෝධයත් ඊර්ෂ්‍යාවත් වැඩි වෙනවා. අපි රජයකින් බලාපොරොත්තු වන්නේ මිනිසා තුළ ක්‍රෝධයත් ඊර්ෂ්‍යාවත් වගාකිරීමක් නොවෙයි. ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, ද්වේශය තුනී කර ජනතාව අතර පිතින් පිණ ආමයත් රටේ සංවර්ධනයත් ඇති කිරීමට තරම් ශක්තියක් මේ රජයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්නම් අනාගතයේදීවත් එවැනි ශක්තියක් ඇති රජයක් මේ රටේ බිහි වීමට අවස්ථාව සැලසේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 3.37

**ඩී. පී. ආර්. වීරසේකර මයා.—(දෙහිඕවිට)**
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*
(Mr. D. P. R. Weerasekera—Dehiowita)

ගරු කථානායකතුමනි, භාණ්ඩාගාර බිල්පත්‍ර මගින් රුපියල් විසිපන් කෝටියක ණය මුදලක් ඉල්ලන මේ අවස්ථාවේදී වචන සවල්පයක් කථා කිරීමට මාත් බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්] අපේ වලපනේ මන්ත්‍රීතුමා කථා කරන විට නිදා වැටුණු අය තමයි, පිට වී ගියේ. අනික් අය අසාගෙන හිටියා. මා මේ අවස්ථාවේදී රජයට මතක් කරන්නට යන්නේ මෙයයි: තිබෙන මුදල් මාර්ග පාවිච්චි නොකර මහ ජනතාවට බර පැටවීම ගැන අපි විරුද්ධයි. මේ රජය බලයට පත්වුණාට පසුව ලොකු බලාපොරොත්තුවක් ඇතිව සංවර්ධන වැඩ ආරම්භ කළත් අන්තිමේදී නොදන්නා දේට අත තැබීම නිසා නිලධාරීන්ගේ හෝ මහජනතාවගේ සහයෝගය ගන්නට ශක්තියක් නැතිව ඒවායේ එරී සිටින බව මීට කලින් කථා කළ මන්ත්‍රීවරු පැහැදිළි වශයෙන් පෙන්වා දුන්නා. මා රජයට මතක් කරන්නට යන්නේ වෙනත් අංශයක් ගැනයි. රටේ සංවර්ධනයක් ඇති කිරීමට කොයි රජයක් මැදිහත් වුණත් කොයි ඇමතිවරයෙක් මැදිහත් වුණත් එයට සහයෝගය දෙන්නට අපිත් ලැහැස්තියි. එවැනි ව්‍යාපාර කඩාකප්පල් කරන්නට අපි එදා උත්සාහ කළෙත් නැහැ; අද උත්සාහ කරන්නෙත් නැහැ. වලපනේ මන්ත්‍රීතුමා මෙන්ම වැඩ කරන නැත්නම් වැඩ කරන්නට උත්සාහ දරන ඇමතිවරුන්ට ප්‍රශංසා කරන්නට මාත් ලැහැස්තියි.

ගරු කථානායකතුමනි, සමාජවාදී ජර්මන් ජනරජය පිළිබඳ ප්‍රශ්නය මතු කළා. අපට ආධාර කරන්නට අපට අත දෙන්නට මේ රටට පැමිණි විශේෂ අමුත්තෙකුට අප දැක්වූ සැලකිල්ල ඒ රටට වඩා මේ රටට නින්දාවක්. කර්මාන්ත ඇමතිතුමා විසින් එතුමා මෙහි කැඳෙව්වේ විශේෂයෙන් ඒ පුද්ගලයාට තැන දෙන්නවත් කර්මාන්ත ඇමතිතුමාට තැනක් ගන්නවත් නොවෙයි. අවුරුදු ගණනාවක් තිස්සේම මේ මුදල අපට දෙන්නට ඒ රජය තැත් කළා. අපේ රජය පැවති කාලයේත් ඒ මුදල අපට දෙන්නට උත්සාහ කළා. එහෙත් එය ලබා ගන්නට කලින් අපේ ආණ්ඩුව වැටුණා. මේ ඇමතිතුමා නැවත ඒ ප්‍රශ්නය අලුත් කර රුපියල් දහ අට කෝටියක ආධාරයක් ලබා ගත්තා. අප ඒ රටට කරන ගෞරවයක් හැටියටත් අපේ රටේ ගෞරවය ආරක්ෂා කර ගැනීමක් හැටියටත් ජර්මනියේ උප අගමැතිතුමා මෙහාට කැඳවනු ලැබුවා. අපට කිසිම ආධාරයක් උපකාරයක් නොකරන අවට රටවල ඇතැම් අගමැතිවරුන් සහ ජනාධිපතිවරුන් එහෙම මෙහාට කැඳවා ගෙන අවුත් විශාල අන්දමට බාල් නටා උත්සව පවත්වා කටයුතු කරන බව පෙනෙනවා. එහෙත් මෙවැනි විශාලතම ආධාරයක් කරන ලද රටක නායකයකු පිළි ගත්තා ලද ආකාරය නම් නින්දනීය බව කියන්නට ඕනෑ. අපි ඒක පැත්තකින් තබමු.

මේ රජය බලයට පත් වූවායින් පසු මුදල් ඇමතිතුමා සමග මේ රටේ මැණික් ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්නට මට අවස්ථාව සැලසුනා. ඒ පැත්තේත් මේ පැත්තේත් මන්ත්‍රීවරුන් මෙම ප්‍රශ්නය පිළිබඳව දරන අදහස් සමයි. වසරකට කෝටි 34ක පමණ ධනයක් මැණික්වලින් ලබා ගතහැකි නමුත් එම ධනයෙන් නිසි පල ලබාගෙන කටයුතු කරන්නට අප මෙතෙක් සුදුසු වැඩ පිළිවෙළවල් යොදා නොමැති එක කනගාටුවට කාරණයක්. අවුරුද්දකට ලක්ෂ 35ක පමණ මැණික් ප්‍රමාණයක් නීත්‍යානුකූල මාර්ගවලින් ලංකාවෙන් පිටරටවලට යවනවා. එහෙත් හොංකොං නගරයට පමණක් කෝටි 60ක පමණ මැණික් මේ රටේ මැණික් හැටියටම සඳහන් කොට යන බව වාර්තා වී තිබෙනවා. ඒ විශාල මැණික් ජාවාරම නවත්වා ගත්තොත් පාර්ලිමේන්තුවට ඇවිත් මේ අන්දමට මුදල් ඉල්ලන්නට වුවමනා වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ අවසරය ඇතුව මට වාර්තා කීපයක් ගැන සඳහන් කරන්නට පුළුවනි. මේ රටේ උප ඇමතිවරයකු වශයෙන් පවා වැඩ කටයුතු කර තිබෙන හිටපු මන්ත්‍රීවරයකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

වන සිරිල් ආටිගල මැතිතුමා මැණික් පිළිබඳව ප්‍රකාශ කර තිබෙන අදහස් මට ඉදිරිපත් කරන්නට පුළුවනි. එතුමා 1966 දෙසැම්බර් මස 20 වන දින පත්‍රවලට වාර්තා වක් දී තිබුණා. මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීම සඳහා තමන් බල යේ සිටි කාලයේදී උත්සාහ දැරූ නමුත් එය ඉටු නොවූ බව සඳහන් කරමින්, එහි යම් යම් අඩුපාඩු තිබේ නම් ඒවා සකස් කරගෙන මෙම රජයේ ප්‍රතිපත්තිවලට අනුව මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවන්නට ක්‍රියා නොකරන්නේ මන්ද කියන ප්‍රශ්නය එතුමා පත්‍ර මාර්ගයෙන් අසා තිබුණා. 1966 දෙසැම්බර් මස 20 වන දින "ඩේලි නිව්ස්" පත්‍රයේ ඒ ගැන සඳහන් වෙනවා. අපේ රටේ රබර්, පොල්, තේ යනා දී කර්මාන්ත දියුණු කිරීමෙන් ලැබෙන ලාබයට වඩා ලාබයක් මැණික් කර්මාන්ත ය දියුණු කිරීමෙන් ලබා ගන්නට පුළුවන් බව එතුමා කියනවා. 1967 මාර්තු මස 15 වන දින "ඩේලි මිරර්" පත්‍රයේ පළ වුණා, කෝටි 35ක මැණික් ජාවාරමක් අවුරුදු පතා කෙරෙන බව. රේගු නිලධාරීන් සහ මුදල් ඇමති අංශයේ නිලධාරීන් විසින් කරන ලද පරීක්ෂණයකට අනුව තමයි, එසේ කියා තිබෙන්නේ. අපේ පත්‍රවල නොවෙයි, රජයට ආධාර කරන රජයට උප දෙස් දෙන පත්‍රවලයි මේවා පළ වන්නේ. මේ රජයේ ඇතැම් ලොකු දේශපාලනඥයන් ගේ ආධාර ඇතුව මේ ජාවාරම කෙරෙන බව කෙළින්ම කියනවා. එතකොට මේවා ඔප්පු කරන්නට අපේ සාක්ෂි වුවමනා කරන්නේ නැහැ. ඇමති අංශයේ නිලධාරීන් කියපු දේවල් තමයි, ඒ. මා එම කොටස කියවන්නට කැමතියි. ඒ මෙසේයි :

Finance Ministry sources and customs sources.

"Political interference is the cause of gem smugglers getting off scot free. It cost the country Rs. 350 million annually. This was revealed to the "Daily Mirror" yesterday by Ministry of Finance sources who had made a survey of the smuggling racket at the local end."

මෙවැනි තත්ත්වයක් තිබෙද්දී එමගින් ලබා ගතහැකි ආදායම ලබා නොගෙන මේ අත්දමට ජනතාව මත බර පැටවීම සුදුසුද ?

"Gem smugglers rob the country of millions."

මේ 1967.7.10 වන දින "ඩේලි නිව්ස්" පත්‍රයයි. මේක කියා තිබෙන්නේ තිරු චෙල්වම් ඇමතිතුමායි. මේ රජයේ පළාත් පාලන ඇමතිතුමාත් එය කෙළින්ම පිළි ගන්නවා. රට සංවර්ධනය කරන්නට මැණික් ප්‍රශ්නයට අතගැසීම පමණක් ප්‍රමාණවත්ය යන්න එතුමාත් පිළිගන් නවා. මිරිස් කුඩු ටින්වල මැණික් ගෙන ගිය හැටි තමුන්නාන්සේලා දන්නවා නොවැ. මා එවැනි සිද්ධීන් එකක් එකක් ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මුදල් ඇමතිතුමාටත් රජ යටත් මා පෙන්වා දෙන්නේ එක් කාරණ යයි. ඇත්ත වශයෙන්ම අද මැණික් ගලක් හොරෙන් ගෙන යන්නේ නැතිව වෙළඳාම් කරන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. රජය කොපමණ උත්සාහ කළත්, රේගු නිලධාරීන් කොපමණ අවංක වුණත්, අද ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. හොරෙන් පිටරට පටවන්නේ නැතිව අද මැණිකක් විකුණන්නට බැරි තත්ත්වයක් තිබෙනවා.

හේතුව මේකයි. රුපියල් ලක්ෂයක් වටිනා මැණික් ගලක් අද සිංගප්පූරුවට හෝ හොංකොංවලට යැව්වාය කියමු. නීත්‍යනුකූල මුදලින් ඒ රුපියල් ලක්ෂයේ ගලට ලැබෙන්නේ රුපියල් 60,000 යි නැත්නම් රුපියල් 70,000 යි. නමුත් ඒ මුදල හොරෙන් මෙහාට ගෙනාවොත්— එහෙම නැත්නම් ඒ මුදලෙහි බ්ලැක් මාකට් වටිනාකම වැඩියි. කලු කඩේ පවුමක වටිනාකම රුපියල් 30 ක් පමණ වෙනවා. ඒ අනුව ලක්ෂයකට ගන්නා මැණික් ගල හොරෙන් පිටරට යවා රුපියල් 60,000 කට විකුණා ඒ මුදල එහිම තැන්පත් කර ජාවාරම් කළොත් ලක්ෂ දෙකක් පමණ උපයා ගන්නට පුළුවනි.

නමුත් නීත්‍යනුකූලව මේ ගල පිටරට යවන්නට මා සූදානම් වූවාය කියමු. වෙන් දේසියේදී එම ගලේ වටිනාකම රුපියල් 60,000 ය කියා මා තීරණය කරනවා. ඒ අනුව මා රුපියල් 60,000 වන තෙක් ඒ ගල ඉල්ලුම් කරනවා. නමුත් ජාවාරම් කර වන තැනැත්තාත්, ජාවාරම්කරුට ගල විකුණන තැනැත්තාත් එම ගල රුපියල් ලක්ෂයකට ඉල්ලනවා. ලක්ෂයකට ඉල් ලන කොට මට වෙන්දේසියෙන් ඉවත් වෙන්නට සිද්ධ වෙනවා. එම නිසා අද තිබෙන තත්ත්වය අනුව කෙනෙකුට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවදාවත් නීත්‍යනුකූලව මැණික් ගලක් පිටරට යවන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

නමුත්නාන්සේලා කරුණා කර රේගු නිලධාරීන්ගේ වාර්තා අරගෙන බලන්න. ඔය ලක්ෂ 35 ලබා ගන්නට පිටරට යවා තිබෙන්නේ වටිනා මැණික් ගල් නොවෙයි. බර, වටිනාකම, අඩු ගල්වලින් තමයි ඔය මුදල ලැබී තිබෙන්නෙ. ඒවා හොරෙන් ගෙන යන්නට බැරි නිසා ඔය පිළිවෙළට පිටරට යවා තිබෙනවා. මේ තත්වය නැති කර ගත හැකි මාර්ගයක් තිබෙනවා. කලින් මා සියලු දෙනාටම දොස් කිව්වා. නමුත් මා දැන් කියන්නේ මේ ගැන ක්‍රියා නොකළොත් වෙළෙන්දාගේ සහයෝගය ලබා ගැනීමටත් හොරෙන් මැණික් පිටරට යැවීම නැවැත්වීමටත් බැරි බවයි. වෙළෙන්දාගේ සහයෝගය ලබා නොගෙන හොරෙන් මැණික් පිට කිරීම නවත්වන්නට බැහැ. වෙළෙන්දාගේ සහයෝගය ලබාගත හැකි මාර්ගයක් තිබෙනවා. බේරුවල ගරු මන්ත්‍රීතුමාත් (එම්. අබ්දුල් බකීර් මයා.) මේ අවස්ථාවේදී මගේ කථාවට සවන් දී සිටීම ගැන මා සතුටු වෙනවා. මා රජයට මේ උපදේශයක් දෙන්නෙ. මාර්ගය මේකයි.

ඇතැම් කර්මාන්තවලට සියයට 20ක පමණ බෝනස් දීමේ ප්‍රතිපත්තිය දැන් රජය පිළිගෙන තිබෙනවා. ඒ ප්‍රමාණයට මැණික් වෙළෙන්දාටත් බෝනස් දීමෙන් පමණක් ඔහුගේ සහයෝගය ලබා ගන්නට බැහැ. මැණික් වෙළෙන්දාට ඊට වැඩි ප්‍රමාණයක බෝනස් දුන්නොත් මොකද වෙන්නෙ? අපට වුවමනා කරන්නේ මේ ප්‍රශ්නය විසඳෙන පිළිවෙළට කටයුතු කිරීම පමණයි. අපේ ආණ්ඩුව පෙරළුණාට මා නම් මේ ප්‍රශ්නය අත්හැර නැහැ. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව මා මැණික් වෙළඳුන් සමග සාකච්ඡා කළා. ඒ සාකච්ඡාව අනුව මට එක් මාර්ගයක් පෙනෙනවා. පළමුවෙන් අප කවුරුත් එකතු වී මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවිය යුතුයි. අපේ පනත් කෙටුම්පත වුවමනා නැහැ. වුවමනා නම් ඒක වෙනස් කර ගන්න. වෙනස් කර සංයුක්ත මණ්ඩලයක් පිහිටුවන්න. ඊට පසු නීත්‍යානුකූලව කෝටියක මැණික් පිටරට යැව්වොත් සියයට 50 ක බෝනසක් දෙනවාය කියමු. ඒ ප්‍රමාණය වැඩිය කියා ආණ්ඩුව කියන්නට පුළුවනි. වැඩි නම් ටිකක් අඩු කර ගන්න. එසේ කටයුතු කර මැණික් ගල් නීත්‍යනුකූලව පිටරට යවන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරමු. එසේ කර කෝටියක මැණික් පිටරට යැව්වොත් අපට වෙනදා නොලැබෙන කෝටි භාගයක් ලැබෙනවා. එතකොට අපට පාඩුවක් නැහැ.

ඊළඟට, ඒ දෙන බෝනස්වලිනුත් අසුවල් අසුවල් බඩු ලංකාවට ගෙන්වන්නටය කියා ඒ වෙළෙඳුන්ට කියන්නට පුළුවනි. කුමන ද්‍රව්‍ය වුවත් කමක් නැහැ. දැනට නොගෙන්වන බඩු ගෙන්වන්නටය කියන්නට පුළුවනි. "සුඛෝපභෝගී බඩු" වුවත් කමක් නැහැ. එතකොට තවත් ප්‍රයෝජනයක් ලැබෙනවා. කලු කඩේ මුදල් ජාවාරමත් කැඩෙනවා. අද හොංකොංවලට හෝ ජපානයට යන කෙනෙකුට ටේප් රෙකෝඩරයක් හෝ රෙකෝඩ් ප්ලේයර් එකක් හෝ වුවමනා වූවාය කියමු. දැන් ඔහු කරන්නේ වෙළෙන්දා ළඟට ගිහින් වෙළෙන්දාගේ මාගීයෙන් එකට තුනක් ගෙවා හොංකොංවලදී නැත්නම් ජපානයේදී මුදලක් ලබා ගැනීමයි. එතකොට පවුමක වටිනාකම රුපියල් 30ක් වෙනවා. නමුත් මා මේ පෙන්වා දෙන ක්‍රමය උඩ වෙළඳුන්ට බෝනස්වලින් ලංකාවට කෙලින්ම එවැනි බඩු බාහිරාදිය ගෙන්වන්නට පුළුවනි. රජයට කියන්නට පුළුවනි අසුවල් අසුවල් බඩු බාහිරාදිය ගෙන්වන්නටය කියා. ඒ ආකාරයට බඩු ගෙන්වුවහොත් රේගු ගාස්තුවලින් ලැබෙන ආදායමත් වැඩි වෙනවා. ඒක රජයට තවත් ලාභයක්. එතකොට මට වුවමනා නම් ටේප් රෙකෝඩරයක් වැනි හොයා ගන්නට අමාරු දෙයක් ගන්නට, එය වෙළඳ පොලේ තිබෙනවා නම් එතැනින් ගන්නට පුළුවන්. ඒ මුදල නැවත රටේ ඉතිරි වෙනවා. භාගයක් බෝනස් හැටියට දුන්නත්, විදේශික මුදලෙන් එදා නොලැබුණු ගණනෙන් භාගයක් ලැබෙනවා. අනික් පැත්තෙන් කළු කඩ ව්‍යාපාරයේ මුදල් ජාවාරම බහිනවා. අවුරුදු ගණනක් මෙහෙම කරන විට නැවත සාකච්ඡා කර බෝනස් එක අඩු කරන තත්ත්වයක් ඇති කරන්නට පුළුවන්. මෙහෙම ක්‍රමයක් ඇති නොකර කවදාවත් මේක කඩන්නට බැහැ. ඇයි මේකටවත් අප ගන්නෙ නැත්තෙ? අවුරුද්දකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය භාණ්ඩාගාර බිල්පත්‍ර ආඥා පනත: සම්මතිය

[වීරසේකර මයා.]

මේ රටේ නිපදවන මැණික්වල වටිනාකම කෝටි 35 ක් වෙනවා. ඒක ඒ පැත්තත්, මේ පැත්තත් දෙපැත්තම පිළිගන්නවා. මැණික් සංයුක්ත මණ්ඩලයක් ඇති කර ඒ මගින් මැණික් පිටරට යැවීමට සැලැස් සුවොත්, ඒ කෝටි 35 ක මැණික්වලින් කෝටි 10 ක මැණික් සංයුක්ත මණ්ඩලය මගින් ගියොත්, සියයට 50 ක් බෝනස් දුන්නත් වෙනදා නොලැබුණු කෝටි 5ක් රටට ලැබෙනවා. බෝනස් එකෙන් ගෙනෙන බඩුත් ගෙනෙන්නේ. වෙනදා අපට නොලැබුණු මුදලකින්. එසිනුත් රුපියල් ආදායමක් රජයට ලැබෙනවා. ඒ නිසයි, මා මේ රජයට චෝදනා කරන්නේ. මේ රජය පත් වුණාට පසු ඇමතිතුමත් මැණික් සංයුක්ත මණ්ඩල ප්‍රශ්නය ගැන කථා කළා. ඔව්, ඔව්, ඒක කරනවාය කිව්වා. එහෙත් නොයෙක් බලපෑම් ආවාට පස්සේ ඒක අමතක කර දැම්මා. මේ මැණික් ප්‍රශ්නය දේශපාලන ප්‍රශ්නයක් හැටියට නොවෙයි, අප පිළිගන්නෙ.

විදේශික ධනය දස ලක්ෂයක්, විසි ලක්ෂයක් මේ රටේ ඉතිරි කිරීම සඳහා ව්‍යාපාර ඇති කිරීමට තමුන්නාන්සේලා කෝටි ගණන් වියදම් කරනවා. රට ණය කර ඒවා කරනවා. එහෙත් රටේ තිබෙන මැණික් ධනය මුදල්වලට පරිවර්තනය කරන්නට තමුන්නාන්සේලා ලැස්ති නැහැ, තමුන්නාන්සේලාගේ දේශපාලන ආධාර කාරයන්ගේ විරුද්ධත්වය නිසා. අද තත්ත්වය උඩ ඇතැම් වෙළෙන්දොත් මැණික් සංයුක්ත මණ්ඩලයට අත දෙන්නට ලැස්තියි. මා හිතන පිළිවෙළට ඒක බේරුවල ගරු මන්ත්‍රීතුමත් (අබ්දුල් බකීර් මාකර් මයා.) අනුමත කරයි. එහෙත් රජය ලැස්ති නැහැ. මොකක්ද මේකෙ රහස? පත්‍රය කියන දේද මේකට රහස? මේ මැණික් ජාවාරම පිටිපස ලොකු දේශපාලනඥයන් සිටිනවය කියා පත්‍රය කියනවා. රහස ඒකද කියා මා අහන්නට සතුටුයි. ලොකු වෙළෙන්දනුත් මේකට අත දෙන්නට ලැස්ති නම් රජය මේකට විරුද්ධ. රජය තුළත්, රජයට ආධාර කරන ලොකු දේශපාලනඥයන් අතරත්, වෙලෙන්දන්වත් වඩා ලොකු ජාවාරම් කාරයන් සිටින නිසාද කියා මට අසන්නට සිදු වී තිබෙනව. මේක පාපයක්

ගරු කථානායකතුමනි, රත්තරන් තිබෙන රටවල් ඒ රත්තරන්වලින් මුදල් නිපදවා රට සංවර්ධනය කරගෙන යනවා. රට අගුරු තිබෙන රටවලුත් ඒ විධියට කරනවා. තමුන්නාන්සේලා මන්නාරම පැත්තේ පෙට්‍රෝලියම්—ඛණිජ තෙල් වගී—තිබෙනවාද කියා සොයන්නට ලක්ෂ ගණන් වියදම් කරගෙන වැඩ කරනවා. ඛනිජ තෙල්වලින් ලැබෙන ආදායම වගේ දස ගුණයක ආදායමක් ලබා ගන්නට පුළුවන් මැණික්—සොයන්නට වුවමනා නැහැ—තියෙන බව දැනගෙනත් තමුන් නාන්සේලා ඒ ගැන කටයුතු නොකරන්නේ ඇයි කියා මා අහනවා.

රේගු නිලධාරීන් පුහුණු කිරීමේ ප්‍රශ්නය ගැනත් මෙතැනදී ගරු ඇමතිතුමාට මතක් කරන්නට ඕනෑ. රේගු නිලධාරි මහත්වරුන්ට අප බොහොම චෝදනා කරනවා. ඒ අය හැමදාම පහර කනවා. එහෙත් ඒ අය අතරත් සිටිනවා, වැඩ කරන්නට කැමති අය. ඒ අය අතර ඉන්නවා, අවංකව වැඩ කර අමාරුවේ වැටුණු අය. රජය මේ ප්‍රශ්නය විසඳීමට අත දෙන්නෙ නැත්නම් ඒ රේගු නිලධාරි මහත්වරුන්ට කරන්නට දේකුත් නැහැ. හැම දෙනාගේම ඇඳුම් ගළවා පරීක්ෂා කරන්නට ගියොත් තමුන්නාන්සේලාගේ සංචාරක ව්‍යාපාරයත් ඉවරයි.

මගේ අනෙක් චෝදනාව මේකයි. මේ රජය සංචාරක ව්‍යාපාරය දියුණු කර මුදල් ලබා ගන්නට උත්සාහ කරනවා. අද තියෙන තත්ත්වය උඩ තමුන්නාන්සේලා කරන්නෙ මොකක්ද කියා දන්නවද? අද මේ රටට එන සංචාරකයන් මගින් තමයි, හොරෙන් පිටරට යවන මැණික් වලින් බාගයක් යවන්නේ. සංචාරකයින් වැඩි වීමෙන් හොර ජාවාරම්කාරයින් වැඩි වීමයි අද නම් කෙරෙන්නේ. ගරු ඇමතිතුමා ඒ ගැන දන්නවාදැයි මා දන්නේ නැහැ. සමහර විට එතුමා දන්නවා වෙන්නටත් පුළුවනි, නොදන්නවා වෙන්නටත් පුළුවනි. පසුගිය දා බොක්සිං ගහන්නට අපේ රටට ආ අය අතරත් මේ ප්‍රශ්නය ඇති වුණා. වුවමනා නම්, පුද්ගලයන්ගේ නම් ඇතිව මට විස්තරය කියන්නට පුළුවනි. මහා ලොකු තරගයකට විදේශිකයන් මෙහාට ආවා. ඒ කොටස් දෙකක් අතර මැණික් ජාවාරම් ප්‍රශ්නය උඩ තරගයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති වුණා. ඒ ගැන විස්තර එහෙම මගෙන් අහන්නට එපා. ඇහුවොත් පුද්ගලයන්ගේ නම් පවා ඇතිව, නිලධාරීන්ගේ නම් පවා ඇතිව කියන්නම්.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

කොටස් දහයක් අතර තරඟ ඇති වුණා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

මැණික් ජාවාරම් කරන ලොකු මුදලාලිලා දෙන්නෙක් අල්ලගෙන මැණික් යවන්නට වැඩ පිළිවෙළක් ගෙන ගියා. එයින් ලොකු හැප්පිල්ලක් ඇති වුණා. ඊට පස්සේ ඒ මුළු සිද්ධියම එළි වුණා. අන්තිමේදී ඒ වැඩේ කරන්නට බැරි වුණා. ඒ අය මෙහාට ආවේ අවංකවම බවට කිසිම සැකයක් නැහැ. එහෙත් දහ දෙනෙක් ආවාම ඒ දහ දෙනා අතර වුණත් මුදල් වලට ආශා කරන්නත් ටික දෙනෙක්වත් ඉන්නට පුළුවනි. ඒ අය ගැන සොයාබලා තමන්ගේ ජාවාරම හරියාකර කරන්නට බලාපොරොත්තු වන ජාවාරම්කාරයින් ඉන්නවා. තමුසෙට මෙහේ ඉන්න කාලයේ ඔක්කොම වියදම් දෙන්නම්, ගමට ගියාම තව රුපියල් ලක්ෂයකුත් ගෙවන්නම්. මෙන්න මේක ගෙන යන්නැයි කිව්වාම ඒ ගැන කල්පනා කරන්නට සූදානම් වන අය ඒ දහදෙනා අතර ඉන්නට බැරිකමක් නැහැ. ඒ මාර්ගයෙන් මැණික් ජාවාරම කරන්නට මුදලාලිලා අදහස් කළා. මැණික් ජාවාරම සඳහාමත් සංචාරකයින් වාගේ එන අය ඉන්නවා. ඒ, හොර මැණික් ජාවාරම්කාරයෝ. ඒ උදවිය සංචාරකයින් හැටියට එනවා. එන්න එන්නම මේ ජාවාරම් වඩ වඩාත් උග්‍ර වෙනවා මිස එයින් අපට නම් ලාභයක් වන්නේ නැහැ.

රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මෙහි නැහැ. සංචාරක ව්‍යාපාරය නිකම් විකාරයක් කළා, එතුමා. එක් විවාදයකදී විවේචනය කරන විට එතුමා මහා ලොකු වට කිව්වා, සාකච්ඡා කර උපදෙස් ලබා ගන්නට බලාපොරොත්තු වෙනවාය යනුවෙන්. ඒ කොයි හැටි වෙතත්, ගිය අවුරුද්දේදී කෝටි දෙකක් පමණ සංචාරක ව්‍යාපාරයෙන් පාඩු වුණා. පුවත්පත් වල පළ වන තොරතුරු, ආරංචි අනුවයි ඒ බව දැන ගත්තේ. පොත්පත්වල පෙනෙන හැටියටයි ඒ පාඩුව පෙනී ගියේ. එහෙත් යටින් ගිය දේ මගින් වූ පාඩුව කොතෙක් දැයි සොයා දැනගන්නට පුළුවන්කමක් තිබෙනවා නම් පාඩුව කෝටි විස්සක් ඉක්මවා යන්නක් හැටියට පෙනී යනවා ඇතැයි මා කියනවා. මට ලැබී තිබෙන ආරංචි අනුවයි මා කථා කරන්නේ. මේ අවුරුද්දේ සංචාරක සේවයෙන් වන පාඩුව තුන් කෝටියක් පමණ වන්නට පුළුවනි. එයින් අපට ලැබෙන ලාභයක් නැහැ. ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ හෝටල් හදන්නටයි. වෙන රටවල සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට කරන දේ ගැන මෙහිදී සඳහන් කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එය කරන්නට ගියොත් පැය තුන හතරක් වුවමනා කරනවා. සංචාරක ව්‍යාපාරය දියුණුවට කරගෙන යන්නට පළමුවෙන්ම ඒ සඳහා රටේ නිසි තත්ත්වයක් ඇති කරන්නට ඕනෑ. මේ රටට පැමිණ දවසක් මෙහි නතර වී සිට පසුවදා ආපදු පිටත් වී යන්නට එන සංචාරකයා දවස තුන හතරක් මේ රටේ නවතා ගැනීමට පුළුවන් වන තරම් විමධිත් වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. ඒකයි අපේ ඉලක්කය විය යුත්තේ. එයින් තමයි සංචාරක සේවය ලාභ සහිත එකක් හැටියට පවත්වාගෙන යනන්ට පුළුවන් වන්නේ. යුරෝපය, ඇමෙරිකාව ආදි නොයෙකුත් විදේශීය රටවල සිට එන සංචාරකයින් ලංකාව දිහා පමණක් බලාගෙන එන්නේ නැහැ. ඒ අය මෙහිදී බැහැලා දවසක් මේ රටේ ගත කරනවා. ඊළඟට තමන් කැමති තවත් රටකට යනවා. කොපමණ හෝටල ඇති කළත් ගොඩ බහින සංඛ්‍යාව දාහක් නම් එය දෙදාහක් කර ගන්නට බැහැ. එහෙම වන්නේ නැහැ. සැලැස්මක් ඇතිව වැඩ කටයුතු ටික කරගෙන යන්නට ඕනෑ. අවශ්‍ය විධිවිධාන නිසියාකාර ඇති කරන්නට ඕනෑ. දවසක ගත කරන්නට එන අය දවස් තුන හතරක් තබා ගන්නට පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කළොත් වැඩිපුර ආදායම් ලබා ගන්නට ඉඩ ඇති වෙනවා. එන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

කොට තුන් ගුණයක් ආදායම ලැබේවි. හෝටල්වලින් මෙය කරන්නට බැහැ. ඉස්සර මේ රටට ආ උදවිය ගෝල්පේස් හෝටලයේම හිටියා. දැන් හෝටල් ගණනාවක් තිබෙනවා. ඒ නිසා දවස් තුන හතරක් නතර වෙතැයි සිතීම හරි නැහැ. එහෙම කිව්වට වැඩක් නැහැ. මේ රටේ සංචාරකයන්ට පෙන්වන්නට—අතපය මිරි කන තැන් නොවෙයි—ස්ථාන ඇති කර ගන්නට ඕනෑ. ප්‍රචාරක මාර්ගයක් වශයෙන් අපේ වස්තු සංචාරකයන්ට පෙන්වන්නට ඕනෑ. හෝටල් ඇති කරතොත් එය සැලැස්මක් ඇතිව කරන්නට ඕනෑ. සංචාරකයින් නතර වන්නේ කොළඹ හෝටල්වල පමණක් නොවෙයි. අද පැමිණ හෙට යන අය හෝටල් ක්‍රමයෙන් වැඩි දවසක් නතර කර ගන්නට බැහැ. ඒ බව මම පෙන්වන්නම්. මහනුවරත්, තිරිකුණාමලයේත්, යාලත්, ඔය ආදී වෙනත් ස්ථානවලත් එතකොට හෝටල් ගහන්නට සිදු වේවි. මෙය කරන්නට පුළුවන් වැඩක් නොවෙයි. තමන්ට ආධාර කළ ඇතැම් ධනපතියන්ට මුදල් හම්බ කර ගන්නට මාර්ගයක් සොයා දීම පමණයි එයින් කර තිබෙන්නේ. කරන්නට පුළුවන් වැඩ තවත් තිබෙනවා.

ගරු ආහාර හා කෘෂිකර්ම ඇමතිතුමා මෙතැනට දැන් පැමිණි නිසා මම තවත් පොඩි ප්‍රශ්නයකට බහින්නම්. තේ, රබර්, පොල් ආදිය වගා කිරීමෙන් පමණක් නොවෙයි ආදායම් ලබා ගත හැක්කේ. වෙනත් අමු ද්‍රව්‍ය වගා කිරීමෙන් පමණක් නොවෙයි ආදායම්, ලාභ, ලබා ගත හැක්කේ. ඇස් ඇර බැලුවොත් ඒ බව පෙනේවි. විදේශීය ධනය හම්බ කර ගන්නට නොයෙක් ක්‍රම තිබෙන බව මා පෙරත් කියා තිබෙනවා. 'මල් වගාව ඉතා හොඳ ආදායමක් ලැබෙන ආකාරයට—හොඳ විදේශීය විනිමයක් ලැබෙන ආකාරයට—කරගෙන යන්නට පුළුවනි. මල් පිටරට පැටවීමෙන් කෝටි ගණන් හම්බ කර ගන්නට පුළුවන් බව කිව්වාම මීට ඉස්සරවෙලා බොහෝ දෙනෙක් මට හිනා වුණා. මල් පමණක් පිටරට යැවීමෙන් හවායි දූපත රුපියල් කෝටි 4½ ක තරම මුදලක් හම්බ කරනවා. මල් පැළ සමග නොවෙයි, තනි මල් පමණක් පිටරට යවා එතරම් විශාල මුදලක් හම්බ කර ගන්නවා. මල් පිටරට යැවීමෙන් සිංගප්පූරුව රුපියල් ලක්ෂ 120 ක තරම මුදලක් හම්බ කරනවා. මේ රජයත් ඔය ප්‍රශ්නයට දැන් අත ගසා තිබෙනවා. අත ගහල තිබෙන්නෙ කොහොමද? අනික් ප්‍රශ්නවලට අත ගැහුව වගේමයි. දැන් මහනුවර සාකච්ඡාවක් කරගෙන යනව, මල් පිටරට යවන්ට සංවිධාන ඇති කරන්නෙ කොහොමද කියා. ප්‍රංශයේ හෝ ජර්මනියේ තානාපතිතුමා මෙහාට ඇවිත් බොහොම අවංකව හොඳ හැඟීමක් ඇතිව මේක කරන්ට පුළුවන් යයි හිතාගෙන මල් පිටරට යැවීමට වෙළඳ අමාත්‍යාංශය සමග සාකච්ඡා කරගෙන යනව. තවම පිටරට යවන්ට තරම් මල් ප්‍රමාණයක් ලංකාවේ නැහැ. ලංකාවේ වවන මල් ඔක්කොම එකතු කළත් සතියකට වරක් එක සිල්ලර වෙළෙන්දකුට මල් තොගයක් යවන්ට තරම් ප්‍රමාණවත් නැහැ. මේ ගැන මගෙනුත් ඇහුව. මම ඒ අවස්ථාවෙදි කිව්ව, තමුන්නාන්සේලා අත ගහල තිබෙන්නෙ පිස්සු ප්‍රශ්නයකටයි කියා. ඉස්සරවෙලාම අනිකුත් අංශවලට අත දෙනවා වගේ මල් වවන්ට අපි සංවිධාන ඇති කරමු.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ මේ ගැන ටිකක් දන්නව. එංගලන්තයේ එක ඇන්තුරියම් මලක් සිලිං 8 යි. මට ඊයෙ-පෙරේද ඕඩරයක් ආව: ඒ උදවිය සතිපතා මල් 3,000 ක් ඉල්ලනව. මම දනුම් දුන්න, මේක දන්ම අපට කරන්ට බැහැ; තව අවුරුද්දකින් විතර සලකා බලන්නම් කියා. පසුගිය සතියේ ලෙනාඩ් නමැති මහත්මයෙක් එංගලන්තයේ සිට ලංකාවට ආව. ඒ මහත්මයා ලැහැස්තියි, සතියකට වරක් අහස් යාත්‍රාවකට සෑහෙන ඇන්තුරියම් සහ ඕකිඩ් මල් තොගයක් මේ රටෙන් මිළ දී ගන්න. ඒ කියන්නෙ ඒ පුද්ගලයාගෙන්ම මේ ගනුදෙනුවෙන් අපට විදේශ ධනය පවුම් 20,000 ක් තරම ලබා ගන්න පුළුවන්. එහෙත් රටේ මල් නිපදවීම මදි. ඒ නිසා කරුණා කර කෘෂිකර්ම ඇමති අංශයට කියන්න, මේකත් වැදගත් ව්‍යාපාරයක් හැටියට සලකල, විදේශ ධනය උපයා ගන්නට පුළුවන් ව්‍යාපාරයක් හැටියට සලකල, රැකීරක්ෂා දෙන්නට පුළුවන් ව්‍යාපාරයක් හැටියට සලකල, මේ පිළිබඳව දන්න උදවිය කැඳවල සාකච්ඡාවක් පවත්වල මේ වගාව ව්‍යාප්ත කරන්ට යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කරන්න කියා. ඒ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

කියන්නෙ, මේ කර්මාන්තය පිළි අරගෙන ඊට අත දෙන්ට මාගී සොයාගෙන කටයුතු කළොත් තමුන්නාන්සේලා පිළි ගන්නව ඇති, එක ඇන්තුරියම් අක්කරයකින් තේ අක්කර විසි පහකින් ලැබෙනවාට වඩා විශාල ලාභයක් ලබා ගන්ට පුළුවන් බව. මට එහෙම කියන්ට පුළුවන්කම තිබෙන්නෙ මම මේ ව්‍යාපාරයෙන් ලාභ ලබා ගන්න නිසයි. මේ වගේ ප්‍රශ්නවලට බාගෙට අත ගහල නොදන්න නිලධාරීන්ට මේව භාර දීමෙන් ප්‍රයෝජනයක් නැහැ. ඒ උදවිය දැන් සාකච්ඡා කරන්නෙ මල් පිටරට යවන්නටයි. වගා කරන්ට නොවෙයි.

වෙළඳ අමාත්‍යාංශය දොස්තර මහත්මයෙකුට භාර දුන්න, සෞඛ්‍ය අමාත්‍යාංශය භාර නොදී. සෞඛ්‍ය අමාත්‍යාංශය පරණ මුදල් ඇමතිතුමෙකුට භාර දුන්න. උන්නැහේගෙ සෞඛ්‍ය තත්ත්වය නම් බොහොම හොඳයි. අධ්‍යාපන අංශයට සුදුස්සෙකු සිටිද්දී වෙනත් කෙනෙකුට අධ්‍යාපන අංශය භාර දුන්න. එක් එක්කෙනාගේ හිත සන්තෝෂ කර හත් හවුල තර කර ගන්න ඇමති අංශ බෙදුවායින් රට එරුණා. ආහාර ඇමතිතුමා භාරගෙන තිබෙන්නෙත් කරන්ට පුළුවන් ඉලව්වක් නොවෙයි. දන්න එක අතහැරල වෙන එකකට අත ගැහුව. තමුන්නාන්සේලාගේ හත් හවුල තුළ තිබෙන භේද නැති කරන්ට ඇමති අංශවල වගකීම් බෙදා දීමෙන් එරුණේ රටයි. අඩු වශයෙන් කැබිනට් සංශෝධනයක්වත් කරන්ට කියන ආණ්ඩු පක්ෂයේ පිටුපස මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අපිත් අනුමත කරනව. අපි ළඟදීම බලයට එනව. එහෙත් අපටත් මේ ප්‍රශ්න නිරාකරණය කරන්ට බැරි වන තත්ත්වයට තමුන්නාන්සේලා රට පත් කරන්ට ඉස්සර වෙලා මේ ඉස්සරහ පේළියේ සිටින මිනිසුන්ට නැති ඥානයක්වත් දීල කැබිනට් මණ්ඩලය තුළ ප්‍රතිසංවිධානයක් නොකළොත්, රට භයානක ප්‍රපාතයකට වැටෙන බව මතක් කරන්ට ඕනෑ. නිකම් පිටුපස්සෙන් ඉඳන් කෑ ගැහුවට මදි. මොකක් හරි කරන්ට ඕනෑ. ඉඟුරු කල්ලිය, අර කල්ලිය, මේ කල්ලිය, කිව්වට වැඩක් නැහැ. [බාධාකිරීමක්] මම මේ කියන දේ උන්නැහේලාත් පිළි ගන්නව. දැන් උන්නැහේලාටත් එපා වෙලා. ඉස්සර නම් අප කථා කරන විට බොහොම ගොර වන අය දැන් ටිකක් අප කියන දේ අසා ගෙන සිටිනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කථා කරද්දීත් ඒ උදවිය බොහොම ඕනෑකමින් අසා ගෙන සිටියා. දැන් උන්නැහේලාගේ ඡන්ද දායක කොට්ඨාශවලට යන්නට පවා බැරි තත්ත්වයක් ඇති වී තිබෙන බවත් උන්නැහේලා පිළිගන්නවා. උන්නැහේලා බලයට පත් කරන්නට ආධාර දුන් පත්තරත් දැන් බණින්නට පටන් ගෙන තිබෙනවා. එම නිසා, දැන්වත් තමුන්නාන්සේලාට ගමට යන්නට පුළුවන් තත්ත්වයක් තියා ගන්නට ඕනෑ නම්, ඔය ඉස්සරහට වී සිටින හැට හැත්තෑව පිරුණු කට්ටිය අයින් කර තරුණ තමුන්නාන්සේලාවත් ඉදිරිපත් වී රට බේරා ගන්නා ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 4.7

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Sir, I do not propose to reply to all the speeches that were made by the other side for the simple reason that they referred to matters not entirely relevant to this Resolution. But I wish to make a few remarks in respect of those criticisms which have some relevance to this Resolution.

I started by giving the history of these Treasury Bill limits. I think I should repeat that because some hon. Members do not seem to know the history of these Treasury Bill limits. The Treasury Bill limit was only Rs. 200 million in 1959. Some of the hon. Members who criticized this Government so bitterly for trying to increase this limit by another Rs. 250 million due to circumstances which I shall describe in a moment, will realize what their performance was in the field of Treasury Bill limits during their time, against the background of a saving of Rs. 11,250 million foreign exchange and also an internal saving of about Rs. 300 million to Rs. 400 million.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The Treasury Bill limit was Rs. 200 million in 1959. On the 9th of April 1959 they raised it by another Rs. 150 million. Again on 29th of October 1959, for the second time in a year, they raised it by another Rs. 100 million. Then on August 23, 1960, they raised it by another Rs. 200 million. Now, these are the very people who are criticizing in a very big way our request for an increase in the limit

Then in June 1961 they raised it by another Rs. 100 million. Again in December 1961 they raised it by another Rs. 250 million. In March 1963 they raised it by another Rs. 150 million. Then again in 1963 they raised it by another Rs. 100 million.

Now, Sir, during the time of the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) he raised it by another Rs. 250 million. He was in office for only six months, and had he continued for six years and maintained that rate of increase what would have been the fate of this country ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I only introduced a Motion of the previous Finance Minister.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

But it was introduced during your time. At that time I did not blame you because I knew why you had to raise the limit. You had to face the evil results of some of the economic measures of the previous Government.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Your Government's period included 1956.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Although some people criticized you at that time I did not say a word about it because you were facing the evil results of the economic position at that time.

Hon. Members were talking of unfinanced gaps. The hon. Member for Colombo South, Mr. Bernard Soysa, also referred to unfinanced gaps. I have a fine record to show of unfinanced gaps, and are you surprised that this country is in an economic mess after your performance in this field ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You are not much better.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Anyhow, let me make you realize that we took over a depleted Treasury.

In 1956-57 the unfinanced gap was Rs. 3 million ; that was not your responsibility but that of the then U. N. P. Government. In 1957-58 it was Rs. 65 million. In 1958-59 it was Rs. 180 million ; in 1959-60, Rs. 230 million. Are you surprised that the Treasury Bill limits were raised ? In 1960-61 the unfinanced gap was Rs. 250 million ; in 1962-63 it was Rs. 125 million ; and in 1963-64 it was Rs. 125 million.

The hon. Member for Colombo South (Mr. Bernard Soysa) was alarmed that there was a big disparity between my estimates of revenue and actual realization—[*Interruption*]. He is a master at swallowing camels and straining at gnats. He has swallowed all these figures—Rs. 65 million, Rs. 180 million, Rs. 230 million, Rs. 125 million and another Rs. 125 million. He envisaged no unfinanced gap during the time his leader was Minister of Finance, but it had gone up to Rs. 50 million. There were two

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

circumstances which helped him. One is that although he had estimated a certain amount of expenditure under the guaranteed price scheme, he spent as much as Rs. 60 to Rs. 70 million less than what he estimated.—[*Interruption*]. I also tried to keep the unfinanced gap as small as possible. Now he is talking of taxation measures which were not spoken of in the Budget.

Put it this way: that which was nought has gone up to Rs. 45 or Rs. 50 million. That is, the unfinanced gap has risen fifty times more than he anticipated. His figures were wrong. My estimate in respect of the unfinanced gap for 1965/66 was Rs. 81 million but it went up to Rs. 121 million. I shall tell you why. It went up because of the expenditure we had to incur for the thousand handlooms.—[*Interruption*]. When you take away that item of expenditure I was not far wrong in my estimate of the unfinanced gap. If I had followed the example of the hon. Member for Yatiyantota when he was Minister of Finance, then the unfinanced gap would have been 81 x 50 !

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

This is a real *ganan sastharé*.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

For 1966-67 the estimated unfinanced gap was Rs. 51 million. It has gone up to Rs. 75 million according to the latest figures, and that, mind you, after meeting an expenditure of Rs. 55 million on the tea subsidy. I am not saying this to detract from the performance of my hon. Friend, the Member for Yatiyantota, when he was Minister of Finance, but I was surprised to see the hon. Member for Colombo South (Mr. Bernard Soysa) make nothing of things done previously by others and make much of our trifles.

ලෙස්ලි ගුණවර්ධන මයා.
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

One constant factor in all these unfinanced gaps is the Hon. Minister of Lands. He is now there.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

They have been good Friends, Sir. They were working together.

Then they asked me about the same bogey, the World Bank, and said that they had dictated to me, and all that kind of thing. I have replied to it earlier,.

Some people try to make out that the World Bank wants us to cut down on our social service expenditure. The World Bank has said nothing of the kind. The World Bank has advised us to develop as much as we can, to spend as much as we can on social services after getting a return from our development.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

That is not their report anyhow. That is your interpretation of it.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Then the question was asked of the Rs. 125 million in foreign aid with which I was hoping to balance the Budget, and whether I have got it. Just three months have passed and I cannot say exactly what I have got so far. The performance up to the end of the last financial year, I have given you in the course of the Budget Debate. We are not altogether unhopeful of getting this amount in the course of this year.

Then they were asking about devaluation. In our broad calculations we saw to it that we took note of certain repercussions of devaluation,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

and we found that without doing much violence to the Estimates presented in the course of the Budget Debate we would be able to go through, unless of course some other unexpected factors set in. We expected to know the situation in two or three months, but another element has crept in. The recent strikes have presented an artificial picture. The tea did not move, the rubber did not move, with the result that people did not come and buy in the way they would have bought had there been no strike. So, the situation being still artificial, we want a few months to watch. I assure this honourable House that I will make a statement in due course. As I said, the strikes have created an artificial situation because, as a result of the goods not moving, there is nothing to sell to the people who were buyers of our produce. Therefore, naturally, prices got depressed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

How much foreign exchange have you got?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Then he spoke of a credit squeeze. He said the World Bank had asked us to squeeze credit and that therefore we squeezed credit. Nothing of the sort has happened. Credit has expanded.—[*Interruption*]. Certain things, when you squeeze, expand. Our credit has expanded as a result of squeezing it. I will show you how. So, either we have had no advice from the World Bank to squeeze our credit or our credit has expanded as a result of our squeezing.

Look at the figures. Consider the Department of National Housing loans. For 1963 it was Rs. 5.2 million, for 1964 it was Rs. 2·8 million, for 1965 it was Rs. 5.1 million and for 1966 it was Rs. 16.9 million.

Consider the loans granted by the State Mortgage Bank. They have given loans in an amount of Rs. 3.1 million in 1963, Rs. 3.5 million in 1964, Rs. 3.9 million for 1965 and Rs. 5 million for 1966.

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ දෙවන මන්ත්‍රී)
(திரு. பேர்னுட் சொய்ஸா—கொழும்பு தெற்கு இரண்டாம் அங்கத்தவர்)
(Mr. Bernard Soysa—Second Colombo South)

What about the People's Bank?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

The People's Bank has the best record.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்சா)
(Mr. Bernard Soysa)

On what? On small loans?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Wait, I will tell you.

Consider the loans granted by commercial banks. It was in connection with these that you referred to a squeeze. In 1964 they have granted loans to the extent of Rs. 783 million, in 1965 Rs. 850 million, in 1966 Rs. 858 million and in 1967 Rs. 1,031 million.

So you will see that we have not been dictated to by the World Bank. You said you had received a report to say that the World Bank had asked us to squeeze credit. But what has happened? Do these figures indicate a squeeze?

Consider the advances made by some of these banks for agricultural development. From Rs. 35 million it has gone up to Rs. 40 million. What about advances to industries? In 1965 the figure was Rs. 74 million and in 1966 it was Rs. 125 million. And here, the People's Bank has the best record.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்சா)
(Mr. Bernard Soysa)

On what ?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

On this agricultural credit. Earlier they had gone up to only Rs. 20 million as the maximum. So far we have approved, I am told by the Minister of Agruculture, between Rs. 75 million and Rs. 80 million, and we hope to go still further.

So, where is this credit squeeze you are talking of ? This is a marvellous kind of squeeze. When you squeeze, it expands ! The more you squeeze the more it expands !

So, there is at least one field, you must admit, in which the advice of the World Bank to squeeze credit—if they advised at all ; I do not know whether it is because of our squeezing—has resulted in the bank credit having expanded. The trouble with squeezing——

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Depends on the area !

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Depends on what you squeeze and who squeezes.

I agree with the hon. Member for Yatiyantota that there is some delay in the publication of the Central Bank Bulletin. That is due to the strikes.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Everything is due to the strikes.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

There is a delay of about a month in the publication of this bulletin. I know that the hon. Member for Yatiyantota has nothing to do with strikes, but the delay is due to the strikes.

I must now deal with this question of the press. My hon. Friend quoted at length from a report in the press, some report that they have got from somewhere. The Opposition uses the press to suit their convenience. Sometimes when there is a statement in the press which is adverse to the Government they read it out here and they treat the paper as their Bible, especially the " Daily News ". When they find something in it which is critical of them, they say " Oh, that is the capitalist press ! We have nothing to do with it. Do not believe it. It is a set of lies." My hon. Friends cannot have it both ways.

The next point raised was that we have made a cut in the expenditure on education, health, roads, etc. That is not true. Look at the estimates and see what the position is. Here are the figures. Take for instance education : In 1964—65 the allocation was Rs. 373 million ; in 1965—66, Rs. 367 million ; in 1966—67, Rs. 402 million, and in 1967—68—that is the current financial year—it is Rs. 420 million. Where is this squeeze that you are talking of ?

Now, take the Ministry of Public Works. You say that there is a curtailment of expenditure but here are the figures : In 1963—64 the provision was Rs. 149 million ; in 1964—65, Rs. 151 million ; in 1965—66, Rs. 158 million, and in 1966—67 it was Rs. 198 million. We raised it from Rs. 158 million in 1965—66 to Rs. 198 million in 1966—67. This year we have kept it more or less at Rs. 199.9 million. So, where is this cutting down on expenditure ?

The hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) spoke about two patients who came to him and complained that they were not cured.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

How many hundereds of patients are there who were cured and who did not go to him ?—[*Interruption*]. On health the allocation in 1963-64 was Rs. 151.9 million.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
For what ?

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
On health.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
What do you mean ?

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
The overall allocation for 1964-65—that is my hon. Friend's period—was Rs. 156 million. In 1965-66 we raised it to Rs. 164 million ; in 1966-67 we raised it to Rs. 178 million, and in 1967-68 we have raised it to Rs. 190 million.

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය. (අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டி. பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)
That is why you have malaria !

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
That is not the only mosquito you have in this country.—[*Interruption*]. There are also political mosquitoes.

I do not think that I should dwell on this question any longer because the facts are very clear. However, the members of the S. L. F. P. are the last people who should complain against the raising of the Treasury Bill limit in this country. The Treasury Bill limit of Rs. 200 million was raised by them to Rs. 1,500 million. They did so not once a year but sometimes twice a year. And against what background ? Rs. 11,250 million in foreign assets saved and another Rs. 300 million to Rs. 400 million internal money saved in the Treasury. Against that background they raised the Treasury Bill limit from Rs. 200 million to Rs. 1,500 million. They are now cavilling at our suggestion to use another Rs. 250 million, if it becomes necessary. We are not going to take the Rs. 250 million today.

And for what reason do we want this money ? The prices of tea, rubber and coconut have slumped in a way that they have not slumped before. Also, as a result of devaluation we have to meet a certain amount of extra expenditure. In that background, we are asking the House to approve the raising of the limit by another Rs. 250 million. It is not that we are going to borrow Rs. 250 million straightway. What I cannot understand is that they can easily swallow camels but find it difficult to swallow a small gnat.

The other point was about the squeeze. There has been no squeeze in bank credit. They said the bank has advised or ordered us to do something ; if that were so, we have not carried out their order. Now, has there been any curtailment of the expenditure allowed on social services, health, education, roads and so on. There is nothing like that.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னட் சொய்சா)*
(Mr. Bernard Soysa)
Next Budget !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Let us wait.

I think I have said enough.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: පාරිතෝෂික හා දුම්රිය ගමන් බලපත්‍ර

## குறைநிரப்புத் தொகை: பணிக்கொடையும் புகைவண்டி ஆணைச்சீட்டும்

## SUPPLEMENTARY SUPPLY: GRATUITIES AND RAILWAY WARRANTS

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

I move,

"That a supplementary sum not exceeding Rupees Two hundred and fifty-four thousand (Rs. 254,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto :—

*Schedule*

Head 37—Pensions.

| | Rs. |
|---|---|
| Vote No. 2.—Administration charges—Recurrent Expenditure .. .. | 254,000." |

We are hoping to pay pensions to minor employees of assisted schools which have now been taken over by the Government.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்சா)
(Mr. Bernard Soysa)

There are some matters I want to bring to your notice.

පරිපූරක මුදල

There are just twenty five persons for whom you are passing pensions, but there is another problem. The Ministry of Education, the Ministry of Finance and the Ministry of Labour have neglected this entire field.

There was the problem of a certain number of minor employees—non-teacher employees—who were considered to be in excess of the sanctioned cadre. Of them some were dismissed and some had been kept on. Those who were kept on have been paid out of facilities fees.

Then, new recruits were taken over both to the teaching staff and to the non-teaching staff. They were also paid out of the facilities fees. We have pointed it out, the Auditor-General has pointed it out and the Public Accounts Committee has pointed it out ; they have said that there is no proper check upon the collection and expenditure of facilities fees.

Apart from that, there is a problem which the Hon. Minister of Labour must take note of. There is a category of employees, this very category to whom the Hon. Minister wants to pay pension, who are not public servants. They are not given the rights of public servants. On the other hand, they are treated as government employees ; and they cannot apply for relief to the Labour Department. There is no labour legislation covering—[*Interruption*].

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Sir, let us pass this item, and if there is any outstanding problem we shall take it up later.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்சா)
(Mr. Bernard Soysa)

Will you consider this question ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
Yes.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## කල් තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු එම්. ඩී. බණ්ඩා]

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக".—[கௌரவ எம். டீ. பண்டா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. M. D. Banda.*]

අ. භා. 4.30

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේදී මෙහි සිටීම ගැන මා සතුටු වෙනවා. මා අද අසන්නට බලාපොරොත්තු වන ප්‍රශ්නය ඊයේත් ඉදිරිපත් කළත් පිළිතුරක් ලබා ගන්න කාල වේලාව තිබුණේ නැහැ. එසේ හෙයින් අද නැවත වරක් කෙටියෙන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

1967-68 මුදල් වර්ෂය සඳහා පානදුර කොට්ඨාශයේ පාඨශාලා ගොඩනැගිලි සඳහා තවම නම් ප්‍රාදේශික අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ශතයක්වත් ලැබී නැහැ. මේක ඉතාමත්ම අසතුටුදායක තත්වයක්. මොන මොන පාඨශාලා ගොඩනැගිලි අවශ්‍ය දැයි මන්ත්‍රීවරුන්ගෙන් අසා එවා තිබුණා. ඒ වාගේම ප්‍රමුඛතා ලැයිස්තුවක් ඉල්ලා එවා තිබුණා. ඒ අනුව අප අවශ්‍ය පාඨශාලා ගොඩනැගිලි ගැනත් ප්‍රමුඛතාව හිමි විය යුතු ගොඩනැගිලි ගැනත් දන්වා යැව්වා. එහෙත් තවම නම් ඒ ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය මුදල් ලැබී නැහැ.

හේනමුල්ල මුස්ලිම් පාසල දෙවරු පාසලක් බවට පත් කරන්නට ගිය අවස්ථාවේදී එසේ කිරීම වළක්වා ගැනීම පිණිස තාවකාලික පාවිච්චිය සඳහා ගොඩනැගිල්ලක් සපයා දෙන්නට අප ක්‍රියා කළා. අයිතිකාරයාගෙන් ඒ ගොඩනැගිල්ල ලබාගෙන තිබෙන්නේ එක් පොරොන්දුවක් පිටයි. හැකි තරම් ඉක්මනින් පාඨශාලා ගොඩනැගිල්ලක් සාදන නිසා ඒ තාවකාලිකව ලබා ගත් ගොඩනැගිල්ල මාස ගණනක් ඇතුළත ආපසු දෙන පොරොන්දුව පිට එය ලබා ගත්තත් දැන් එම පොරොන්දුව ඉෂ්ට කරන්නටත් බැරි තත්ත්වයකුයි, උදා වී තිබෙන්නේ. ඒ නිසා මා මේ ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අසනවා. පාඨශාලා ගොඩනැගිලි තැනීම සඳහා අප සල්ලි දෙනවාද? සල්ලි නැත්නම් ඒ බව කියන්න. එතකොට ඒ කියමන භාර ගන්නට පුළුවනි. හැබැයි, වේදිකාවේදී නම් පහර ගසනවා.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாச்சார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

වේදිකාවේදී අපට ගැසුවොත් අපත් ගහනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

තමුන්නාන්සේලාට නම් වේදිකාව විතරක් නොවෙයි, ගුවන් විදුලියත් තිබෙනවා. අපට ගුවන් විදුලියක් නැහැ. තමුන්නාන්සේලා අපට ගුවන් විදුලියෙනුත් පහර ගසනවා. කෙසේ වෙතත් අප මහජනයා වෙනුවෙන් වේදිකාවලදී කථා කරනවා. මා කරුණාවෙන් මේ අවස්ථාවේදී ඉල්ලන්නේ මේකයි: මහජනයා අමාරුවේ දමන්නේත් නැතිව, ශිෂ්‍යයන් අමාරුවේ දමන්නේත් නැතිව පාඨශාලා ගොඩනැගිලි සඳහා සල්ලි නැත්නම් නැතැයි කියන්න. සල්ලි දෙන්නට බලාපොරොත්තු වෙනවා නම් මේ මේ තරම් ප්‍රමාණයක් ඒ ඒ කොට්ඨාශ සඳහා දෙනවා යයි කල් වේලා ඇතිව කිව්වොත් හොඳයි. මේ අලුත් වර්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොඩනැගිලි සඳහා මුදල් ලැබෙනවාද? නැද්ද? කරුණාකර ස්ථිර පිළිතුරක් දෙන්න.

අ. භා. 4.33

**ආර්. ජේ. ජී. ද මැල් මයා.**
*(திரு. ஆர். ஜே. ஜீ. மெல்)*
(Mr. R. J. G. de Mel)

ගරු කථානායකතුමනි, තේ පර්යේෂණාගාරයේ දැන් ඇති වී තිබෙන ප්‍රශ්නය ගැන ගරු ආහාර ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු කරවීම පිණිස වචන ස්වල්පයක් කථා කිරීම මගේ අදහසයි. තේ පර්යේෂණයෙන් තොරව තේ වගාව දියුණු කරන්නට බැරි බව තමුන්නාන්සේ දන්නවා. තේ වගාව නැතිව අපේ මුදල් තත්ත්වය ආරක්ෂා කර ගන්නට බැහැ. තේ පර්යේෂණාගාරයේ අවුරුදු පහළොවක පමණ දීර්ඝ කාලයක් තිස්සේ සේවය කළ, රජයේ මුදල්වලින් පිටරට විශ්ව විද්‍යාලවලට ගොස් පී. එච්. ඩී. උපාධි ලබා ගත්, ඒ වාගේම තේ සම්බන්ධයෙන් විශේෂ දැනුමක් ඇති විශේෂඥයන් තුන් දෙනකු පසුගිය මාස කීපය ඇතුළතදී සේවයෙන් ඉල්ලා අස් වී සිටින බව තමුන්නාන්සේ දන්නවා ඇති.

මේ රටේ තේ පර්යේෂණයට විශාල සේවයක් කළ පහත රට තේ වලට රසය නැත්නම් fප්ලේවර් එක දෙන්නට පර්යේෂණ කටයුතු ආරම්භ කළ, ඒ වාගේම ක්ෂණික තේ —instant tea—උණු වතුරෙන් පමණක් නොව ඇල් වතුරෙන්ද පිළියෙල කරන්නට කටයුතු කළ ජීව රසායන අංශයේ —Bio-Chemistry—ප්‍රධානයා හැටියට කටයුතු කළ ආචාර්ය වික්‍රමසිංහ මහතා ඊයේ පෙරේදා සේවයෙන් ඉල්ලා අස් වී ගොස් සිටිනවා. ඊළඟට කාර්මික අංශයේ —Technology—ආචාර්ය සිවප්‍රකාශපිල්ලේ මහතා ඉල්ලා අස්වුණා. ඒ වාගේම මීට මාස කීපයකට පෙර කීට විද්‍යා අංශයේ —Entomology—ප්‍රධානයා වූ ආචාර්ය ප්‍රනාන්දු මහතා ඉල්ලා අස් වුණා.

මේ පුද්ගලයන්ගේ බෙලි කැපීම් ගැන මා කථා කරන්නට කැමති නැහැ. මාද රජයේ සේවකයකු හැටියට සිටි හෙයින් රජයේ ආයතනවල පුද්ගලයන්ගේ බෙලි කැපීම් තිබෙන බව මා දන්නවා. පෞද්ගලික අර්බුද තිබෙනවා. ඒවා ගැන [illegible] ගෙන කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ ඉල්ලා අස්වීම් ගැන සොයා බලන ලෙසයි. මෙවැනි රත්රන් මොල—brain-drain—මේ රටෙන් පිට වුණොත් නැත්නම් වෙනත් අංශවලට ගියොත් අපේ රටේ තේ පර්යේෂණ කටයුතුවලට විශාල හානියක් වන බව තමුන්නාන්සේ පිළිගන්නවාද? බොහෝ රත්රන් මොල වැඩි පඩි බලාපොරොත්තුවෙන් රටින් පිට වී වෙනත් රටවලට යන බව මා පිළිගන්නවා. එංගලන්තයෙන් අමෙරිකාවට යනවා; අමෙරිකාවෙන් කැනඩාවට යනවා; කැනඩාවෙන් දකුණු අප්‍රිකාවට යනවා. ඒ යන්නේ වැඩි පඩි ලබා ගැනීමේ බලාපොරොත්තුව ඇතිවයි. එහෙත් මේ තේ පර්යේෂණාගාරයෙන් අපේ රත්රන් මොල පිට වී යන්නේ, "බ්‍රේන් ඩ්‍රේන්" එකක් ඇති වී තිබෙන්නේ, යම් යම් කළකිරීම් නිසා බවයි මගේ අදහස. ඒ ගැන සොයා බලන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තේ පර්යේෂණාගාරය තුළ programme of research හෙවත් නියම පර්යේෂණ සැලැස්මක් නැහැ. එක් එක් අංශවල ප්‍රධානීන් එක් එක් පිළිවෙළට වැඩ කර ගෙන යනවා. එක් එක් අංශවල ප්‍රධානීන්ට නියම විධියේ පර්යේෂණ සැලැස්මක් අධ්‍යක්ෂවරුන් විසින් බාර දී නැහැ. මෙවැනි ආයතනයක පාලක මණ්ඩලයටත් ඒ වාගේම එක් එක් අංශවල ප්‍රධානීන්ටත් නියම විධියේ පර්යේෂණ සැලැස්මවල් තිබිය යුතුයි. එම නිසා මේ ගැනත් ගරු ඇමතිතුමා පරීක්ෂා කර බලා නියම පර්යේෂණ සැලැස්මක් අනුව එහි වැඩ කටයුතු කිරීමට සලස්වනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

තේ බද්දෙන් හෙවත් "ටී සෙස්" එකෙන් විශාල මුදලක් තේ පර්යේෂණාගාරයට යන බව අප දන්නවා. එහෙත් දැන්, පර්යේෂණ කටයුතු සඳහා මුදල් නැතැයි කියනවා. තිබුණු මුදල් සියල්ලම වාගේ ගොඩනැගිලි සඳහාත් "එස්ටැබ්ලිෂ්මන්ට් චාජස්" හෙවත් පාලන කටයුතු සඳහාත් පිටරට ගමන් සඳහාත් වියදම් කර තිබෙනවා. පර්යේෂණ කටයුතුවලට දැන් මුදල් නැතිලු. පර්යේෂණාගාරයක ඒ සඳහා මුදල් නැතැයි කීම මහා විහිළුවක්. එයින් පෙනෙනනේ එහි අධ්‍යක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජේ. ජී. ද මැල් මයා.]
මණ්ඩලය හරියාකාර වැඩ කර නැති බවයි. ගරු අගමැතිතුමා කෘෂිකර්ම ඇමති වශයෙන් සියටිදී එතුමාගේ සහකාර ලේකම්වරයකු වශයෙන් මාත් මේ අංශයේ වැඩ කළා. තේ පර්යේෂණාගාර ආඥා පනත යටතේ මෙහි වැඩ කටයුතු ගැන වැඩිපුර ඇඟිලි ගසන්නට ඇමතිතුමාට ඉඩක් නැහැ. එහෙම නම් තේ පර්යේෂණාගාර ආඥාපනත සංශෝධනය කරන්න. තේ පර්යේෂණාගාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය දැන් කටයුතු කරන්නේ සම්පූර්ණයෙන්ම ඒජන්සි සමාගම්වලට යට වෙලායි. ඒජන්සි සමාගම්වල උපදෙස් අනුවයි ඔවුන් කටයුතු කරන්නේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉතා හොඳ, වැදගත් මහත්වරුන් සිටිනවා. මගේ ඥාතීනුත් මිත්‍රයිනුත් සිටිනවා. එහෙත් මා පෞද්ගලිකව කථා කරන්නේ නැහැ. බොහෝ අධ්‍යක්ෂ මහත්වරුන් සුද්දකු දුටු විට බයේ දුවනවා. සුද්දන් දකින විට මේ කළු මහත්වරුන් බයේ වෙව්ලනවා. ඔවුන්ට පිට කොන්ද නෑ. එම නිසා, හොඳ ඥානවන්ත, පිට කොන්ද ඇති, තේ පර්යේෂණ කටයුතු පිළිබඳ මනා පළපුරුදුකම් ඇති, ඒජන්සි සමාගම්වලට යට නොවන අධ්‍යක්ෂ මණ්ඩලයක් ඇති කරන ලෙසත්, අවශ්‍ය නම් ඒ සඳහා තේ පර්යේෂණාගාර ආඥාපනත සංශෝධනය කරන ලෙසත් ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ආදරයෙන් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 4.38

**වෛද්‍යාචාර්ය එස්. ඒ වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

සවදේශ කටයුතු බාර ගරු ඇමතිතුමා මෙහි නැති නිසා, එතුමාට ඉදිරිපත් කරන්නට මා අදහස් කරගෙන සිටින ප්‍රශ්නය මතු කරන්නේ නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා සිටින නිසා, මීට පෙරත් එතුමාට මතක් කළ ප්‍රශ්නයක් දැන් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මගේ ආසනයේ මලිදුව මහා විද්‍යාලයට ඉඩමක් නැතිකම නිසා, එහි ගොඩනැඟිලි සඳහා ගිය අවුරුද්දේ වෙන් කරන ලද රුපියල් 25,000 මුදල පාවිච්චි කරන්නට බැරි වුණු බව ගරු ඇමතිතුමා දන්නවා. පසුගිය ආණ්ඩුවෙන් අක්කර 7ක ඉඩමක් ලැබුණු නමුත් එය උස් බිමක් නිසාත් එහි ගොඩනැඟිලි සෑදීමට විශාල මුදලක් වියදම් වන නිසාත් ගරු ඇමතිතුමා ඊට විරුද්ධ වුණා. එහෙත් පළාතේ ජනතාව ශ්‍රමදානයෙන් එම ඉඩමෙහි ගෙපළ ඇද පාරත් කැපුවා. ආණ්ඩුවෙන් ඒ සඳහා කිසිම වියදමක් දරන්නට සිදු වුණේ නැහැ. එහෙත් ඒ ඉඩම පාවිච්චි කිරීමට අකැමැති බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා. ළමයින් 1,000 ක් පමණ සිටින මේ මහා විද්‍යාලය සඳහා අක්කර භාගයක ඉඩම් ප්‍රමාණයක් දෙපොළක තිබෙනවා. එය ප්‍රමාණවත් නොවන බව මා අමුතුවෙන් කියන්නට වුවමනා නැහැ. මේ මහා විද්‍යාලයේ තිබෙන්නේ මේ විධියේ කණගාටුදායක තත්ත්වයක්. පසු ගිය අවුරුද්දේ වෙන් කළ රුපියල් 25,000 තවමත් පාවිච්චි කරන්නට බැරි වී තිබෙනවා. ගංවතුර ගලන මට්ටමට උඩින් ඇති, පසුගිය ආණ්ඩුවෙන් ලබා ගත් ඉඩම සුදුසු නැතැයි ඇමතිතුමා කල්පනා කරනවා නම් ඒ ගැන බල කරන්නට ක්‍රමයක් නැහැ. එහෙත් ඇමතිතුමා ඒ විධියට තීරණය කරනවා නම් එය අසාධාරණයි, අයුක්ති සහගතයි. ඒ කෙසේ වෙතත් අක්කර 1/2 ක ඉඩමක් ළමයින් 1,000 කට ප්‍රමාණවත් නොවන බව අවබෝධ කරගෙන, ගංවතුර නොගලන රජයේ වෙනත් සුදුසු ඉඩම් නැති නිසා එවැනි ඉඩමක් මුදලට වත් ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් තවත් කල් නොයවා වහාම ගෙන හෝ ඒ ප්‍රශ්නය විසඳන හැටියට ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින අතර, මේ පිළිබඳව ඇමතිතුමාගේ අදහස් ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනවා.

අ. භා. 4.41

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

පාඨශාලා ගොඩනැඟිලි සම්බන්ධයෙන් මේ අවුරුද්දේ මුදල් වෙන් කළේ නැහැ කියන කථාව සත්‍යයක් නොවෙයි. ඇත්ත තත්ත්වය මෙයයි: අප බලයට ආ අවුරුද්දේ වියදම් කළ යුතුව තිබූ මුදල් කලින් වුණු ණය ගෙවන්නටවත් මදි තරමයි. එතකොට ඒ අවුරුද්දට මුදල් නැහැ. ඒ තතත්වය යටතේ පසුගිය ආණ්ඩුව තිබුණු කාලයේම භාණ්ඩාගාරයෙන් අවසරය ලැබී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණා, ලබන අවුරුද්දට වියදම් වේ යැයි වැටහෙන ප්‍රමාණයක වැඩ මේ අවුරුද්දේම පටන් ගැනීමට. ඒ විධියට කරගෙන ආවා. ඊට හේතුව, ඒ අවුරුද්දෙ වැඩ පටන් ගත්තාට කොන්ත්‍රාත්කාරයන් වැඩ පහු කිරීම නිසා මුදල් ගෙවන විට අවුරුද්දක් විතර ගත වීමයි. ඒ තත්ත්වය මා නොදන, කොන්ත්‍රාත්කාරයන් කැඳවා කථා කර කොහොම හරි මේ අවුරුද්දේම වැඩ ඉවර කරන්න කීවා.

ඇත්ත වශයෙන්ම ගොඩනැගිලි වුවමනා වී ඇති, ගොඩනැගිලි තුන හතරක්වත් නොහැදූ එක ඡන්දදායක කොට්ඨාශයක්වත් නැති තරමයි. ගොඩනැගිලි 3,000 ක් වුවමනා කරනවා. "යෝජිත පාඨශාලා" යැයි බොරු පාඨශාලා වගයක් අරගෙන—ඒවා හැම එකක්ම කඩා වැටෙන්නට එන ඒවා—ඒවා පුළුවන් තරම් හැදුවා. මා හිතනවා, කවරදාවත් නොහැදූ තරම් ගුරු නිවාස හැදුවා. ඒ සේරම බලද්දී ගොඩනැගිලි සඳහා රුපියල් 70 ලක්ෂයක් පමණ වියදම් කර තිබෙනවා. පසුගිය අවුරුද්දෙන් ඉතිරි 30 ලක්ෂයයි; මේ අවුරුද්දේ මුදලින් 40 ලක්ෂයක් දැම්මා. ඊළඟ අවුරුද්දේ මුදල් තමයි, මීළඟට වියදම් කරන්නට සිදු වන්නේ. ඒවා පටන් ගන්නට මාස කීපයක් යනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
මේ අවුරුද්දට මුදල් ලැබෙනවාද, නැද්ද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ලැබෙනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
කවදාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ජූලියේදී ලැබෙනවා.

අනෙක—දෙවරු පාසල්—මෙයට අදාළ ප්‍රශ්නයක් නොවුණත් ඒ ගැනත් කියන්නට කැමැතියි. යුද්ධවලට දවසකට කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරන, අපට වඩා බොහොම ධනවත් රටවල පවා දෙවරු පාසල් හුඟක් තිබෙනවා. සේරම නොමිළයේ දෙන, ලෝකයෙන්ම පෝසත් රට තමා ලංකාව! එම නිසා, දෙවරු පාසල් ක්‍රමය ඇති අනාකලොත්, බාගවෙලාවට රජයේ මුළු ආදායමම ගොඩනැගිලි සඳහා යොදවන්නට වේවි. ඒ නිසා, පුළුවන් හැම තැනකම දෙවරු පාසල් ඇති කිරීම මගේ බලාපොරොත්තුවයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුනුත් එය අනුමත කරාවි යයැයි මා හිතනවා.

මලිඳුව පාසල ගැන මීට කලින් අසා තිබුණේ නැහැ. කෙසේ වෙතත්, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කියන කථාවේ හුඟක් ඇත්ත තිබෙනවා. දනට තිබෙන පාසල වෙනුවට අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා කියන පාසල හදන්නට ගියොත් මා හිතනවා, මුළු දකුණු පළාත සඳහා වෙන් කොට ඇති මුදලත් ඊට මදි වේවි. කන්ද පහත් කරන්නට වෙනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டாக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
පහත් කර තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒ, එක තැනයි. තව තැන් තිබෙනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டாக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
ඒවාත් පහත් කර දෙන්නම්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මා දකුණු පළාතට ආ විටෙකදී ඔය පාසල බලන්නට එනවා. ප්‍රධාන කාර්යාලයෙන් යැවූ නිලධාරීන්ගේ වාර්තාවල හැටියට—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

නිලධාරීන් එවා තිබෙන්නේ බොරු වාර්තා බව ඇමතිතුමා පැමිණ බැලුවොත් පෙනේවි. ඇමතිතුමා එනවා නම් ඒ ඇති.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හොඳයි, මම එන්නම්.

අ. භා. 4.45

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගරු කථානායකතුමනි, දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා (ද මැල් මයා.) තේ පර්යේෂණාගාරය සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. එතුමා ප්‍රශ්න කළේ තේ පර්යේෂණාගාරය සම්බන්ධව උද්ගත වී තිබෙන යම් යම් ආරංචි සම්බන්ධවයි. තේ පර්යේෂණාගාරය මගින් අවුරුදු ගණනාවක් තිස්සේ බොහොම වටිනා පර්යේෂණ රාශියක් කර තේ වගාවට විශාල වශයෙන් ප්‍රයෝජනයක් කර තිබෙනවාය, ඒ මගින් රටට විශාල සේවයක් සිදු වී තිබෙනවාය, කියා එතුමාත් අපිත් හැම දෙනාමත් පිළිගන්නවා. මේ තේ පර්යේෂණායතනය නිශ්චලව ඉතාමත්ම ප්‍රයෝජනවත් පර්යේෂණ රාශියක් කර රටට විශාල සේවයක් කළ ආයතනයක්. එහෙත් මෑත කාලයේ සිට—අවුරුදු තුන හතරක සිට—අර නිශ්චලත්වය ටිකක් අඩු වී තිබෙනවා. එහෙත් රටට ප්‍රයෝජනවත් වන අන්දමින් කර ගෙන ගිය පර්යේෂණ තවමත් ඒ අන්දමින්ම කරගෙන යනවාය කියා මා විශ්වාස කරනවා. ඒ ගැන අඩමානයක් ඇති කර ගන්නට හේතුවක් නැහැ. එහෙත් පර්යේෂණවල යෙදී සිටින උසස් විද්‍යාඥයින් හා මණ්ඩලය අතර තරමක පැටලිල්ලක් තිබෙනවා වගේ පෙනෙන්නට තිබෙනවා. ළඟකදී සිට ප්‍රවෘත්ති පත්‍ර මගින් නොයෙක් අන්දමේ ආරංචි දෙන්නට පටන් ගත්තා. එවැනි ආයතනයක ඒ විධියේ තත්ත්වයක් ඇති වීම සුදුසු නැහැ.

තේ පර්යේෂණ ආඥා පනත යටතේ මණ්ඩලයක් පත් කර තිබෙනවා. ඒ මණ්ඩලයට නොයෙකුත් ආයතනවලින් නියෝජිතයින් පත් වී සිටිනවා. වැවිලිකරු සංගම්වලින් පත් කර සිටිනවා; ඇමතිවරයා විසිනුත් දෙතුන් දෙනකු පත් කර සිටිනවා. රජයේ නිලධාරීනුත් දෙතුන් දෙනෙක් සිටිනවා. පසුගිය කාලයේ ප්‍රවෘත්ති පත්‍රවල පළ වූ ආරංචිවල සත්‍යයක් නැත කියා ඒ මණ්ඩලයේ සභාපතිතුමා ප්‍රකාශ කළ නිසා ඒවායේ සත්‍යයක් හෝ යම්කිසි පදනමක් නොමැති නම් සත්‍ය කරුනු වටහා දී නිවේදනයක් නිකුත් කිරීම මණ්ඩලයේ සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂකවරයාගේ යුතුකම බව නැත්නම් වගකීමක් බව ඔහුට පෙන්වා දෙන්නට සිදු වුණා. ඒ අනුව ඒ විධියේ නිවේදනයක් තේ පර්යේෂණාගාරයේ අධ්‍යක්ෂතුමා විසින් නිකුත් කළා. ඒ නිවේදනයට පිළිතුරක් වශයෙන් තවත් ප්‍රවෘත්තියක් ඊට පසුව පත්තරවල පළ වුණා. ඒ එක ප්‍රශ්නයක්.

ඊළඟට ගරු මන්ත්‍රීතුමා නම් කළ විශේෂඥයා—වික්‍රමසිංහ මහතා—බොහෝ කාලයක් මේ පර්යේෂණාගාරයේ ඉතාමත්ම ප්‍රයෝජනවත් පර්යේෂණයන් කරමින් සිට එයින් ඉල්ලා අස් වුණාය කියා තවත් ආරංචියක් ලැබුණා. හොඳ විද්‍යාත්මක පුහුණුවක් හා පළපුරුද්දක් ඇති සමහර විශේෂඥයින්—ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළාක් මෙන්ම—වෙන වෙන රටවල නැත්නම් වෙන වෙන ආයතනවල උසස් පඩිනඩි හා සේවා තත්ත්වයන් අපේක්ෂා කරමින් ඒවා ලබා ගැනීම සඳහා සමහරවිට අස් වී යනවා. අද තිබෙන තත්ත්වය ඒකයි. ඒ පිළිබඳව විග්‍රහ කරන්නට වුවමනා වන්නේ නැහැ. මේ විශෙෂඥ වික්‍රමසිංහ මහත්මයාගේ අස්වීම පිළිබඳව දැනගන්නට ලැබී තිබෙන කරුණුවල හැටියට අපට දෙයාකාරයකින් හිතන්නට පුළුවනි. මීට වඩා සැලකිය යුතු ස්ථානයක් ලබා ගැනීම පිණිස තමන්ගේම වුවමනාව පිට අස් වුණාය කියා ආරංචියකුත් තියෙනවා. තමන්ගේ ඕනෑකම පිට අස් වී තිබෙනවා නම් මණ්ඩලයට හෝ වෙන කාටවත් හෝ යමක් කරන්නට බැහැ. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පර්යේෂණාගාරයේ තිබෙන වාතාවරණ යට ඔහුගේ වැඩි ප්‍රියයක් නොමැති වීම මීට හේතුවකැයි තවත් රාවයක් පවතිනවා. තේ පර්යේෂණ මණ්ඩලයට මේ බව සැල කර ඒ මණ්ඩලයෙන්ම අනු කාරක සභාවක් පත් කර එම අනු කාරක සභාව මගින් මෙම ප්‍රශ්නයත් මීට අදාළ අනිකුත් ප්‍රශ්නත් පිළිබඳව පරීක්ෂණයක් කොට මට දන්වන්නටය කියා ස්ථිර ලේකම්තුමාට නියම කළා. ඒ කට යුත්ත එම උදවිය අතින් ඉටු වේවිය කියා මා විශ්වාස කරනවා. එම නියෝගය දැන් මණ්ඩලයට යවා තිබෙනවා.

තේ පර්යෙෂණාගාරයේ වැඩ සෑම එකක්ම පිළියෙල වී තිබෙන්නේ තේ පර්යෙෂණ පනත උඩයි. බලතල, වගකීම්, යනාදීකොට ඇති සියලු කරුණු පදනම් වී තිබෙන්නේ එම ආඥ පනත උඩයි. එම ආඥ පනත අනුව ඇමතිවරයාට එහි පාලනය සම්බන්ධ නොයෙකුත් කටයුතු පිළිබඳව සෙවීමෙන් බැලීමෙන් පරීක්ෂා කරන්නට පුළුවන් විධියට බලතල සකස් වී නැහැ. බොහෝ දුරට ස්වාධීනත්වයක් උඩයි, එහි වැඩ කටයුතු ගොඩනංවා තිබෙන්නේ. එසේ හෙයින් ඇමතිවරයාට ඒ සම්බන්ධයෙන් පැවරී තිබෙන සාමාන්‍ය බලතල අනුව තමයි, කටයුතු කරගෙන යන්නට මට පුළුවන්කම තියෙන්නේ. ඒ කටයුත්ත මා කරගෙන යනවා. දැනට එම පර්යෙෂණාගාරය සහ එහි පාලනය සම්බන්ධයෙන් ඔය අන්ද මටයි කරුණු ඉදිරිපත් කරන්නට තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමාගේ අදහස මාත් පිළිගන්නවා. පර්යේෂණ කරගෙන යාමේ අංශවලින් යම් යම් ප්‍රතිපත්ති උඩ එම අංශ එකට අල්ලාගෙන යා යුතු බවයි කිව්වේ. ඒ පිළිබඳ බලතල තියෙන්නේ අධ්‍යක්ෂවරයාටයි. ඒ කටයුතු ගැන සොයා බැලිය යුතුය යන්න මාත් පිළිගන්නවා.

තේ කර්මාන්තය, තේ වෙළඳාම යනාදිය පිළිබඳව යෙදී තිබෙන ප්‍රශ්න ගැන සහ තේ පර්යෙෂණාගාරයේ වැඩ සහ පාලනය පිළිබඳව යෙදී තිබෙන ප්‍රශ්න ගැන සොයා බලන්නට කොමිසමක් පත් කර තිබෙනවා. ඒ කොමිසමේ එක් කොන්දේසියක් තමයි, ඒවා ගැන පරීක්ෂා කිරීම. මේ පිළිබඳ පාලනය තව දුරටත් ලිහිල් කළ යුතුද, මීට වඩා පරීක්ෂාකාරීව කටයුතු කළ යුතුද යන්න එහි නිර්දේශ අනුව නිරාකරණය වෙනවා ඇති. වික්‍රමසිංහ මහත්මයාගේ අස්වීම සම්බන්ධ නියම තත්ත්වය සොයා බලා ඒ මණ්ඩලය මගින් අපට දන්වාවිය කියා මා විශ්වාස කරනවා. ඒ පිළිබඳ නියෝගයක් දැන් මණ්ඩලයට ලැබී තිබෙන හෙයින් එය එසේ වේයයි මා සිතනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 4.55ට 1968 පෙබරවාරි 8 වන බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් ගියේය.**

*அதன்படி சபை பி.ப. 4.55 மணிக்கு 1968 பெப்பிரவரி 8, வியாழக்கிழமை பி. ப. 2 மணி வரை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly at 4.55 P.M. until 2 P.M. on Thursday, 8th February 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

# WRITTEN ANSWERS TO QUESTIONS

## කොළඹ පාඨශාලා අංශයට යවන ගුරු සහතික පත්‍ර

## கொழும்பு பாடசாலைக் கிளைக்கு அனுப்பப்பட்ட ஆசிரியர் தராதரப் பத்திரம்

## TEACHERS' CERTIFICATES SENT TO SCHOOLS BRANCH, COLOMBO

535/67

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.** (මුතූර් පළමුවන මන්ත්‍රී)

*(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) උසස් කිරීම සඳහා කොළඹ පාඨශාලා අංශයට යවන ගුරු සහතික පත්‍ර ගැන ක්‍රියාකිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් ඇති වන වගත්, (ii) ඇතැම් ගුරු සහතික පත්‍ර නැතිවී ඇති බවත්, සමහරක් සොයා ගත නොහැකි බවත්, තවත් සමහරක් ගැන ක්‍රියා නොකර කාර්යාලයේ ඇති වගත් එතුමා දන්නවාද? (ආ) උසස් කිරීම සඳහා මෙම අංශයට යවන ගුරු සහතික පත්‍ර ගැන අප්‍රමාදව කටයුතු කිරීමට සහ සහතික පත්‍රවල ආරක්ෂාව සැලසීමට එතුමා පියවර ගන්නේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) கொழும்பிலுள்ள பாடசாலைக் கிளைக்குத் தரம் உயர்த்துவதற்காக அனுப்பப்பட்ட ஆசிரியர் தராதரப் பத்திரங்களின் மீது நடவடிக்கையெடுப்பதில் தேவையற்ற காலதாமதம் ஏற்படுகின்றதென்பதையும், (ii) இந்த அலுவலகத்தில் சில ஆசிரியர்களின் தராதரப்பத்திரங்கள் காணமற் போயிருப்பதையும், சில கைதவறுதலாக வைக்கப்பட்டிருப்பதையும், சில இன்னும் நடவடிக்கை எடுக்கப்படாமலிருக்கின்றனவென்பதையும் அவர் அறிவாரா? (ஆ) இக்கிளைக்குத் தரம் உயர்த்தப்படுவதற்காக அனுப்பப்படும் ஆசிரியர் தராதரப்பத்திரங்கள்மீது காலதாமதமேற்படாது செயலாற்றவும் இத்தராதரப்பத்திரங்களின் பாதுகாப்புக்கு உத்தரவாதம் அளிக்கவும் அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that (i) there is an undue delay in attending to the upgrading of teachers' certificates sent to Schools Branch, Colombo; (ii) some teachers' certificates have been lost, others are misplaced, and still others are lying unattended in the office? (*b*) Will he take steps to see that teachers' certificates sent to this branch for up grading are attended to without delay and steps taken to ensure the safety of the certificates?

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

(අ) (i) නැත. (ii) ගුරු සහතික පත්‍ර නැතිවී නැත. අස්ථාන ගතවී නැත. එවා ඇති සහතික පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යනු ලැබේ. (ඉ) පැන නොනගී.

*(அ) (i) இல்லை. (ii) ஆசிரியர் தராதரப்பத்திரங்கள் எப்பொழுதேனும் காணமற்போக வேணும் தவறுதலாக வைக்கப்படவேணும் இல்லை. (இ) இவ்வினா எழவில்லை.*

(*a*) (i) No. (ii) Teachers' certificates have never been lost or misplaced. All certificates are being attended to. (*b*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org